**E-Repository of Humanities and Social Sciences**
Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

# Author Consent Form

Please provide the following information of your book/publication (please note that one consent form needs to be filled for each publication if you have more than one).

1. Title of the publication : 'ලෝබන සර්පිය'
2. Author/ Authors : Prof. K. Lankamulla
3. Publisher : Viduday Publication
4. Year of Publication : 2013
5. ISBN (if applicable) : 978-955-4530-14-0
6. Access option : Open Access

**Author/copyright owner consent:**

I/we Prof. K. Lankamulla (your name/~~names~~), as the author/s or copyright owner/s, would like to provide my/our consent for making available the above publication on the E-Repository of Humanities and Social Sciences of the University of Sri Jayewardenepura. I also would like to provide my consent to allow the E-Repository Management Committee to make the publication accessible to the students of University of Sri Jayewardenepura and public.

Signature of the Author/s or Copyright owner/s: [signature]

Date: 19|09|2023

ඇමුණුම්
(F) 06

# ලේඛන සරණිය



සංස්කරණය
**කුසුමලතා ලංකාමුල්ල**

# ලේඛන සරණිය

UNIVERSITY OF SRI JAYEWARDENEPURA
15 DEC 2019
VICE - CHANCELLOR'S OFFICE
NUGEGODA.

# ලේඛන සරණිය

සංස්කරණය

## කුසුමලතා ලංකාමුල්ල

ප්‍රකාශනය
කළමනාකරණ සහ විද්‍යා ප්‍රකාශන මධ්‍යස්ථානය
31/24 ඒ, දෙවන පටුමග, රබර්වත්ත පාර,
ගංගොඩවිල, නුගේගොඩ.
ටෙලි : 0112802545/0113188543

2013

කළමනාකරණ හා විද්‍යුදය ප්‍රකාශන
ප්‍රථම මුද්‍රණය - 2013 ඔක්තෝබර්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ලංකාමුල්ල, කුසුමලතා
ලේඛන සරණිය / කුසුමලතා ලංකාමුල්ල - නුගේගොඩ :
කළමනාකරණ සහ විද්‍යුදය ප්‍රකාශන මධ්‍යස්ථානය, 2013
පි : 132 ; සෙ.මී. 21

ISBN 978-955-4530-14-0
i. 089.9148 ඩිවි 23 ii. ග්‍රන්ථනාමය

1. එකතු, සිංහල

ISBN 978-955-4530-14-0

පිටකවර නිර්මාණය
බුද්ධිප රත්නායක

පිටු සැලසුම්කරණය
කේ.ඒ.ඒ. සඳමාලි
එච්.ඒ.පී. නදීශා

මුද්‍රණය
සත්සර ප්‍රින්ටින් සර්විසස්
2/9, වනාත පාර, ගංගොඩවිල,
නුගේගොඩ

ප්‍රකාශනය
කළමනාකරණ සහ විද්‍යුදය ප්‍රකාශන මධ්‍යස්ථානය
31/24 ඒ, දෙවන පටුමග, රබර්වත්ත පාර,
ගංගොඩවිල, නුගේගොඩ.
ටෙලි : 0112802545/0113188543

# A Collection of Articles
(Lēkhana Saraniya)

Edited By
Kusumalatha Lankamulla

Published by Vidudeya Publications
**2013**

**සංස්කාරකගේ වෙනත් කෘති**

- අද මගේ දවසයි (ළමා කතා), පන්නිපිටිය 2001.
- නූතන සිංහල සාහිත්‍යයේ පුරෝගාමියා ජේම්ස් ද අල්විස් (ශාස්ත්‍රීය), පන්නිපිටිය, 2002.
- කතා කරන අශ්වයා (ළමා කතා), පන්නිපිටිය, 2004.
- ද්විභාෂක උගතුන් සහ සිංහල සාහිත්‍යය, පන්නිපිටිය, 2006.
- විදුදය, සමසංස්කරණ, 2011.

# තුති පුද

මෙම 'ලේඛන සරණිය' මුද්‍රණද්වාරයෙන් එළිදකින මොහොතේ ස්තුති කළ යුතු බොහෝ දෙනෙක් වෙති.

ප්‍රථමයෙන් ලේඛන කටයුතුවලට පමණක් නොව ජීවිත කටයුතුවලටත් එක සේ අපට ආශිර්වාද කරන සියලු ම සහෘදය ස්වාමීන් වහන්සේලාට

පාසලේදීත් විශ්වවිද්‍යාලයේදීත් ජීවිතයට ආලෝකය ලබා දුන් සියලු ගුරුතාරකාවනට

මෙම 'ලේඛන සරණියට' ලිපි සපයා දුන් සියලු විද්‍යාර්ථීනට සහ ලිපි සංස්කරණය කර ගැනීමේ දී උපකාර කළ සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ පවිත්‍රා මුතුමාලි නාරායන සහ රජිත මධුශංකට

ලේඛන කටයුතුවලටත් සියලු යහපත් කටයුතුවලටත් නිරන්තරයෙන් අප යොමු කරවන සියලු සජ්ජන හිතවතුනට

අප නිවහන නිරන්තර ආදරණීය සෝෂාවෙන් පුරවන, දුකේදීත් සැපේදීත් අප හා එක්වන සමන් අය්යාගේත් මගේත් සිසුන් වන, නොවන නම් වශයෙන් සඳහන් කිරීමට නොහැකි තරම් පීය හේදකින් තොර දයාබර විදුදය සහපිරිවරට

මෙම 'ලේඛන සරණිය' මුද්‍රණද්වාරයෙන් එළිදක්වන්නට අපට වඩා උනන්දුවෙන් කටයුතු කළ 'විදුදැය' කළමනාකරණ ආයතනාධිපති ප්‍රසන්න වැදණ්ඩ සහෘදයාට මෙන් ම ඔහුගේ දිවි ගමනේ දයාබර සහකාරිය කුමාරි, දයාලු දියණී විදුදි ඇතුළු 'විදුදැය කණ්ඩායම'ට අපගේ හෘදයංගම ප්‍රණාමය හිමිවෙයි.

අපගේ ලේඛන කටයුතුවලට නිරන්තරයෙන් ඉඩ ප්‍රස්තා සලසා දෙමින් 'ඔය ළමයාගේ වැඩක් කරගන්නැයි' කියමින් ගෙදරදොරේ වැඩවලින් මා නිදහස් කරන සමන් අය්යාගේ දයාබර අම්මාටත්, පොතේ වැඩ තාම ඉවර නැද්දැයි අසමින් අකලට අහිමි වූ පිය සෙනෙහස දැනෙන්ට නොදී තවමත් අප ජීවිතයට දිරිය දෙවන ආදරණීය අම්මාටත් නිදුක් නිරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කරමි.

පෙර මෙන් ම තවමත් අප ඉගෙනීමට බැඳ තැබීමට වෙර දරන පුංචි නැන්දා, මාමා ඇතුළු පවුලේ සැම, දුර බැහැර සිටිය ද හිතින් ළඟ සිටින ආදරණීය මල්ලී ඇතුළු පවුලේ සැම, ලොකු අක්කා, කලුඅය්යා සහ පුතුන් තිදෙනා, නෝනා නංගී, ඉන්දික මල්ලී ඇතුළු පවුලේ සැම දයාවෙන් මතක් කරමි.

අප සැමගේ ජීවිත සැහැල්ලුවෙන් තැබීමට අවශ්‍ය ම මොහොතේ සිය ජීවිතයට සියලු බර පවරාගන්නා පුදු නංගීත් මගේ ජීවිත බඳුන ආදරයෙන් ද ඵලවත්භාවයෙන් ද පුරවන දයාබර සමන් අය්යාත් දියණිය සඳර්ශී කුසුම්වර්ෂාත් සිහි කර ගනිමි.

අපගේ මේ ලේඛන සියල්ල එළිදැක්වීමට නිමිත්ත වන්නේ අප ජීවිතවලත් ලෝකයේත් යහපත එක සේ ප්‍රාර්ථනා කළ සැබෑ මිනිසුන් දෙදෙනකු ස්මරණය කිරීම ය. ඒ සෙනෙහැති පියා කවීන්ද්‍ර චන්ද්‍රසේන රණසිංහ යි. ඒ සෙනෙහැති සහෝදරයා සමන් රණසිංහ සිත්තර ගුරුතුමා යි. ඒ වනස්පතීන් වෙතින් ලද සිසිලස, සෙවණ   යට අප තවමත් සුරක්ෂිත බව සටහන් කොට තබනු කැමැත්තෙමි.

කුසුමලතා ලංකාමුල්ල

2013.10.08 දින
නුගේගොඩ, ගංගොඩවිල,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ,
සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ දී ය.

# පටුන


පිටු අංක

♦ ලේඛන සරණියට පූර්විකාව — xi , xii

01. අර්ථශාස්ත්‍රාගත රජතුමා හා ඔහුගේ කාර්යභාරය — 1 - 7
පනාමුරේ සුගතසිරි හිමි

02. සමාජයේ ප්‍රභවය හා විකාශනය — 8 - 18
සුනිල් දැරංගල

03. පැරණි දාගැබ් මත පිහිට වූ යූපය පිළිබඳ යළි විමසීමක් — 19 - 32
ඉනෝජ් කෞශල්‍ය අබේනායක

04. වන්නි හත්පත්තුව හා බැඳි සංස්කෘතිය — 33 - 40
පවිත්‍රා මුතුමාලි නාරායණ

05. කෙටි පණිවිඩ සේවාව පිළිබඳ අධ්‍යයනයක් — 41 - 52
විපුල හේමන්ත බණ්ඩාර

06. ඓතිහාසික කොළොම්පුරයේ මාර්ග, ප්‍රවාහනය හා ස්ථාන — 53 - 79
උදය නෙළුම් රත්නායක

07. රූපවාහිනී වෙළෙඳ දැන්වීම් සඳහා නර්තන ප්‍රවේශය — 80 - 88
ශෂී නිරෝෂනී

08. දකුණු පළාතේ අභිලේඛනවලින් හෙළිවන රාජකීය අභිධාන හා තනතුරු — 89 - 98
රජිත් මධුසංක

09. සිනමා කර්මාන්තයේ උන්නතියට ප්‍රබුද්ධ ප්‍රේක්ෂක පිරිසකගේ අවශ්‍යතාව — 99 - 106
දිල්හානි විජේරත්න

10. සත් කෝරළයේ පිටිබෙරයේ සංස්කෘතිය හා බැඳුණු ආහාර කළමනාකරණය — 107 - 113
කුසුමලතා ලංකාමුල්ල

# ලේඛන සරණියට පූර්විකාව

මෙම ලිපි එකතුව සංස්කරණයට මග පෑදුණේ අහම්බයකින් බව කිව යුතු ය. අපගේ පැරණි මිතුරෙක් පසු ගිය දිනෙක ඔහුගේ ආයතනයෙන් කරනු ලබන සඟරාවක පළකරනු පිණිස ලිපි කිහිපයක් එකතු කර දෙන මෙන් මගෙන් ඉල්ලීමක් කෙළේ ය. එම ලිපි ලබා දෙන ලෙස අප විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් කිහිප දෙනකුගෙන් ඉල්ලීම් කළත් ඔවුන්ගේ කාර්යබහුලත්වය මත ඒ අවස්ථා මග හැරී ගියේ ය. ඒ අතර අප අධ්‍යයනාංශයේ සේවය කරන නිබන්ධක ආචාර්යවරුන්ටත් වෙනත් අධ්‍යයනාංශවල සේවය කරන සහාය කථිකාචාර්යවරුන් කිහිපදෙනකුටත් ආරාධනා කළ අතර ඔවුන්ගේ ලිපි කිහිපයක් අප අතට පත් විය. එහෙත් ඒ වන විට අප මිතුරාගේ ඉල්ලීම ඉටු කිරීම ප්‍රමාද වන්නට හේතු සැදී තිබිණි. එම නිසා මෙම ලිපි පළ කරනුයේ හුදෙක් මගේ ඉල්ලීම ඉටු කරනු වස් කාරුණික ව ලිපි සපයා දුන් ලේඛකයනට සාධාරණය ඉටුකරනු පිණිස ය.

මෙයට ලිපි සපයන ලේඛකයන්ගෙන් බහුතරයකගේ මංගල ලිපිය මෙහි පළවෙයි. ඔවුන්ගෙන් බොහෝ දෙනා අප විශ්වවිද්‍යාලයෙහි අභිනව නිබන්ධක ආචාර්යවරුන් බව ද සඳහන් කරමි. එම නිසා මෙම ලිපිවල යම් අඩුවක් ඇතොත් ඔවුනගේ අනාගත ලේඛන ජීවිතයෙහි අභිවෘද්ධිය පිණිස ඔවුනට කාරුණික ව ඒ බව පෙන්වා දෙනු මැනවි. ලිපිවල සියලු අදහස් ඒ ඒ ලේඛකයන් නියෝජනය කරන බව කිව යුතු ය.

මෙම 'ලේඛන සරණියෙහි' පළ වන ලිපි මානව ශාස්ත්‍ර මෙන් ම සමාජීය විද්‍යා ක්ෂේත්‍රය ද නියෝජනය කරයි. එහි සාහිත්‍යය, සන්නිවේදනය, සංස්කෘතිය, කලාශිල්ප ආදි විෂය හා සම්බන්ධ ලිපි කිහිපයක් වෙයි.

මෙහි පළමු ව අන්තර්ගත වන්නේ සංස්කෘත සාහිත්‍යය නියෝජනය කරමින් භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ නිබන්ධෝපදේශක පනාමුරේ සුගතසිරි හිමියන් විසින් ලියන ලද ලිපියකි. පුරාවිද්‍යාව සහ කලාශිල්ප යටතේ මෙහි පළ වන, ඉතිහාස පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ සහාය කථිකාචාර්ය කෞශල්‍ය අබේනායකගේ 'යූපස්තම්භය' හා සම්බන්ධ ලිපිය තද් විෂය සම්බන්ධයෙන් මෑත කාලයේ පළ වී ඇති විශිෂ්ට ගණයේ ලිපිවලින් එකක් බව කිව යුතු ය. තද් අධ්‍යයනාංශයේ ම සහාය කථිකාචාර්යවරියක වන නෙළුම් රත්නායකගේ 'කොළඹ නගරයේ මාර්ග ප්‍රවාහනය' සම්බන්ධ ලිපිය ද එවැන්නකි. සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ රජිත මධුසංකගේ 'දකුණු පළාතේ අභිලේඛනවලින් හෙළිවන රාජකීය අභිධාන හා තනතුරු' යන ලිපිය ද එකී විෂය ක්ෂේත්‍රය නියෝජනය කරයි. ජනසන්නිවේදනය විෂය

යටතේ පළවන එක් ලිපියක් අප අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුනිල් දැරංගලගේ ය. තද් විෂය සම්බන්ධ නිබන්ධක ආචාර්යවරුන් වන විපුල හේමන්ත බණ්ඩාර, දිල්හානි විජේරත්න සහ ශෂි නිරෝෂනී විසින් ලියන ලද ලිපි තුනක් ද මෙහි අන්තර්ගත ය. සංස්කෘතිය සම්බන්ධ ලිපිවලින් එකක් අප අධ්‍යයනාංශයේ සිංහල පිළිබඳ නිබන්ධක ආචාර්ය පවිත්‍රා මුතුමාලි නාරායණගේ ය.

'සත් කෝරළයේ පිටිබෙරයේ ආහාර කළමනාකරණය' මැයෙන් මවිසින් සම්පාදනය කරන්නට යෙදුණු ලිපිය සකස් කැරුණේ වයඹ පළාතේ සාම්ප්‍රදායික ආහාර සංස්කෘතිය පිළිබඳ ගවේෂණය පිළිබඳ ව ඈත ගම්දනව්වල සැරිසරන විට ලද අප්‍රකට තොරතුරුවලිනි.

මෙම ලේඛන පරිශීලනය කිරීමෙන් කිසියම් ප්‍රයෝජනයක් කවරකු විසින් හෝ ලබා ගන්නවා නම් අපගේ මෙම කුඩා ව්‍යායාමය ඵලවත් වූයේ යැයි සතුටු විය හැකි ය.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කුසුමලතා ලංකාමුල්ල
2013.10.08



# 01



# අර්ථශාස්ත්‍රාගත රජතුමා හා ඔහුගේ කාර්යභාරය

**පනාමුරේ සුගතසිරි හිමි**
රාජකීය පණ්ඩිත
ශාස්ත්‍රවේදී (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර
නිබන්ධක,
භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
sugatha99@gmail.com

'රාජ්' (බැබළීමෙහි) ධාතු සිද්ධ 'කනින්' ප්‍රත්‍ය පුරුෂලිංග නාමපදයක්[1] වන 'රාජ' යන්නෙහි අර්ථ ගණනාවක් වේ. රජු, ප්‍රධානියා, පාලකයා, හසුරුවන්නා යනු ඉන් සමහරකි.[2] සුමංගල ශබ්දකෝශයෙහි ජනයන් පිනවන්නා, රටක් පාලනය කරන්නා, නරේශ්වරයා, ස්වාමියා යන අර්ථ දක්වේ.[3] බුදුරජාණන් වහන්සේට අනුව කිසියම් කෙනෙක් දණ්ඩනය පණවයි ද ඔහු රජු ය, (යේවාපන ෂෙජ්ජහෙජ්ජං අනුසාසන්ති එතෙ රාජාතො නාම)[4] මිනිසුන් අතර ප්‍රමුඛයා, ප්‍රධානියා,(රාජමුඛං මනුසාසනං)[5] කකුල් දෙකින් සිටින්නන් අතර ප්‍රධානියා (ඛත්තියො ද්විපද සෙට්ඨා)[6] ආදී අර්ථ ගණනාවකින් රජු හඳුන්වා දෙයි. මෙකී අර්ථ විවරණවලට අනුව,

1. මිනිසුන් අතර ප්‍රධානියා
2. ජනතාව සතුටු කරන්නා
3. දණ්ඩධාරී තැනැත්තා
4. හසුරුවන්නා හෙවත් පාලකයා

යන ලක්ෂණවලින් සමුපේත පුද්ගලයා රජු බව පෙනේ. බොහෝ සාධකවලට අනුව සිවුපාවුන් පිළිබඳ බලධරයා ද රජු ම වූ බව පෙනේ.

සමස්ත අර්ථශාස්ත්‍රය තුළ ම රජුගේ භූමිකාව විහිදී යයි. කෞටිල්‍ය දකින රජු, රටේ ප්‍රධානියා වශයෙන් හැමවිට ම ස්වාධීන තීරණ ගත්ත ද නිතර ම අන්‍ය මත විමසා සම්මුතියෙන්, සාකච්ඡාවෙන් ගත් තීරණ ක්‍රියාත්මක කරන්නකු බව පෙන්වා දෙයි.

කෞටිල්‍ය දක්වන ආකාරයට රජකුලයෙන් පැවතීම ම රාජ්‍යත්වයට ඇති එක ම සාධකය නො වේ. රාජ්‍ය පාලනයට අවතීර්ණ වන පුද්ගලයා තුළ තිබිය යුතු ලක්ෂණ ගණනාවක් ඔහු පෙන්වා දෙයි. (මහා කුලීනොදෛවබුද්ධි සත්වසංපන්නො වෘද්ධදර්ශී ධාර්මිකඃ සත්‍යවාගවිසංවාදකඃ කෘතඥඃ ස්ථූලලක්‍ෂො මහොත්සාහොදීඝසූත්‍රඃ සත්‍යසාමන්තො දෘඪබුද්ධිරක්‍ෂුද්‍රපරිෂත්තො විනයකාම ඉත්‍යාභිගාමිකා ගුණාඃ")[7]

1. උසස් කුලයේ ඉපදීම
2. පරිපූර්ණ බුද්ධිය සහිත බව





3. විපතෙහි දී හා සැපතෙහි දී ධෛර්යමත් බව
4. උගතුන්ගේ අදහස් ග්‍රහණය කිරීම
5. ධාර්මික හා සත්‍යවාදී වීම
6. ක්‍රියාවෙන් හා වචනයෙන් එක සේ පැවතීම
7. කළගුණ දත් බව
8. දානපති බව
9. මනා උත්සාහවත් වීම
10. වහා කාර්ය කරන සුලු බව
11. පැමිණි අය ලෙහෙසියෙන් වසඟ කළ හැකි වීම
12. ඇමතිවරුන්ගෙන් යුක්ත වීම
13. විනය කැමති වීම

යන මේවා ස්වාමියාගේ ආභිගාමික ගුණ යැයි කියනු ලැබේ. මෙකී ගුණ එකිනෙකක් රජුට අවශ්‍ය වන්නේ කුමක් පිණිස ද යන්න කෞටිල්‍ය විවරණය කරයි.

රටේ නායකයා බුද්ධිමතුන් ප්‍රිය නො කිරීම ඔවුන්ගේ උපදෙස් නො ගැනීම එරටෙහි පරිහානියට අතවැනීමකි. මෙයට නිදර්ශන පුරාතන හා නූතන රාජ්‍යයන්ගෙන් ද හමුවෙයි. එබැවින් රාජ්‍යයේ දියුණුව අපේක්ෂා කරන නායකයා ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ද බුද්ධිමතුන් ඇසුරු කළ යුතු ය. අබිමුවට එන්නන්ගේ චිත්ත ප්‍රසාදය හා ආකර්ෂණය ඇතිවන අයුරින් රජු හැසිරිය යුතු ය. එනමුදු රාජ්‍යසම්පත් පෞද්ගලික, පටු අරමුණු උදෙසා යෙදවීම කෞටිල්‍ය, රජුගෙන් අනපේක්ෂිත ය. කළයුත්ත ප්‍රතිඵල ලැබෙන තෙක් එන බාධක හමුවේ උකටලී නො වී දැඩි චිත්ත ශක්තියකින් පවත්වාගෙන යෑමේ ගුණය රටේ නායකයා සතු වේ නම් එය ඔහුට ආභරණයකි. එය සැබවින් ම බබළන්නේ පොදු අරමුණක් වූ තරමට ම පමණි.

නීත්‍යනුකුල වීම, කෘතඥතාපූර්වක වීම රජු සතුවිය යුතු තවත් ගුණාංග දෙකකි. සංස්ථාපිත නීතිවල පොදුබව ආරක්ෂා කරන රජු ජනතා ගෞරවයට පාත්‍රවන්නේ නිරායාසයෙනි. කුලීනබව තත් සමාජයේ රජුට සවියක් වුව ද එය වර්තමානය හා සැසඳිය නො හැකි ය. යථාවාදී තථාකාරී ගුණය කෞටිල්‍ය දකින රාජ්‍යයේ රජු සතු වෙයි. මෙවැනි ගුණෝපේත රජකුගේ ආඥාව ලබන නිලධාරීන් රටවැසියන් ප්‍රජාතාන්ත්‍රික රාමුව තුළ ජීවත්වනු නිසැක ය.

රජු සතු ප්‍රඥාවේ තිබිය යුතු ගුණ වශයෙන් ශ්‍රවණය කිරීම, ග්‍රහණය කිරීම, කිසියම් විෂයයක් පිළිබඳ විශේෂ ඥානය, තර්ක කිරීම, දූෂිත කාර්යය අත්හැරීම, සත්‍යය කෙරෙහි ස්ථිර ගතිය දැක්වීම[8] කෞටිල්‍ය පෙන්වයි. ශූරකම, වැරදි දේ නො ඉවසීම, ශීඝ්‍රබව, නිපුණත්වය යන ලක්ෂණ රජු සතු උත්සාහයේ තිබිය යුතු ය. මනුස්මෘතිය තුළ ද මෙයට සමගාමී අදහසක් වෙයි.[9]

කෞටිල්‍ය ප්‍රකාශ කරන අන්දමට පාලකයකුගේ අතිශයින් වැදගත් ගුණාංගයක් විය යුත්තේ ඔහුගේ ඉන්ද්‍රිය සංවරය යි. පාලකයා ස්වකීය අභ්‍යන්තරයෙහි ම සිට සතුරුකම් කරන, තෘෂ්ණාව, කෝපය, ගිජුකම, අහංකාරය සහ ව්‍යාජ නිර්භීතකම යන සය වැදෑරුම් සතුරන් ජයගත යුතු ය.[10] එසේ ජය නොගෙන ඉඳුරන් දැමීමක් නැති සිය හැඟීම් පාලනය කර ගැනීමට අසමත් අසංවර පාලකයා සතර දිගන්තයෙහි ම බලය පතුරවාගෙන සිටියත්, කල් නො යා දී ඉතා ඉක්මනින් විනාශයට පත්වීම නියත බැවි කෞටිල්‍ය අවධාරණයෙන් ම පෙන්වා දෙයි.[11]

කෞටිල්‍ය දක්වන පාලකයා තුළ තිබිය යුතු තවත් විශේෂ ලක්ෂණයක් නම් කාර්යශූරත්වය යි. පාලකයා කාර්යක්ෂම වූ විට රාජ්‍ය සේවකයෝ ද කාර්යක්ෂම වෙති. පාලකයා නොසැලකිලිමත් ව කටයුතු කරන විට රාජ්‍ය සේවකයෝ ද ඔහු අනුව නොසැලකිලිමත් ව කටයුතු කරති. එවිට ඔවුහු රාජ්‍ය කටයුතු විනාශ කර දමති.[12] කෞටිල්‍ය රට පාලනය කරන තැනැත්තා ඉන්ද්‍ර, යම යන දෙවිවරුන්ට සමාන කොට ඇත්තේ ඔවුන්ගේ වෙසෙස් ගති රට පාලනය කරන්නා තුළ ද තිබිය යුතු බැවි අඟවමිනි. ඒ අනුව රාජ්‍ය පාලකයා ඉන්ද්‍ර දෙවියන් මෙන් කරුණාපරවශ සිතින් ජනතාවට අනුග්‍රහ දැක්විය යුතු ය. සාධාරණ විය යුතු ය. වරදට නිසි දඬුවම් දීමේ දී පාලකයා තම පුතාටත් සතුරාටත් කිසිදු වෙනසකින් තොර ව අදාළ දඬුවම දිය යුතු යැයි කෞටිල්‍ය තවත් අවස්ථාවක දී පෙන්වා ඇත.[13]

රාජ්‍ය තුළ රජුගේ කාර්යභාරය හඳුනා ගැනීමට ඔහුට නිර්දේශිත කාලසටහන ම ප්‍රාමාණික ය. රජු දවල් රෑ දෙක ම නාලිකා 8 බැගින් (නාලිකාවක් යනු විනාඩි 24 කි) (නාලිකා 8 x විනාඩි 24 / විනාඩි 60 = පැය 3) බෙදා නැතහොත් ඡායා ප්‍රමාණයෙන් බෙදා කළ යුතු කටයුතු වෙන් කර ගත යුතු ආකාරය පහත පරිදි වේ.





| රජුගේ දිවා කාලයේ කාලසටහන | |
|---|---|
| ප්‍රථම නාලිකා 8 | ආරක්ෂා විධාන හා අයවැය පරීක්ෂා කිරීම. |
| දෙවැනි නාලිකා 8 | නගරවැසියන් හා ජනපද වැසියන්ගේ කාර්ය සොයා බැලීම. |
| තෙවැනි නාලිකා 8 | ස්නානය කිරීම, භෝජනය හා වේද අධ්‍යයනය |
| සිව්වන නාලිකා 8 | ධනය බැලීම, විවිධ අධ්‍යක්ෂවරුන් විවිධ කාර්ය සඳහා පත් කිරීම. |
| පස්වන නාලිකා 8 | ලේඛන මගින් මන්ත්‍රී පර්ෂදය හා සාකච්ඡා කළ යුතු අතර චරපුරුෂයන්ගෙන් සැඟවිය යුතු වෘත්තාන්ත දත යුතු ය. |
| සයවන නාලිකා 8 | ස්වේච්ඡාපූර්වක ව මන්ත්‍රණ කළ යුතු ය. |
| සත්වන නාලිකා 8 | ඇත්, අස්, රිය හා අවි පරීක්ෂාව. |
| අටවන නාලිකා 8 | සෙන්පතියා සමග යුද්ධ ආදිය පිළිබඳ සාකච්ඡා කළ යුතු ය. |
| රජුගේ රාත්‍රී කාලයේ කාලසටහන | |
| ප්‍රථම නාලිකා 8 | චරපුරුෂයන් හමුවීම |
| දෙවැනි නාලිකා 8 | ස්නාන, භෝජන හා වේද අධ්‍යයනය |
| තෙවන, සිව්වන හා පස්වන නාලිකා 8 | තූර්ය නාදය සමග සයනය කරයි. |
| සයවන නාලිකා 8 | තූර්ය නාදය සමග අවදි වී ශාස්ත්‍ර හා කළ යුතු දේ පිළිබඳ සිතයි. |
| සත්වන නාලිකා 8 | චරපුරුෂ සාකච්ඡා හා ඔවුන් පිටත් කොට හැරීම. |
| අටවන නාලිකා 8 | ඍත්විජයන් ආචාර්යවරුන් හා පුරෝහිතයන්ගේ ස්තුති වචන සමග ආශිර්වාදය ලබාගැනීම, චිකිත්සක ප්‍රමුඛ ප්‍රධාන අරක්කැමියන් හා ජ්‍යොතිෂඥයන් සමග ඒ ඒ කරුණු පිළිබඳ සාකච්ඡා කරයි. |

රජුගේ යථෝක්ත දින චර්යාව තුළ පෞද්ගලික කාරණා ඇත්තේ කිහිපයකි. අනෙක් සියල්ල ම ජනතාව උදෙසා කළ යුතු කාර්යයන් සඳහා ය. සමස්ත දිනචරියාවෙන් වැඩි කාලයක් වෙන් වී ඇත්තේ රටේත් මහජනතාවගේත් ආරක්ෂාව පිළිබඳ සොයා බැලීමට යි. මහජනතාවගේ

සුභසාධනය වැඩි දියුණුකිරීම හා අභිවෘද්ධිදායි ව්‍යාපෘති සාකච්ඡා කිරීම මෙන් ම අදාළ කාර්යයන් පවරාදීමට රජු කාලය වෙන් කරගෙන ඇත. මෙහි එන ආත්මීය මන්ත්‍රණය වැදගත් අංගයකි. රටේ පාලනය පිළිබඳ ස්වයං විචාරයක් සිදු වේ. යාවත්කාලීන ව්‍යාපෘති හා ක්‍රියාමාර්ග රට තුළ අඛණ්ඩ ව පවත්වාගෙන යාම උදෙසා දිවා රෑ දෙකේ ම රජු වගකීමෙන් ස්වකීය කාලය රටවැසියා වෙනුවෙන් කැපකරන බව පෙනේ.

කෞටිල්‍ය දක්වන ප්‍රකාරයට රජු යනු ඒකාධිපතියෙක් නො වේ. ඔහුගේ බලය ආයතන කිහිපයක් නිසා සීමා කොට ඇත. ස්වාධීන ව ක්‍රියාත්මක වූ අවස්ථා ද දක්නට ඇත. සියලු කටයුතු ආරම්භ කරනු ලබන්නේ මන්ත්‍රී ඇ ප්‍රභූ පිරිස සමග සාකච්ඡා කිරීමෙන් පසුව ය. 'මන්ත්‍රපූර්වාඃ සර්වාරම්භාඃ'[15] එහි දී දෙදෙනකුට වැඩි පිරිසකගේ එකඟත්වය මත තීරණ ගනියි. ජනතා මතයට ද රජතුමා අවනත වූ බැව් පෙනේ.[16] කෞටිල්‍ය රජුට උපදෙස් ලබා දෙනුයේ සියලු ජනතාවට රජු දැකීමට අවස්ථාව තිබිය යුතු බව යි. ඇතැම්විට රජු ස්වාධීන ව ම තීරණ ගනී. යුද්ධයේ දී විටෙක රජු ද ගමන් කළ යුතු බව දක්වන කෞටිල්‍ය යුද්ධ කිරීම රජු ගේ වගකීමක් ලෙස සලකයි. රාජ්‍යයේ පැවැත්ම උදෙසා සාම, දාන, දණ්ඩ, භේද යන ක්‍රම අනුගමනය කළ යුතු බව දක්වා ඇත.

රජු, රටේ ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන අංශත්‍රයේ ම ප්‍රධානියා වුවත් පුරෝහිත, මන්ත්‍රී මණ්ඩලයේ උපදෙස් නිතර ම රජු ක්‍රියාවට නැංවූ බව පෙනේ. සමස්ත රාජ්‍යයේ ම වගකීම සියතට ගෙන ජනතා සුභසිද්ධිය උදෙසා කටයුතු සම්පාදනය කරනුයේ රජතුමා ය.

### පාදක සටහන්

- ශබ්දස්තෝම මහානිධි. 331 පිට.
- Sanskrit-English Dictionary, P. 872
- ශ්‍රී සුමංගල ශබ්දකෝෂය. 800. පිට.
- දීඝනිකාය. චක්කවත්ති සීහනාද සූත්‍රය. 285 පිට.
- එම. 196 පිට.
- එම. 543 පිට.
- අර්ථශාස්ත්‍රය, (අධිකරණ 3-7), 250 පිට.
- කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, 252 පිට
- මනුස්මෘතිය. VI. 36-47 පද්‍ය
- K.A. I, 3, 1. p. 113
- අර්ථශාස්ත්‍ර සාරය, 21 පිට
- K. A. I, I, 16, 1-5. P. 45
- අර්ථශාස්ත්‍ර සාරය, 18 පිට
- K. A. I, XVI, 6-23, p. 367





## ආශ්‍රිත ග්‍රන්ථ නාමවලිය


- කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, අධිකාර 1-2, පළමුවැනි කොටස, (පරි) පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2003
- R.P.Kangle, **The Kautiliya Arthasastra**, part III, Delhi Varanaci, 1965
- මනුස්මෘතිය හෙවත් මානව ධර්ම ශාස්ත්‍රය, (පරි) නිශ්ශංක, පියදාස, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1991
- ගුණසේකර, විජයසිරි, පුරාණ ඉන්දියවේ රාජ්‍ය පාලනය, නවය මුද්‍රණාලය, 1964
- චාල්ස්. එච්. ජී., කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍ර සාරය, ගොඩගේ සහ සහෝදරයෝ, 1999
- ශබ්දස්තෝම මහානිධි, විද්‍යාසාගර ජීවානන්ද , 1983
- English - **Sanskrit Dictionary**, Monier Monier Wiliams, New Delhi, 1985
- **Practical Sanskrit Dictionary**, Arthur Anthony Macdonell, Oxford University, England, 1929

# 02



# සමාජයේ ප්‍රභවය හා විකාශනය

**සුනිල් දැරංගල**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශාස්ත්‍රවේදී (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර
ශාස්ත්‍රපති (ජනසන්නිවේදන) කැලණිය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
derangala.suni@gmail.com



සන්නිවේදන විශාරදයකු වූ මහාචාර්ය විල්බර් ශ්‍රාම් පෙන්වා දෙන්නේ සන්නිවේදනයෙන් තොර ව මානව කණ්ඩායම්හි හෝ සමාජයන්හි පැවැත්මක් නො වන බව යි. එනම් මානව සමාජයේ සියලු ම සබඳතා ගොඩනැගෙන්නේ සන්නිවේදන ක්‍රියාවලියත් සමගිනි. සන්නිවේදනය පිළිබඳ ගැඹුරු හැදෑරීමක දී සමාජය පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයනයක් තිබීම අත්‍යවශ්‍ය ය. එමගින් සන්නිවේදනය හා සමාජය අතර පවතින්නා වූ සම්බන්ධතාවත් විවිධ සමාජ භූමිකාවන් තුළ සන්නිවේදනයේ ක්‍රියාකාරිත්වයත් නූතන ගෝලීයකරණ සමාජයේ සන්නිවේදන ප්‍රවණතා පිළිබඳවත් තර්කානුකූල ව අවබෝධ කොට ගත හැකි ය.

සමාජයේ ප්‍රභවය පිළිබඳ හැදෑරීමේ දී සමාජය යනු කුමක්දැයි විද්‍යාත්මක ව පැහැදිලි කර ගත යුතු ය. එහි දී සමාජ හා මානව විද්‍යා විද්වතුන්ගේ ඉදිරිපත් කිරීම්, මතවාද හා නිර්වචන කෙරෙහි අවධානය යෙදවීම වැදගත් වේ. රැල්ෆ් ලිංටන් (Ralph Linton) නම් සමාජ විද්‍යාඥයාගේ The Science of man in the world crisis නම් කෘතියේ පෙන්වා දෙන පරිදි "සමාජය යනු හොඳින් නිර්වචනය වූ සීමාවන් ඇති සමාජ ඒකකයක් ලෙස මොවුන් ම සිතන හා ඔවුන් එකට ජීවත්වීම් තුළින් හා එකට වැඩකිරීම් තුළින් සංවිධිත වූ යම් පුද්ගල ඒකකයකි."

සමාජ විද්‍යා ශබ්දකෝෂයට අනුව "සමාජයක් වනාහි අභ්‍යන්තර සංවිධානය, ප්‍රාදේශිකත්වය, සංස්කෘතිකමය විශේෂිකත්වය හා ස්ත්‍රී පුරුෂ වශයෙන් සමාජයට පුද්ගලයන් බඳවා ගැනීමට යොදනු ලබන ලක්ෂණවලින් යුක්ත සාපේක්ෂක වශයෙන් ස්වාධීන නැතහොත් ස්වයංපෝෂිත ජනගහනයකි."

එමෙන්ම මැක් අයිවර් නම් සමාජ විද්‍යාඥයා ස්වකීය Society නම් කෘතියෙන් පෙන්වා දෙන පරිදි "සමාජය යනු බලයෙන් හා අන්‍යෝන්‍ය උපකාරයෙන් නිදහසට හුරු පුරුදු වූ මිනිසුන්ගේ ක්‍රියාකාරී වැඩමුළුවක් වැන්න. මෙය සමාජ සම්බන්ධතා පිළිබඳ දැලකි. නිරතුරු ව ම වෙනස්වන ප්‍රපංචයකි."

රේමන්ඩ් පර්ත් නම් සමාජ මානව විද්‍යාඥයා ද ඉහත නිර්වචනයට සමාන අදහසක් පළකරමින් කියා සිටියේ "ඕනෑම සමාජයක් ගොඩ නැගෙන්නේ සංස්කෘතියක් හෙවත් සුවිශේෂ සංස්කෘතික සන්දර්භයක් තුළ බව යි.''

මෙම නිර්වචන සාරාංශගත කරමින් මහාචාර්ය දයා අමරසේකර සමාජය යනු කුමක්දැයි විග්‍රහ කොට ඇත්තේ මෙසේ ය.

I. සෑහෙන කාලයක් මුළුල්ලේ එකට අන්තර්ක්‍රියා කරමින් සිටින්නා වූ පුද්ගලයන් සමාජයට අවශ්‍ය කෙරේ.

II. යම් යම් සංවිධිත රටා හා සංස්ථාවන් මඟින් පුද්ගලයන්ගේ එම ක්‍රියා එක්තරා දෘශ්‍ය හෝ අදෘශ්‍ය පාලනයකට නතුකර පැවතීමක් අවශ්‍ය කෙරේ.

III. සමාජයේ සිටින හැම පුද්ගලයකු ම එකට සාමූහික බැඳීමකින් යුතුව ක්‍රියා කිරීමට අවශ්‍ය ආවේගය සපයන බලයක් පැවතීම අවශ්‍ය කෙරේ.

ඉතාමත් සරල ව විග්‍රහ කරතොත් සමාජය යනු අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය තුළින් සාමූහික ව බැඳුණු, සංවිධිත චර්යා රටාවන් සහ පාලනයක් සහිත පුද්ගල සමූහයක එකතුවකි.

සාමූහික ජීවිතයකට යොමු වෙමින් එබඳු සංවිධිත පසුබිමක් කරා මානවයා ආ මඟ පිළිබඳ විපරම් කිරීමෙන් සමාජයේ ආරම්භය සිදුවූයේ කෙසේදැයි හඳුනා ගත හැකි ය. එසේ ම සමාජයේ ගතික ස්වරූපයත් එහි ඓතිහාසික විකාශනයත් අවබෝධ කොට ගත හැකි ය.

"වර්ෂ මිලියන 4 කට පෙර ජීවත් වූ ඔස්ට්‍රලෝපිතෙකස් ඇපරෙන්සීස් (Australopithecus Aphaeresis) මානවයා, මුල් ම මානවයා ලෙස සැලකෙයි. 1974 දී ඉතියෝපියාවේ ඒෆාර් (Afar) ප්‍රදේශයෙන් සොයාගත් ලුසී (Lucy) නමින් හඳුන්වන ස්ත්‍රී මානව පොසිලය ඊට සාක්ෂ්‍ය දරයි. ඔස්ට්‍රලෝපිතකස් මානව ප්‍රභේද කිහිපයක් ඇති වූ බව පොසිල සාධක මගින් සොයාගෙන ඇත.





A- Africanus, A- Robustus, A- Boisei යනු එම මානව විශේෂයි. පොදුවේ මේ සියල්ලන් ම හඳුන්වනු ලබන්නේ ඔස්ට්‍රලෝපිතෙසීනයන් ලෙසිනි.

උස අඩි 3.5-5ක් පමණ වූත් පූර්ණ දෙපාවත් ගමන් විලාසයක් පෙන්නුම් කළා වූත් වානරයන්ට සමාන හිසේ හැඩයකින් හා වානරයන්ට වඩා කපාල ධාරිත්වයකින් යුක්ත වූත් ඔස්ට්‍රලෝපිතකස් මානවයන් මාංස මෙන් ම අල, කොළ, ඇට වර්ග ද අනුභව කරන්නට ඇති බව විශ්වාස කෙරේ. මොවුහු අප්‍රිකානු සැවානා තණ බිම් ආශ්‍රිත ව ජීවත් වූහ.

මානව ඉතිහාසයේ මුල් වරට මෙවලම් භාවිත කළ හෝමෝ හැබිලිස් (Homo Habilis) මානවයා නූතන මිනිසාගේ ආදිතමයා ලෙස ඇතැම්හු පෙන්වා දෙති. මීට වර්ෂ මිලියන 1.5 -2 ට පෙර ජීවත් වූ හෝමෝ හැබිලිස්, කෘතහස්ත මානවයා (Handy Man) යන නමින් ද හඳුන්වයි. 1959 දී නැගෙනහිර අප්‍රිකාවේ ටැන්සානියාවේ ඔල්ඩුබායි (Oldubai) දූර්ගයේ සිදු කළ කැණීම්වලින් හෝමෝ හැබිලිස් මානව පොසිලයක් මුල් වරට සොයා ගනු ලැබී ය. පසු කලෙක එහි පොසිල කෙන්යාව, ඉතියෝපියාව, දකුණු අප්‍රිකාව වැනි ප්‍රදේශවලින් ද සොයාගෙන ඇත. ඔස්ට්‍රලෝපිතසීනයන්ට වඩා තරමක් විශාල වූ කපාල ධාරිතාවකින් යුක්ත වූ හෝමෝ හැබිලිස් මානවයාගේ විශේෂත්වයක් වූයේ හස්ත කෞශල්‍යයෙන් යුක්ත වීම (ඇඟිලි හැසිරවීමේ හැකියාව) නිසා මෙවලම් තැනීමට හැකියාවක් පැවතීම යි. මෙම හැකියාව කරණ කොට ගෙන ගල් ආයුධ නිපදවන්නට ඇති බව අනුමාන කෙරේ. සර්ව-භක්ෂක වූ හෝමෝ හැබිලිස් මානවයා කණ්ඩායම් වශයෙන් එක් වී සාමූහික ව සතුන් මරා ගත් බවට විශ්වාස කෙරේ. මෙම සාමූහික ක්‍රියාවලියේ දී උපදෙස් හා විධානයන් ලබා දීම අත්‍යවශ්‍ය වූ හෙයින් යම් යම් ශබ්ද හා හස්ත මුද්‍රා (Hand Signs) සන්නිවේදනය සඳහා යොදා ගන්නට ඇති බව විශ්වාස කළ හැකි ය.

මානව පරිණාමයේ ඊළඟ අවධිය ලෙස සැලකෙන්නේ හෝමෝ ඉරෙක්ටස් (Homo erectus) අවධිය යි. මීට වසර මිලියන 1.6 කට පමණ පෙර උතුරු අප්‍රිකාව, දකුණු යුරෝපය, ඉන්දුනීසියාව, ජාවා, චීනය වැනි රටවල හෝමෝ ඉරෙක්ටස් මානවයා ව්‍යාප්ත ව සිටි බවට සාධක හමු වී ඇත. ජාවා මිනිසා, පීකිං මිනිසා හා හීඩල්බර්ග් මිනිසා නමින් ද හැඳින්වෙන හෝමෝ ඉරෙක්ටස් උග්‍ර මාංස භක්ෂකයෙක් වේ. කපාල ධාරිතාව 850 cc-1350 cc

පමණ වූ අතර එය H. Habilis ගේ කපාල ධාරිතාවට වඩා වැඩි ය. මුල් වරට ගින්දර භාවිත කළ ජීවියා ලෙස ද, උණුසුම සඳහා සත්ත්ව හම් භාවිතය නිසා මුල්වරට ඇඳුම් භාවිත කළ මිනිසා ලෙස ද සැලකෙන්නේ හෝමෝ ඉරෙක්ටස් මානවයා ය. සමූහ ලෙස දඩයම් කිරීම, ආහාර පුලුස්සා ගැනීම, බෙදා හදා ගැනීම වැනි හේතු නිසා සංවිධානාත්මක බවක් හා සංස්කෘතියක් පැවති හෙයින් ඔවුන්ට ඉහළ සන්නිවේදන හැකියාවක් පවතින්නට ඇති බව නිසැක ය. Homo Erectus ගේ සම්පූර්ණ පොසිලයක් 1980 දශකයේ දී කෙන්යාවේ Lake purkana ප්‍රදේශයෙන් සොයා ගෙන ඇත. මෙම හෝමෝ ඉරෙක්ටස් මානවයාගෙන් පරිණාමය වූ හෝමෝ සේපියන් (Homo Sapiens) මානවයා දැනට වර්ෂ පන් ලක්ෂයකට පමණ පෙර අප්‍රිකාවේ වාසය කළ බවට පොසිල සාධක හමු වී ඇත. මොවුන් දක්ෂ දඩයම්කරුවන් වූ අතර කණ්ඩායම් දෙකක් ලෙස හෝමෝ සේපියන්ස් වර්ග දෙකක් ජීවත් වූ බවට හඳුනා ගත හැකි ය.

1. හෝමෝ සේපියන් නියන්ඩර්තාලෙන්සිස් (නියන්ඩතාල්වරු) (Homo Sapiens Neanderthalensis)

2. හෝමෝ සේපියන් සාපියන් (ක්‍රොමැග්නන්වරු) (Homo Sapiens Sapiens/ Cro- Magnon)

නියන්ඩතාල් මානවයන් හා හෝමෝ සේපියන් සාපියන් හෙවත් ක්‍රොමැග්නන් මානවයන් දැනට වර්ෂ මිලියන 4 කට පමණ පෙර අප්‍රිකාවේ හා යුරෝපයේ වාසය කළ අතර මීට වසර 34000 ට පෙර නියන්ඩතාල්වරුන් මිහිපිටින් තුරන්ව ගොස් ඇත. නියන්ඩතාල් අබිබවා නැඟී සිටීමට ක්‍රොමැග්නන්වරුන් සමත්වීම ඊට හේතුව යි. නියන්ඩතාල්වරුන්ගේ විනාශයට බලපෑ තවත් හේතුවක් ලෙස සන්නිවේදන විද්වතුන් පෙන්වා දෙන්නේ ඔවුන්ගේ සන්නිවේදන දුර්වලතා නිසා සාමූහික පැවැත්මට බාධා මතුවීම තුළින් මිහිපිටින් තුරන් වන්නට ඇති බව යි.

කෙසේ වුව ද හෝමෝ සේපියන් සාපියන් හෙවත් ක්‍රොමැග්නන් මානවයා නූතන මිනිසාට බෙහෙවින් සමාන වූ අතර ඔහු විවිධ කුසලතා පෙන්නුම් කළ අයෙක් විය. ඇමරිකාවේ සිට ඕස්ට්‍රේලියාව දක්වා ව්‍යාප්ත ව සිටි ක්‍රොමැග්නන් මානවයන් බෝට්ටු තනා ප්‍රයෝජයට ගත් බවට ද, රෙදි භාවිත කළ බවට ද ගල්වලින් තැනූ විවිධ ආයුධ භාවිත කළ බවට ද, ගුහා තුළ





බිතු සිතුවම් ඇඳි බවට ද මූර්ති නෙළූ බවට ද සාක්ෂි ඇත. මොවුන් ආගම් ඇදහූ අතර සංකීර්ණ සංස්කෘතියක් ද පිළිබිඹු කොට ඇත. කපාල ධාරිතාව 1500 cc ක් පමණ වූ හෙයින් ව්‍යූහාත්මකව නූතන මිනිසා හා ක්‍රොමැග්නන් මානවයා අතර වෙනසක් නොවීය. කෙසේ වුවද සංස්කෘතිකමය වශයෙන් විශාල වෙනස්කම්වලට මුහුණ දෙමින් නූතන මිනිසා වඩාත් දියුණු මට්ටමකට පැමිණ ඇත. සංචාරක ජීවිතයකට හුරුව සිටි ක්‍රොමැග්නන්වරුන් ඉහළ සන්නිවේදන ශක්‍යතාවන් පෙන්නුම් කොට ඇති බව ද විශ්වාස කෙරේ.

මීට වසර 30,000 කට පෙර බළන්ගොඩ, බටදොඹලෙන ආශ්‍රිතව සොයාගත් පොසිල ද හෝමෝ සේපියන් සාපියන් හෙවත් ක්‍රොමැග්නන් මානවයා නියෝජනය කරන බව විද්වත්හු පෙන්වා දෙති. මෙම පොසිල "බළන්ගොඩ මානවයා" (Balangoda Man) ලෙසත් "නූතන මානවයා" ලෙසත් හඳුන්වයි.

එහෙත් නූතන මානවයා පිළිබඳ වැඩි දෙනාගේ හඳුනා ගැනීම වන්නේ නියෝලිතික (Neolithic) යුගයට අයත් කෘෂිකර්මයට හා සත්ත්ව පාලනයට යොමු වූ අය ලෙස යි. ක්‍රොමැග්නන්වරුන් ගත කළ සංචාරක ජීවිතය අතහැර දැමූ නූතන මානවයා ස්ථිර වාසස්ථාන නිර්මාණය කර ගැනීමට උත්සුක විය. පැලියෝලිතික යුගයේ (Paleolithic) භාවිත කළ ගල් මෙවලම් වෙනුවට ලෝහ මෙවලම් තනා ගැනීමට ඔවුහු යොමු වූහ.

එමෙන් ම තමන්ට අවශ්‍ය ආහාර වගා කරමින් පරිසරය ජය ගැනීමත් සතුන් හීළෑ කරගනිමින් එදිනෙදා කටයුතුවලට අවශ්‍ය මෙවලම් නිෂ්පාදනය කර ගැනීමටත් සමත් වූ නූතන මානවයා හැලි වළං නිෂ්පාදනය, මලු නිෂ්පාදනය, රෙදි විවීම වැනි කටයුතු සඳහා ද යොමු විය. අස්වැන්නේ අතිරික්තය හා නිෂ්පාදනය කළ භාණ්ඩ හුවමාරු කරගත් අතර ඒ සඳහා ගණිත ක්‍රම සහ සටහන් කර ගැනීමේ යම් යම් සංකේත ද භාවිත කොට ඇත. මෙය මානව සන්නිවේදන ඉතිහාසයේ විශේෂ අවස්ථාවක් වේ.

ෆෙඩ්රික් එංගල්ස්ගේ විග්‍රහයට අනුව නූතන මිනිසා අයත් වන්නේ ශිෂ්ටාචාර අවදියට යි. මානව පරිණාමයට සමගාමී ව සිදු වූ සංස්කෘතික පරිණාමය ද විග්‍රහ කරමින් එංගල්ස් විසින් සමාජ පරිණාමයේ අවස්ථා 3 ක් පෙන්වා දෙයි.

I. ප්‍රාකෘතික අවධිය
II. වනචාරී අවධිය
III. ශිෂ්ටාචාර අවධිය

එංගල්ස් පෙන්වා දෙන පරිදි ප්‍රාකෘතික අවදියේ මානවයා අර්ධ වශයෙන් ගස් උඩ ජීවත් වූ අතර පලතුරු අනුභව කොට ඇත. එමෙන් ම ක්‍රමයෙන් පරිසරය ජය ගැනීමට යම් යම් රළු මෙවලම් නිෂ්පාදනය කරන්නට ද ඇත.

ම්ලේච්ඡ වනචාරී අවධියේ මස් මාංස අනුභවයෙන් දඩයම් ජීවිතයක් ගෙවූ මිනිසා මැටි භාණ්ඩ, අවි ආයුධ නිෂ්පාදනය, සතුන් ඇති කිරීම, වාසස්ථාන ඉදිකර ගැනීම යනාදී කාර්යයන් සඳහාත්, සන්නිවේදනය සඳහා හෝඩියක් නිර්මාණය කර ගැනීමටත් යොමු වූ බව එංගල්ස් විශ්වාස කරයි.

ශිෂ්ටාචාර අවධියේ දී ලොව පුරා මානව ශිෂ්ටාචාර ව්‍යාප්ත වී උසස් සංස්කෘතියක් බිහි වූ අතර උසස් සන්නිවේදන ක්‍රමෝපායයන් ද ව්‍යාප්ත විය. සංඥා, සංකේත ඔස්සේ ආරම්භ වූ මානව සන්නිවේදනයේ ක්‍රමික වර්ධනයෙන් ලේඛනය සඳහා අක්ෂර මාලා නිපදවා ගැනෙන්නේ ශිෂ්ටාචාර යුගයේ දී ය.''

මානවයා හා සමාජයේ විකාශනය පිළිබඳ කාල් මාක්ස් ඉදිරිපත් කරන විග්‍රහය දේශපාලන දෘෂ්ටිකෝණයකින් ඉදිරිපත් කෙරුණකි. එසේ ම ආර්ථික රටාව පදනම් කරගෙන දේශපාලනය මෙන් ම සමාජයේ විකාශනයත් සිදු වන බව ඔහු පැහැදිලි කරයි. ඓතිහාසික ව සිදු වූ මානවයා හා විකාශනය පිළිබඳ මාක්ස්ගේ ඉදිරිපත් කිරීම තුළින් ඒ දෙස නව කෝණයකින් බැලීමට ද අප යොමු කරයි. කාල් මාක්ස්ට අනුව සමාජයේ ගමන් මග අදියර 5ක් ඔස්සේ හඳුනා ගත හැකි ය.

1. පුරාණ සමාජය / ප්‍රාථමික සමාජය
2. වහල් සමාජය
3. වැඩවසම් සමාජය
4. ධනවාදි සමාජය
5. සමාජවාදි සමාජය





පංචේන්ද්‍රියන් තුළින් ඇති කළ උත්තේජනයන්ට ප්‍රතිචාර දක්වමින් සීමිත අවශ්‍යතා කිහිපයක් පමණක් සපුරා ගැනීමට කටයුතු කළ පුරාණ සමාජයේ සාමාජිකයෝ එකිනෙකා සමග සබඳතා පැවැත්වීමට ප්‍රමාණවත් දැනුමෙන් යුක්ත වූවෝ නො වූහ. මෙම සමාජය ප්‍රාකෘතික නැතහොත් දඩයම් මානව සමාජය ලෙස ද හඳුනාගත හැකි ය. එම සමාජයේ ඊළඟ අදියර වූයේ වහල් සමාජය යි. එනම්, බලවන්ත, ශක්තිවන්ත පුද්ගලයන් අන්‍යයන් වහලුන් ලෙස තම සේවාවන් සඳහා යොදා ගැනීමට කටයුතු කිරීම යි. එකී වහල් භාවයට නෛතික පසුබිමක් ද එක් කරමින් වැඩවසම් සමාජය ක්‍රියාත්මක විය. එනම් රදලයන්ට, ධනවතුන්ට නැතහොත් පාලක ප්‍රභූවරුන්ට සේවය කිරීම දුබලයාගේ වගකීමක් ලෙස එකී සමාජ තුළ ක්‍රියාත්මක වූ නීති පද්ධති තුළින් බැඳ ගනු ලැබුණි. ඒ තත්ත්වය තුළ රදලයන්ට සේවය කිරීම පැහැර හැරීම දඬුවම් ලැබිය හැකි වරදකි. මෙහි දී ධන ධාන්‍ය, වතු පිටිවල හිමිකාරිත්වය රදළ පැලැන්තිය සතු විය.

මූල්‍යමය ප්‍රාග්ධනය මත ගොඩ නැගෙන සමාජය ධනවාදී සමාජය යි. අද බොහෝ විට දැකිය හැක්කේ මෙබඳු පසුබිමකි. මෙයින් අදහස් වන්නේ මෙබඳු සමාජයක දිළින්දන් සිටිය නො හැකි ය යන්නක් නො වේ. එනම්, මුදල සියල්ලට ම වඩා පෙරට පැමිණෙන අතර ඒ මත සියලු වටිනාකම්, හර පද්ධතීන් තීරණය වන බව යි. එහි අවසාන අදියර ලෙස කාල් මාක්ස් පෙන්වා දෙන්නේ සමාජවාදී සමාජය යි. සියල්ලන්ට ම සමතැන් ලැබෙන සමාජය පරමාදර්ශී සමාජයක් ලෙස ඔහු දකියි. ඔහුගේ ඉදිරිපත්කිරීම් සියුම් ව විමසීමෙන් පැහැදිලි වන්නේ ප්‍රාකෘතික හෝ වනචාරී ම්ලේච්ඡ ගති ලක්ෂණ සහිත හෝ ශිෂ්ටාචාර සම්පන්න හෝ මානවයන් ඕනෑ ම සමාජ පසුබිමක සිටිය හැකි බව යි.

ශිෂ්ටාචාර යුගය 'ගොවි යුගය' ලෙස ද ඇතැම් විද්වත්තු පෙන්වා දෙති. ඉන් පෙර යුග දඩයම් හා එඬේර යුග ලෙස හඳුන්වති. දඩයම් යුගයේ දී සතුන් දඩයම් කරමින් ආහාරයට ගත් මානවයා එඬේර යුගයේ දී සතුන් හීලෑ කර ගැනුණි. ආහාර සොයා එහා මෙහා ගමන් කළේ එසේ හීලෑ කරගත් සතුන්ගේ ආධාරයෙනි. මෙම යුගය සංචාරක යුගය ලෙසින් ද හඳුනාගත හැකි ය. ගොවි යුගය හෙවත් ශිෂ්ටාචාර යුගයේ දී පවුල නමැති සමාජ සංස්ථාව වඩාත් ස්ථාවර වූ බව පැහැදිලි ය.

"එඬේරුන් මෙන් සංක්‍රමිකයන් නොවූ ඔවුහු එක්තරා ප්‍රදේශයකට සීමා වී, එහි ම ජීවත් වූහ. එහෙත් මුල දී ඔවුන් කළේ කැලෑ ගිනි තබා එහි බෝග වැපිරීම යි. (හේන් ක්‍රමය). කලකට පසු මෙය අතහැර දැමූ ඔවුහු තවත් අලුත් පෙදෙසකට ගියහ. ඇත්ත වශයෙන් ම මුල් ගොවි ජීවිතය හා එඬේර ජීවිතය එකල මිනිසා විසින් තෝරා ගත යුතු විකල්ප දෙකෙන් එකක් විය. සෑම විට ම පාහේ පරිසරය විසින් පාලනය වූ ඔවුන්ට පරිසරය වෙනස් කිරීමට හෝ පරිසරය අනුව තමන්ට සකස් වීමට මඟක් නො විණ.

අදට අවුරුදු 6000කට පමණ පෙර ප්‍රථම නඟුල නිපද වී යැයි කල්පනා කෙරේ. ඒ හා සමග ම ගොවි යුගය විප්ලවීය අන්දමින් ආරම්භ විය. නඟුල නිසා පොළවේ සශ්‍රීකත්වය දියුණු කිරීමට මඟක් පහළ විණ. ගොවි කර්මාන්තය මේ අන්දමට ඇරඹීමෙන් අතිරික්ත නිෂ්පාදනයක් බිහි කිරීමට මිනිසාට හැකි විය. එඬේර හෝ මුල් ගොවි යුගයේ (හේන් කොටන අවදියේ) ප්‍රමාණයට වඩා සංඛ්‍යාවක් මේ ගොවි සමාජවල ජීවත් වන්නට ඉඩ ලැබිණි. ගොවිතැන නිසා විවේක කාලය ද වැඩි විය. ගොවිතැනින් ආහාර සැපයෙන විට තවත් පිරිසකට වෙනත් විශේෂ දක්ෂතා හා සම්බන්ධ විවිධ මාර්ගවල නිරත වීමට පුළුවන් විය.

ගොවි සමාජවල සංඛ්‍යාව සිය දහස් ගණන ඉක්ම විය. ඒවා අහුලා ගෙන හා දඩයමින් ආහාර සොයා ගත් එඬේර සමාජ මුල් ගොවි සමාජවලට වඩා ප්‍රමාණයෙන් බෙහෙවින් විශාල විය. ගම් සංඛ්‍යාව වැඩි වූ අතර ඒ සමග ම මේ යුගයේ දී නගර පහළවීම ද සිදු විය. දේශපාලන සංස්ථා ද මේ වකවානුවේ දී ඉතා සංකීර්ණ ව දියුණු විය.

කර්මාන්ත සමාජය පහළ වූයේ මීට පසුව ය. එය මීට අවුරුදු 250කට පමණ පෙර ප්‍රථමයෙන් ම එංගලන්තයේ පහළ වී යැයි පිළිගනු ලැබේ. මීට පසු ඒ සමාජමය ක්‍රමය ලෝකයේ අවශේෂ රටවලට පැතිරී ගියේ ය. එහි ප්‍රධාන ලක්ෂණය වූයේ මෙතෙක් මිනිසා දෑතේ බලයෙන් කළ කටයුතුවලට බල ශක්තිය හා තාක්ෂණික ක්‍රම යොදා ගැනීම යි. අලුත් සොයාගැනීම් හා නිපැදවීම් මේ වකවානුවේ දී ශීඝ්‍රයෙන් වර්ධනය විය. වාෂ්ප යන්ත්‍රය, විදුලි බලය, පරමාණු බලය යනාදී සොයා ගැනීම් මිනිසාගේ තාක්ෂණය පමණක් නොව ආර්ථික හා සමජ ජීවිතය ද බලවත් විපර්යාසයකට පත් කළේ ය."





මානව සමාජයේ ක්‍රමික සහ අක්‍රමික විකාශනය තුළ දැනුම, තාක්ෂණය ඇතුළු අංග සමුදායක් වඩාත් ශීඝ්‍රයෙන් වර්ධනය වන්නේ ශිෂ්ටාර යුගයේ දී බව පැහැදිලි ය. සමාජයේ විකාශනයත් සමගින් පුද්ගල අවශ්‍යතා ද සංකීර්ණ වේ. එම සංකීර්ණ අවශ්‍යතා තෘප්ත කරමින් ඉදිරියට ආ මානව සමාජයේ ගාමක බලවේගය බවට පත් වන්නේ දැනුම යි. දැනුම බලයක් මෙන් ම සම්පතක් ද වේ. එය වඩාත් බලසම්පන්න වන්නේ සියල්ලන් අතරේ ම එම දැනුම බෙදී යාමෙනි. එනම්, සන්නිවේදනය වීම තුළිනි. ගංගා නිම්න ආශ්‍රිත ව ගොඩ නැඟුණු ශිෂ්ටාචාර තුළ මෙකී සන්නිවේදනය ප්‍රබල ව සිදු වූ බව පැහැදිලි ය. ලොව ප්‍රකට එබඳු ශිෂ්ටාචාර 06කි.

1. මෙසපොතේමියාවේ (ඉරාකය) යුප්‍රටීස් - ටයිග්‍රිස් නිම්න ශිෂ්ටාචාරය (සුමේරියානු ශිෂ්ටාචාරය) ක්‍රි. පූ. 4000
2. මිසරයේ (ඊජිප්තුව) නයිල් නිම්න ශිෂ්ටාචාරය (ක්‍රි. පූ. 4000)
3. චීනයේ හොවැංහෝ නිම්න ශිෂ්ටාචාරය (ක්‍රි. පූ. 2000)
4. භාරතයේ (ඉන්දියාව) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය (ක්‍රි. පූ. 3000), මොහෙන්ජොදාරෝ - හරප්පා නිම්න ශිෂ්ටාචාරය
5. ග්‍රීසියේ කොකොරෙට්සා - චාවෝස් නිම්න ශිෂ්ටාචාරය (ක්‍රි. පූ. 2800)
6. රෝමයේ ටයිබර් නිම්න ශිෂ්ටාචාරය (ක්‍රි. පූ. 1200)

සුමේරියන්වරුන්ගේ චිත්‍ර ලේඛන, මිසර ජාතිකයන්ගේ රූපාක්ෂර ලේඛන හා ගිසාහි පිරමීඩ, චීන කලා ශිල්ප හා ආගමික විශ්වාස භාරතයේ කලා ශිල්ප හා ආගමික දාර්ශනික ඉදිරිපත් කිරීම් මෙන් ම රෝමය, ග්‍රීසිය පාදක කොට ගත් කලාව, දර්ශනය ආදී දායාදයන් ඔස්සේ විකාශනය වූ සමාජය අද අපි අත් විඳිමින් සිටිමු. අප සතු දැනුම, තාක්ෂණය, ශිල්පීය කුසලතා, කලාව, චින්තනය ආදී සියල්ල ම මානව සමාජය ක්‍රමික හා අක්‍රමික විකාශනයේ ප්‍රතිඵල ය. ඒ සියලු ප්‍රතිඵල අප වෙත ළඟා වූයේ සන්නිවේදනයේ මහිමය හේතු කොට ගෙන ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- අමරසේකර, දයා, ''සමාජ විද්‍යාව- සිද්ධාන්ත සහ විධික්‍රම'', ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ, 2010, පි. 116
- **Society Encyclopedia of Social Science**, The Macmillan Co, Free press, Vo. 14, p. 571
- අමරසේකර, දයා, ''සමාජ විද්‍යාව- සිද්ධාන්ත සහ විධික්‍රම'', ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ, 2010, පි. 117
- එම. පි. 118
- දැරංගල, සුනිල්, ''ජනසන්නිවේදනය - සන්නිවේදන ප්‍රවේශය'', සහස්‍ර ප්‍රකාශකයෝ, කොළඹ 10, 2007, පි. 124-129
- රත්නපාල, නන්දසේන, ''සමාජ විද්‍යාවේ මූලධර්ම'', ස්ටැම්ෆර්ඩ් ලේක් පෞද්ගලික සමාගම, පන්නිපිටිය, 2000, පි. 31
- රණවීර, ස්වර්ණා, ''ආදි මානව යුගය සහ පැරණි ශිෂ්ටාචාරය'', පි. 61




03



# පැරණි දාගැබ් මත පිහිට වූ යූපය පිළිබඳ යළි විමසීමක්


**ඉනෝජ් කෞශල්‍ය අබේනායක**
සහාය කථිකාචාර්ය
ශාස්ත්‍රවේදී (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
inojmms@yahoo.com

## හැඳින්වීම

පැරණි දාගැබ් නිර්මාණයේදී භාවිත ස්තූප අංගයක් ලෙස යූපස්තම්භය හැඳින්විය හැකි ය. දාගැබේ උපරි භාගය හා බැඳී පවතින එම පූජනීය අංගය ගර්භය මත ඉහළට එසවෙන සේ පිහිට වීය. සාමාන්‍ය ආකාරයට ගල් කුලුනක් ලෙස ස්තූපය මුදුනත පිහිටුවන මෙහි පහත අර්ධය සිවුරැස් වන අතර ඉහළ අර්ධය අටපට්ටම් හැඩයක් ගනී. හතරැස් කොටස ස්තූප ගර්භයේ ගිලී පවතින අතර, අටපට්ටම් කොටස හර්මිකාව (හතරැස් කොටුව) මධ්‍යයෙන් ඉහළට එස වී දර්ශනය වේ. අටපට්ටම් කොටසේ එක් එක් පට්ටමක නෙත්ති දාරයක් මෙන් මඳක් උන්නතව සකසා ඒවා සියල්ල යූපය මුදුනේදී එකට මුණගැසී පැතලි නෙළුමකට සමාන හැඩයකින් අවසාන කරයි. දැනට හමුවී ඇති විශාලතම යූපය අභයගිරි සෑ මළුවේ දැකිය හැකි වන අතර කොටස්වලට වෙන්ව ඇති මෙය අඩු තරමින් අඩි 32 කට නොඅඩු දිගකින් යුක්ත වේ. පැරණි දාගැබ් සහිත බොහෝ ස්ථානවලින් විනාශවුණු යූපස්තම්භ එකක් හෝ වැඩි ගණනක් සොයාගත හැකි වේ. යූපයේ ප්‍රමාණය ස්තූපයේ විශාලත්වය පිළිබඳ කියැවෙන පැහැදිලි සාධකයකි. විවිධ පුරාවිද්‍යා පරිශ්‍රයන්ගෙන් හමුවන යූපයන්ගේ නිර්මාණාත්මක ස්වාභාවයේ කිසියම් වෙනසක් දැකිය හැකි වුවත් මූලික ආකෘතිය එකම ස්වරූපයක් ගන්නා බව පෙනේ.

## යූපස්තම්භය

ක්‍රි.ව.7 සියවසේදී හෝ ඒ ආසන්න පසු කාලයේදී ලංකාවේ රචනා වූ මංජුශ්‍රී භාෂිත වාස්තුවිද්‍යාශාස්ත්‍ර ග්‍රන්ථයෙහි යූපය ''ගජපාදක'' ''ගජස්තම්භ'' යන නම්වලින් හඳුන්වා ඇත. මෙම වචන දෙකෙහිම මූලික අර්ථය එකම බවත් එමගින් ඇතකු බැඳ තබන කණුව යන අදහස ගම්‍යමාන වන බව එම ග්‍රන්ථය පෙන්වා දෙයි.(මාරසිංහ 1993:liv) යූපය සඳහා ගජස්තම්භ ලෙස ව්‍යවහාර වූයේ කුමක් නිසා දැයි ග්‍රන්ථය තුළින් කරුණු අනාවරණය කරගත නොහැකි ය. යූපය චෛත්‍යයට ආගමික අර්ථයෙන් එක්කළබව පොදු පිළිගැනීම වේ. එහෙත් යූපය පිහිටුවීමේදී ගර්භය හා හර්මිකාව මනාකොට සම්බන්ධ වන





බැවින් ස්තූපයේ උපරිභාගයට කිසියම් ආරක්ෂාවක් ලබාදීමේ පිටුබලයක් ද ඉන් සැලසෙනු ඇත. එසේ ආරක්ෂාවක් ලැබෙනුයේ ඇතකු බැඳ තබන කණුවක් සේ ශක්තිමත්භාවයෙන් හා ස්ථිරත්වයෙන් යූපය නිර්මාණය වී ඇති නිසාය. තව ද හස්තියා මංගල සංකේතයක් ලෙස ද පුරාණයේ සිට මිනිසුන් තුළ විශ්වාසක් පැවති බැවින් කලාකෘති අරබයා ද හස්තියා යොදා ගැනුණි. මෙ අදහස සැලකිල්ලට ගනිමින් ශක්තිය මෙන් ම පූජාවස්තුවක් ලෙස නියෝජනය කරන යූපය සඳහා ගජස්තම්භය ලෙස ව්‍යවහාර කිරීම සාධාරණ බැව් හැඟේ.

වෛදික ආගමට අනුව දෙවියන් සතුටු කිරීම සඳහා සතුන් බිලිදීමට යාග භූමිය වෙත ගෙනා කල බැඳ තබනු ලබන්නේ දැව යූපස්තම්භයේ ය. (රසුවංශය 1993:61) එම නිසා යූපය දෙවියන් වෙනුවෙන් වෙන්වූවක් බව පැහැදිලිය. 'යූ' හා 'යුප්' ධාතුන්ගෙන් හටගන්නා යූප යන්නෙහි මූලික අර්ථය කණුව, කුලුන හා දණ්ඩ යන්න වේ. එය සතුන් බිලිදීමේ යාග සඳහා මෙන් ම ජයග්‍රහණයේ සංකේතය ලෙසට ද භාවිත වී ඇත. (Williams 1899:856) පූර්ව බෞද්ධ යුගයේදී විශේෂයෙන් වේද සමයේදී මළවුන් දැවූ පසු භෂ්මාවශේෂ නිදන් කර ඒ මත පස් ගොඩැල්ලක් තැනීමත් එමෙන් ම දැවමය ස්තම්භයක් පිහිටුවීමත් සිරිතක්ව පැවති බව පෙනේ. එහෙත් පශ්චාත් බ්‍රාහ්මණ යුගයේදී එය සිහිවටනයක් ලෙස ගෙන ඇත. ඍග්වේදයට අනුව යූපය ස්මරණීය මෙන්ම ආරක්ෂා කළයුතු වස්තුවක් වේ. (Regveda IV-33-3) එම පස් ගොඩැල්ල එකල 'චෛත්‍ය' නාමයෙන් හඳුන්වා තිබෙන අතර ඒ මත ඔසවා තබන ලද දැවමය ස්තම්භය 'චෛත්‍ය යූප' ලෙස හඳුන්වා ඇත. (Ramayanaya 2-50-8) මේ නිසාවෙන් යූපය චෛත්‍ය යන සංස්කෘතිකාංගය හා බැඳී පැවති බව පසක් වේ. යූපය හින්දු ආගමික විශ්වාස මත පසුකාලීන ව බෞද්ධ ස්තූපයන්ට එක් කොට තිබේ. ඉන්දියාවේ යූපය සහිත ස්තූප සම්ප්‍රදායක් වූ බවට දිව්‍යාවදානය කරුණු සපයයි. (Divyavadana 1886:244) වෛදික යාගයේදී ප්‍රධානත්වයක් ගැනෙන යූපය මහාපුරුෂ හෙවත් බ්‍රහ්මන් සංකේතවත් කරන්නකි. එබැවින් මහාපුරුෂයකු වශයෙන් හඳුන්වනු ලබන බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතු තැන්පත් කර ඇති ස්තූපය බෞද්ධ මහාපුරුෂ සංකල්පය සංකේතවත් කෙරෙන බව විශ්වාස කෙරේ.(වික්‍රමගමගේ 2010:60-61)



ස්තූපයක යූපය පිහිටි පිහිටීම




අඹගස්වැව ස්තූපයේ යූපය රඳවා ඇති අකාරය

යූපය ගැන මහාවංසයේ පළමුවරට සඳහන් වන්නේ දුටුගැමුණු රජුගේ (ක්‍රි.පූ.161-137) මහාථූපය පිළිබඳ කථා පුවතේදී ය. මහාථූපය පිහිටුවන භූමියෙහි පිහිටුවන ලද ශිලා යූපය දැක මෙම සිදුවීමේ අතීතය පිළිබඳ මෙනෙහි කළ රජු මෙම ස්තම්භය දෙවනපෑතිස් රජු කල (ක්‍රි.පූ.250-210) මිහිඳු හිමියන්ගේ උපදෙස් අනුව අනාගතයේ මෙම ස්ථානයේ තමන් විසින් ස්තූපයක් පිහිටුවන බවට සලකුණු කරන ලද්දක් බව සිහිකැඳවීය. වංසකථාකරු දෙවනපෑතිස් රජු කල සිටුවන ලද්දේ ශිලාස්තම්භයක් ලෙස දැක්වුවත් දුටුගැමුණු රජු කල එයම ශිලායූපයක් බවට නොපැකිලි ව කරුණු ඉදිරිපත් කරයි. (මහාවංසය 15:173,28:2) නමුත් එය එසේ සිදුවූයේ කුමක් නිසාදැයි පැහැදිලි නැත. ටීකාව ශිලායූපය සර්වඥධාතු නිදන් කර තනන ලද ශිලාස්තම්භයක් බව අවධාරණය කරයි. (මහාවංසටීකාව 1994:404) ටීකාකරු ශිලා යූපයට ධාතුන්වහන්සේලා සම්බන්ධ කිරීමෙන් ඊට ගෞරවයක් ලබා දීමට උත්සාහ ගෙන ඇති බව පෙනේ. එහෙත් යූපයේ ධාතුන් තැන්පත් කළ බවට සාධක හමුවී නැතිබව විශ්වාස ය. වංසකථාකරු සඳහන් කරන ශිලා යූපය දුටුගැමුණු රජු විසින් පහකරවා ස්තූපයේ පදනම සැකසීමට කටයුතු යෙදීය. එම ශිලා යූපය ස්තූපය සඳහා යොදා නොගත් බව පසුව ස්තූපයේ උපරිභාගය ඉදිකිරීමේදී යූප භාවිතයක් ගැන සඳහන් නොවන කථා පුවතෙන් වැටහී යනු ඇත. එහෙත් වංසකථාකරු යූපය ස්තූපයේ වැදගත් අංගයක් බව දන්නා නිසාවෙන් දෙවනපෑතිස් රජ සමයේ පිහිටවූ ශිලා ස්තම්භය දුටුගැමුණු රජ සමයේදී ශිලා යූපයක් යැයි සඳහන් කළ බව හැඟේ. දෙවනපෑතිස් රජු අනාගතයේ මහාථූපය ඉදිකරන බවට සංකේතයක් ලෙස පිහිටවනු ලැබූ ශෛලමය ස්තම්භය අනතුරුව මිනිසුන් විසින් පූජාර්ථයෙන් වැඳුම් පිදුම් කරන්නට ඇත. එහෙයින් භාරතයේ වන්දනාමාන වූ "චෛත්‍ය යූප" අර්ථයෙන් පූජාවස්තුවක් ලෙස සලකා ශිලා ස්තම්භය සමකාලීන ජනයා අතර ගෞරවයට පාත්‍ර වන්නට ඇත. එමනිසා ශිලා ස්තම්භය ශිලා යූපයක් ලෙස





ගෙන වංසකථාකරු මහාථූපයට ගෞරවයක් ලබා දීමට කටයුතු කර ඇතැයි විශ්වාස කළ හැකිය. එහෙත් මේ පිළිබඳව තවදුරටත් විමසිය යුතුය. යූපය හෙවත් ගජස්තම්භය මුල්කාලීන ව නිමවා ඇත්තේ ලීයෙනි. මේ සඳහා තෝරාගත් වෘක්ෂ අතර බක්මී, මී, කිහිරි, කුඹුක්, කොහොඹ වැනි ශාක ප්‍රධාන වේ. මෙම දාරුමය ගජස්තම්භයේ ස්වරූපය පශ්චාත්කාලීන ශෛලමය යූපයට හාත්පසින්ම සමාන වේ. යූපය ප්‍රමාණාත්මකව වර්ග තුනකට වෙන් කොට ඇත. එහි දී දීර්ඝතම ගජස්තම්භය 'උත්තම' යනුවෙන් ද මධ්‍යම ප්‍රමාණයේ ගජස්තම්භය 'මධ්‍යම' හා ඉන් කුඩා ප්‍රමාණයේ ගජස්තම්භය 'අවම' ලෙස ගෙන ඇත.(මාරසිංහ 1993:liv) මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ග්‍රන්ථයෙහි ඉහත යූපයන්ගේ ප්‍රමාණ පිළිවෙළින් රියන් 39 1/2, 36 1/2, සහ 30 1/2 ලෙස දක්වා ඇතත් එම ප්‍රමාණ සම්මතයන් සේ ගෙන මෙරට භාවිත වූ බවට නම් තොරතුරු දුර්ලභය. කෙසේ වෙතත් ස්තූපයන්ගේ ප්‍රමාණයට සාපේක්ෂව යූපයේ ප්‍රමාණය තීරණය වූ බව නම් පැහැදිලි වේ.

මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ග්‍රන්ථයට අනුව යූපය පිහිටවූයේ රත්නාසය (රුවන් තැන්පතුව) හෙවත් යන්ත්‍රගලෙහි පියන මත සවි වූ කීලයකට ය. (රත්නාසය උපරිතම ගර්භයට ඉහළින් ධාතු කරඬුවට සමීප ව තැන්පත් කරන ලදැයි සිතිය හැක. බෙල් මහතා තෝපා වැව දාගැබ කණින අවස්ථාවේ දාගැබ තුළ වූ ධාතු ගර්භයේ ගල් පියන මත ඇද වැටී තිබුණු අටපට්ටම් ගල් කුලුනක් විය.(ASCAR 1909:28) එහෙත් මේ පිළිබඳ තවදුරටත් විමසිය යුතුය. යූපයේ මූලය හෙවත් සතරැස් කොටස මධ්‍යයෙහි අඟල් තුන හමාරක විෂ්කම්භයකින් යුත් කුහරයකට එම කීලය පුරුද්දයි. මෙසේ විස්තර වන විශේෂතා වර්තමානයේ අපට හමුවන ශිලාමය යූප තුළ දැකිය නොහැකි ය. යූපයේ මූලය සතරැස් ස්වරූපයක් මෙන් ම නිමා නොකළ පෘෂ්ඨයකින් සමන්විත වේ. ගර්භයට හෝ රත්නාසයට සවිකිරීමට හැකි කුහරයක් වැනි දෙයක් එහි විද්‍යාමාන නොවේ. දැව යූපය භාවිත වන අවධියේ එහි ස්ථිරත්වයට ඉහත කී තාක්ෂණික පිරිද්දීම අවශ්‍ය වුවත් පසුකාලීන ව ශිලා භාවිතයත් සමග උපකීලයක් මත රැඳවීමේ අවශ්‍යතාව නැතිවෙන්නට ඇත. යූපයේ මුල කොටස සතරැස් හැඩයකින් යුක්ත නිසා ගර්භය තුළ නොසෙල්වී රැඳවීමට හැකියාවක් එමගින් ඇති වේ. මුල් යූපය දැවයෙන් නිර්මාණය වීමත් දැනට ඒ පිළිබඳ සාධක නොමැතිවීමත් හේතුකොට යූපයේ ඉපැරණි ස්වභාවය පිළිබඳ පැහැදිලි අදහසක් ඉදිරිපත් කිරීම පහසු නොවේ.

ශිලා යූපය ගර්භයට සවිකිරීමේදී කුමන තාක්ෂණික ක්‍රමවේදයක් අනුගමනය කළේ ද යන්නට සාධක දුලබ ය. මෙරට ස්තූප නිදන් හොරුන් විනාශ කිරීම ඊට ප්‍රධාන හේතුව වේ. ඊට අමතර ව ස්තූප වරින් වර ප්‍රතිසංස්කරණය කිරීම ද පැරණි සාධක සැඟවීමට හේතු වී ඇත. වර්තමානයේ යූපය නිරුපද්‍රැත ව ඇති අඹගස්වැව ස්තූපයේ යූපය පරීක්ෂා කිරීමේ දී එය රැඳවීමේ පිළිවෙළ පිළිබඳ කිසියම් අදහසක් ලබා ගැනීමට හැකි ය. එහි මූලය හෙවත් සතරැස් කොටස මෙන් ම ඊට ඉහළින් වූ අටපට්ටම් වූ කොටසෙන් යම් ප්‍රමාණයක් ද ස්තූපයේ උපරිභාගයේ වැළලී තිබිණ. මීටර් 1 ක් පමණ කොටසක් ගර්භයෙන් ඉහළට මතුවී ඇත. වර්තමානයේ උපරිභාගයේ හර්මිකාවක සාධක දැකිය නොහැකි හෙයින් මීටරයටත් වඩා අඩු ප්‍රමාණයක් යූපය ස්තූපයෙන් ඉහළට එසවී තිබිණැයි නිගමනය කළ හැකි ය. යූපයේ පාමුල සිට ම ඒ වටා වෘත්තාකාර ලෙස ක්‍රමානුකූල ව ඉහළට ගඩොල් අතුරමින් එය රඳවා තබා ශක්තිමත් කිරීමට තත්කාලීන වාස්තු විද්‍යාඥයන් කටයුතු කර ඇත. කුඩා දාගැබ්වල යූපය එහි මුදුනත සවිකිරීම එතරම් අපහසු නොවුණත් විශාල දැගැබ්වල විශාල යූප සවිකිරීම සඳහා විශේෂ ලීවර ක්‍රමයක් භාවිත කරන්නට ඇත. එහෙත් ඒ පිළිබඳ අදහසක් මූලාශ්‍රය සාධක මගින් අනාවරණය වී නැත.

මුල් ස්වරූපයෙන් ස්තූපයක යූපගල නිරුපද්‍රැත ව දැකිය හැකි වීම දුර්ලභ කරුණකි. අභයගිරිය, මිරිසවැටිය, දක්ඛිණ ථූපය, කණ්ඨක ථූපය ආදී විශාල ස්තූපවල මෙන් ම පුවරසන්කුලම, හඳගල, ඇළපත්තෑව, ආදි ග්‍රාමීය කුඩා ස්තූපවල මළුව මත වැටී කැඩී වෙන්වී ගිය යූපගල් අදටත් දැකිය හැකි ය. එසේ ම බොහෝ විහාරස්ථානවල යූපගල් සාමාන්‍ය ගල් කණුවක් යන අර්ථයෙන් ගෙන විහාර පරිශ්‍රයේ සිටුවා ඇත. කෙසේ නමුත් ඒවා පෙර තිබූ අයුරින් අපට අද දැකගත නොහැකි ය. පාරිසරික හේතු මෙන් ම නිදන් හොරුන්ගේ නොමනා ක්‍රියාවන් හේතු කොට විනාශ ව ඇති යූපයන්ගේ ප්‍රමාණය බොහෝය. පරණවිතාන මහතා තම දර්ශනසූරී උපාධි නිබන්ධයේ ද මෙබඳු ගල් කණුවක් පෙර පිහිටුවා තිබූ අකාරයෙන් ම දැකිය නොහැකි වීම අභාග්‍යයක් බව සඳහන් කර ඇත.(පරණවිතාන 1997:29) එච්. සිරිසෝම මහතා උතුරු නැගෙනහිර දිසාවන් අළලා සිදුකළ පර්යේෂණයකදී වව්නියාව දිස්ත්‍රික්කයේ නෙලුම්කුලම, කුම්භකර්ණාමලය හා ඊරට්පෙරියකුලම යන ස්ථානවල යූප සහිත දාගැබ් ගොඩැලි දක්නට ලැබුණු බව වාර්තා කර ඇත. (සිරිසෝම—:34-37) අපගේ ගවේෂණයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ





නොච්චියාගම අඹගස්වැව ග්‍රාමයේ දාගැබ මත පිහිටුවා තිබූ යූපය පෙර පිහිටි ආකාරයෙන් ම දැකගත හැකිවිය. 1896 පුරාවිද්‍යා පාලන වාර්තාවට අනුව මෙම දැගැබ එම සමයේදී ගරාවැටී තිබී ඇතත් එය නිදන් හොරුන් හාරා තිබී නැත. පාලන වාර්තාවේ ඉතා පැහැදිලි_ව දැගැබ මත වූ මෙම අංගය පිළිබඳ_ව වාර්තා කර ඇති අතර එහි හානියක් පිළිබඳ සඳහන් කොට නැත. (ASCAR1896:5) එබැවින් ඉහත සාධකය යූපය පිළිබඳ අවබෝධ කරගැනීමට ප්‍රමාණවත් වේ. මේ පිළිබඳ හොඳින් අවබෝධ කරගැනීමට පැරණි ස්තූප තුළ තැන්පත් කර හමු වූ ධාතු කරඬු අධ්‍යයනය ද ඉතා වැදගත් වේ.



අභයගිරි ස්තූප මළුවේ
වැටී ඇති යූප ගලක මුදුනත කොටස



අභයගිරිය ථූපයේ විනාශ වී
ගිය යූප ගලෙහි කොටස්



නීලගිරි දාගැබේ
යූප ගලක මුදුනත කොටස



හඳගල ස්තූපය මත ඇති
යූප ගලෙහි පහත කොටස

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතාගේ අදහස වන්නේ සර්වාස්තිවාදය හෙවත් මහායානය ඔස්සේ යූපය ශ්‍රී ලංකාවේ ස්තූපාංගයක්

වසයෙන් හඳුන්වා දී ඇති බව යි. එතුමාට අනුව යූපය භාවිත වී ඇත්තේ අභයගිරි නිකායික ස්තූපවල පමණි. එහෙත් මෙම මතය එලෙස ම පිළිගැනීමට අපට හැකියාවක් නැත. රුවන්වැලි සෑ පරිවාර ස්තූපවල ද යූපයන් භාවිත වූ බවට සාධක ඇත.(Smither: 1894:40) තවදුරටත් කරුණු ගෙනහැර දක්වන ඔහු ක්‍රි.ව. 2 වැනි ශතවර්ෂයේ සිට ශතවර්ෂ කිහිපයක් යනතුරු මෙරට ස්තූපවල යූපය භාවිත වී ඉන්පසු ස්තූපයෙන් එම අංගය ඉවත් වූ බව පවසයි. එසේ වීමට ප්‍රධාන හේතුව ශ්‍රී ලංකාවේ මහාවිහාරයට හිමි විභජ්ජවාදී සම්ප්‍රදායයට අයත් ස්තූපවල අංගයක් වශයෙන් යූපය පිළිගෙන නොතිබීම විය හැකි බව ඔහු පැහැදිලි කරයි. (වික්‍රමගමගේ 2010:61-62) යූපය භාවිතයට පැමිණයේ ක්‍රි.ව. 2 වැනි සියවසේ බවට ඔහු දක්වන අදහස පිළිබඳව නැවත විමසිය යුත්තකි. යූපය මුල්කාලීන ව දැවයෙන් නිර්මාණය කර තිබීම නිසා එම අවශේෂ විනාශවී යාමේ හැකියාව අධික ය. එම නිසා මුල්කාලීන ස්තූපවල එම අංගය භාවිත නොකළ බව කීම සාධාරණ නැත. ක්‍රිස්තු වර්ෂ මුල් සමය නියෝජනය කරන සෑම ග්‍රාමීය ස්තූපයන්ගේ ම ඉහත සාධකය දැකිය හැකි වීම සාමාන්‍ය දෙයකි. ඉපැරණි ස්තූපාංගයක් ලෙස යූපය මුල්කාලීන ව දැවයෙන් නිර්මාණය කළ ද පාෂාණ භාවිතයට පැමිණි පසු දිගුකල් පැවැත්ම සඳහා පාෂාණ භාවිත කොට යූපය නිමවන්නට ඇත. දැලිවල කොටවෙහෙරෙන් හමුවුණු ක්‍රි.පූ 1 සියවසට ගැනෙන රන් ධාතු කරඬුව මෙන් ම තවත් ලෝහ හා පලිඟු කරඬු හා ක්‍රි.ව. 1 සියවසට අයත් ලාහුගලින් හමුවූ ධාතු කරඬුව පරීක්ෂා කළ විට යූපය මුල්කාලීන ස්තූපයන් සඳහා යොදාගෙන ඇති බව පැහැදිලි වේ.(Shoeder 1990:62)



දැලිවල රන් කරඬුව
ක්‍රි.පූ1 - ක්‍රි.ව.2



ලාහුගල රන් කරඬුව
ක්‍රි.ව 1 - ක්‍රි.ව.2











දැලිවල ස්තූපයෙන් හමුවූ කරඬු

අනුරාධපුර රුන්වැලි සෑ සලපතළ මළුවේ බිම පතිත ව තිබූ යූපගලක සටහන් ව තිබූ බුද්ධදාස රාජ්‍ය කාලයට (ක්‍රි.ව.337-365) අයත් ශිලා ලිපියක දැක්වෙන ''කරවික ටබි'' යන පාඨය ගෙන යූපය පිළිබඳ ව නව අදහසක් මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි මහතා ඉදිරිපත් කරයි. ''මෙම ඉන්දියානු සාධක දෙස බලා පරණවිතාන මහත්මා ලංකාවේ දාගැබ්වලට සම්බන්ධ මෙම පූජනීය වස්තුව යූප වසයෙන් හැඳින්වීම අයෝග්‍ය යැයි හැඟේ. ඔහු සඳහන් කරන්නේ ලක්දිව බෞද්ධ ග්‍රන්ථයන්හි යූපයන් ගැන කිසිවක් සඳහන් නොවේ යනුවෙනි. එපමණක් නොව මෙතෙක් හමුව ඇති කිසිදු ශිලා ලේඛනයක යූප යන වචනය හමු නොවීම ද සැලකිල්ලට ගත යුත්තකි. අනෙක් අතින් අවිහිංසාව ගරු කරන බෞද්ධයන් සතුන් බිලි දෙන යාගස්තම්භයක් එම අර්ථයෙන් ගෙන හෝ ආභාසය ගෙන පූජනීයත්වයට පත් දාගැබ මත පිහිටුවා එය යූපස්තම්භය වශයෙන් හැඳින්වූවා යැයි සිතිය නොහැකි ය. ඒ අනුව පරණවිතාන මහත්මා විසින් යූපස්තම්භය යනුවෙන් හඳුන්වනු ලබන පූජනීය වස්තුව 'කරවිඩක' හෝ 'කරවික ටැඹ' යනුවෙන් හැඳින්වීම යෝග්‍ය බැව් සඳහන් කළ හැකිය'' (හෙට්ටිආරච්චි 2007:51)

ඉහත දක්වන ලද ශිලා ලිපිය පිළිබඳ එච්.සී.පී.බෙල්, ඒ.එම්.හෝකාර්ට් මෙන් ම පරණවිතාන මහතා ද අවධානය යොමු කර ඇතත් සම්පූර්ණ ලිපිය ඉහත දැක්වූ කිසිවකුට හමු නොවී ඇත. මෙම ශිලා ලේඛනය රුවන්වැලි ස්තූප මළුවේ බටහිර හා දකුණු ආයක (Altars) අතර පිහිටි කුඩා ආදර්ශක චෛත්‍යයට නුදුරින් වූ සුන්බුන් අතර කොටස් දෙකක් ලෙස තිබී පරණවිතාන මහතාට හමුවී ඇත. නමුත් එහි පාදම (Base) සහ මුදුනත (Capital) හමුනොවුණු බවත් එය ඉතා මෘදු මතුපිටකින් සමන්විත සිටුවන ලද ස්තම්භයක් විය හැකි බවත් වාර්තා කරයි. එම විනාශ වූ කොටස් දෙක එකට

ගත් විට දිගින් අඩි 4යි අඟල් 6 ක් ද අක්ෂර ලියූ මුහුණතක පළල අඟල් 10 ක් පමණ වේ.(Paranavitana 1933:120) පරණවිතාන මහතා ඇතුළු පිරිසට ශිලා ලේඛනයෙන් කොටසක් හමුවීම නිසා ඒ පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් කිරීමේ අවකාශය මඟ හැරී ඇත. නමුත් 2004 වර්ෂයේ රුවන්වැලිසෑ වැලිමළුව ප්‍රතිසංස්කරණය කිරීමේදී එම ශිලා ලිපියේ ඉතිරි කොටස ද පුරාවිද්‍යා නිලධාරීන්ට හමුවී ඇති අතර අනතුරුව එය අධ්‍යයනය කිරීමට මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි මහතාට හැකිවිය.



රුවන්වැලි සලපතළ මළුවේ පිහිටි බුද්ධදාස රාජ්‍ය සමයට අයත් සෙල්ලිපිය

ඉහත ලිපියේ තෙවන පෙළෙහි 'ජිත කමලඅබ කරවික ටබි සවසතනට පෙත අනුමොවතු මපුරුමක හට වෙඪ' යන පාඨයේ අන්තර්ගත 'කරවික ටබි' යන වචන පිළිබඳ විග්‍රහයක යෙදෙන පරණවිතාන මහතා කරවි යන්න සංස්කෘත කාරාපිත හා ප්‍රාකෘත කාරව්‍ය යන අදහසට සමාන බැවින් ඊට "පිහිටුවන ලද ටැබ" යන්න අර්ථ දී ඇත. (Paranavitana 1933:122,125) මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි කාරාපිතක ශබ්දය ආශ්‍රයකොට ඊට "කරවන ලද ස්තම්භය" ලෙස අර්ථ දී ඇත. (විමලකිත්ති හිමි 1957:58) නමුත් හෙට්ටිආරච්චි මහතා 'කරවික ටබි' යන්නෙන් විශේෂ ස්තම්භයක් හැඟවෙන බව පවසයි. උක්ත ලිපිය ඇත්තේ ද ඔහු සඳහන් කරන පරිදි යූපයක පහත හතරැස් කොටසෙහි මුහුණතක ය. ලිපිය ලිවීම ආරම්භ කර ඇත්තේ අටපට්ටම් කොටස අවසානයේ සිට ය. එනම් සතරැස් කොටස ආරම්භවන ස්ථානයේ සිට පහළට ය. ඔහු සඳහන් කරන ආකාරයට භෞතික ස්වරූපය අනුව නම් යූපයක් බව පිළිගත හැකි ය.

ස්මිදර් මහතා රුවන්වැලිසෑ මළුවේ පිහිටි නටබුන් වූ කුඩා ස්තූප දෙකක් සහ ඒ මත සිරස් අතට සිටුවන ලද ගල් කණු දෙකක් පිළිබඳ වාර්තා





කරන අතර පරණවිතාන මහතා එම ගල් කණු දාගැබ්වල යූප ගල් බව අනුමාන කර ඇත. (Smither: 1894:40, පරණවිතාන 1997:29) නමුත් එම දාගැබ්වලට පසුව සිදුවූයේ කුමක්දැයි සඳහන් නොවන බැවින් පසුකාලීන සංරක්ෂණ කටයුතු නිසාවෙන් හෝ ස්වාභාවික විපත් හේතු කොට එම යූපගල් මළුව මතට එකතුවන්නට ඇත. හෙට්ටිආරච්චි මහතාගේ අදහස නම් ස්මිදර් මහතා වාර්තා කළ කුඩා ස්තූපයක තිබුණු යූපයක කොටසක මෙම ශිලා ලිපිය අන්තර්ගතවූ බවයි. (හෙට්ටිආරච්චි 2007:49-50)

පාකර් මහතා පැරණි ලංකාව නැමැති කෘතියේ තිස්සමහාරාමයේ මහානාග නම් වූ දාගැබක් ප්‍රතිසංස්කරණයට පෙර තිබූ ආකාරය ප්‍රකාශයට පත් කර ඇති අතර එහි කොතට උඩින් නෙරා ගිය ගල් කණුවක මුදුනක් දැකගත හැකිව තිබුණ. (පාකර් 2008:398) එසේ ම මෙම චෛත්‍යය තුළ තිබී හමු වූ ඉලනාග රජුගේ (ක්‍රි.ව.33-43) සෙල්ලිපියක් ආචාර්ය එඩ්වඩ් මුලර් ප්‍රකාශයට පත්කර ඇත. නමුත් දාගැබ ප්‍රතිසංස්කරණය කිරීමේදී සෙල්ලිපිය තිබූ ගල් කණුව වැළලෙන්නට ඇතැයි මුලර් සඳහන් කරයි. (Muller 1883:26) බොහෝවිට සෙල්ලිපිය පිහිටන්නට පාකර් මහතාගේ චිත්‍ර සටහනෙහි ඇති කොතට උඩින් නෙරාගිය ගල් කුලුනේ විය හැකි ය. එබැවින් ඒ පිළිබඳ වැඩි තොරතුරක් සඳහන් නොකිරීම අභාග්‍යයක් බව පරණවිතාන මහතා අවධාරණය කරයි. (පරණවිතාන 1997:29) එබැවින් අපගේ විග්‍රහයට බඳුන් ව ඇති රුවන්වැලිසෑයේ පිහිටි ලිපිය ද එවැන්නක් විය හැකියැයි අනුමාන කළ හැකි ය.

කෙසේ වෙතත් රුවන්වැලිසෑ ලිපියේ සඳහන් රජවරුන්ගේ නාමයන් මෙන් ම පුද්ගලයන්ගේ නාමයන් පිළිබඳ ව සැලකීමේදීත් ටැඹෙහි නිර්මාණ ලක්ෂණ දෙස අවධානය යොමු කිරීමේදීත් සරල ගල් ටැඹක් නොවන බව හෙට්ටිආරච්චි මහතාගේ අදහස යි. එසේ ම ටැඹ කිරීමෙන් අත්පත්වන පින සියලු සත්ත්වයන්ට අනුමෝදන් කිරීම මෙන් ම රජුට යහපත ප්‍රාර්ථනා කිරීම තුළින් ද මෙය බලගතු පින්කමක් බව අවබෝධ වන බව තවදුරටත් ඔහු පැහැදිලි කරයි. (හෙට්ටිආරච්චි 2007:51) මෙම කරුණු යූපයක් බව සනාථ කිරීමට තවදුරටත් රුකුල් දීමකි.

යූපයේ හතරැස් කොටසේ මෙම ලේඛනය පිහිටුවා ඇති බවට ඔහු සඳහන් කිරීම විමසිය යුත්තකි. යූපයේ මූලය හෙවත් සතරැස් කොටස ස්තූපයේ ගිලී පවතින බව මෙතක් සිදුකරන ලද අධ්‍යයනයන්හීදී පැහැදිලි ව අවබෝධ වූවකි. එසේනම්, ශිලාලේඛනයේ සන්නිවේදනාර්ථය පිළිබඳ

පිහිටුවන ලද පිරිස විසින් අපේක්ෂා නොකළා ද යන්න ගැටළුවකි. නමුත් යූපය වැනි ස්තම්භයක් ස්තූපයක පිහිටුවීමේදී උත්සවාකාරයෙන් එය සිදුකරන බැවින් දායකත්වයට අදාළ සන්නිවේදනය පිළිබඳ ගැටලුවක් ඇති නොවන බව ද පෙනේ.

තවදුරටත් මේ පිළිබඳ විග්‍රහ කිරීමේදී ඉළනාග රජුට අයත් වෙස්සගිරි ලිපියෙන් ද කිසියම් පිටිවහලක් ලබා ගත හැකි බව පෙනේ. (Paranavithana 1983:50) එහි සඳහන් ''මහනකරජ ඉසිරමණ පිතණික චෙතෙහි කරවිඩක කොටවය චත අරුවය ''යන කණ්ඩයට පරණවිතාන මහතා අර්ථ සපයා ඇත්තේ මහානාග රජු ඉසිරමණයේ පිතණික නැමැති චෛත්‍යයේ කොත් කැරැල්ල කරවා ඡත්‍ර නංවා යනුවෙනි. මෙහි 'කරවිඩක' යන්න කොත්කැරැල්ල අර්ථවත් කර ඇත. කොත් කැරැල්ල ඇතිවූයේ ඡත්‍රාවලිය වෙනුවට බැවින් කොත් කැරලි කරවා ඡත්‍ර නැංවීම ප්‍රායෝගික ක්‍රියාවක් නොවන බව මේ පිළිබඳ විග්‍රහයක යෙදෙන මහාචාර්ය කුලතුංග පෙන්වා දෙයි. (කුලතුංග 2004:46) කරවිඩක, කාරාපිණ්ඩය ආදී වචන කොත්කැරැල්ල සඳහා යෙදුණු බවට ඇති මත ද මේ වන තෙක් විවාද සහගත ය. එබැවින් මෙහි සඳහන් කරවිඩක මෙන් ම රුවන්වැලියේ යූපයේ ඇති 'කරවික ටබි' යන්නෙන් යූපය හැඟවෙන බව පෙනේ. යූපය සවිකර ඊට ඉහළින් ඡත්‍ර නංවන ලද බව දැලිවල කොටවෙහෙර ධාතු කරඬුවෙන් පැහැදිලි වේ. එබැවින් 'කරවික ටබි' හෝ 'කරවිඩක' යනු සුවිශේෂ ස්තූපාංගයක් බව අවබෝධ වේ.

සංස්කෘත භාෂාවේ 'කර' යන්න අලියාගේ හොඬය (Elephant's Trunk) යන්න අර්ථගන්වා ඇත. හොඬයක් ඇත්තේ යමෙක් ද ඔහු 'කරීන්' ලෙස අදහස් කෙරේ.(Williams 1899:253-254) යූපයේ ස්වරූපයත් අලියකුගේ හොඬයට සමාන ය. එසේ ම ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි ''විටංක'' යන වචනය සඳහා ලබාදී ඇති අර්ථය වන්නේ ''උස්මුදුන, කොත'' යන්න ය. විටංක යන්න විඩක ලෙස ට>ඩ වී ව්‍යවහාරව පැවත එන්නට ඇතැයි සිතිය හැකිය. ටබි යන්න සංස්කෘතයේ ස්තම්භ යන්නෙන් ද පාලියේ ථම්භ යන්නෙන් ද බිඳී ආ බවට ගැටලුවක් නොමැත. එබැවින් 'කරවික ටබි' යන්නෙන් මුදුනත පිහිටි ගජස්තම්භයක් යන අදහස ගම්‍යමානවන බව අවබෝධ වේ. මෙලෙස ක්‍රිස්තු පූර්ව යුගයේ සිට මෙරට දාගැබ්වල පිහිටුවනු ලැබූ යූපය හෙවත් ගජස්තම්භය ඉපැරණි ස්තූපවල වාස්තුවිද්‍යාත්මක අංග විමසීමේදී අධ්‍යයනය කළ යුතු සාධකයක් බව සඳහන් කරමු.





## සමාලෝචනය

යූපස්තම්භය මෙරට ඉපැරණි ස්තූපවල හර්මිකාව මධ්‍යයේ උඩට නෙරා සිටින සේ තැන්පත් කර තිබූ සුවිශේෂ අංගයකි. භාරතීය අභාසය ලද එම අංගය ශ්‍රී ලංකාවේ යාග පිදීමේ අර්ථයෙන් භාවිත නොවුණු අතර බුදුන්වහන්සේගේ මහාපුරුෂත්වය සංකේතවත් කිරීමේ අටියෙන් යොදා ගැනුණි. ක්‍රිස්තු පූර්ව යුගයේ සිට දාගැබ් සඳහා භාවිත වූ මෙම අංගය ක්‍රිස්තු වර්ෂයෙන් සියවස් හතරක පමණ කාලයක් තුළ භාවිත වී අභාවයට යන්නට ඇත. පූජාර්ථයෙන් සිටුවන ලද මෙය මුල්කාලීන ව දැවයෙන් නිර්මාණය කළත් පසුකාලීන ව ස්ථිරත්වය නැමැති සාධකය හේතුකොට ගලින් නිමවන්නට විය. යූපය දාගැබේ වටිනා අංගයක් බැවින් එහි ලේඛන ද පිහිටවීය. බුද්ධදාස රජුට අයත් රුවන්වැලිසෑ ලිපිය සහ ඉළනාග රජුට අයත් වෙස්සගිරි ලිපියේ 'කරවිඩක ටබි' හා 'කරවිඩක' යන වචන යූපය යන්නට සමානාර්ථයේ යෙදෙන බව මහාචාර්ය හෙට්ටිආරච්චි මහතා අදහස් කරයි. සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය අධ්‍යයනයේදී උක්ත මතය තුළ නවමු අදහසක් මෙන් ම නිවැරදි අර්ථයක් ගැබ්වන බව අපගේ හැඟීම යි. පසුකාලීන ව ස්තූපයේ සංවර්ධනයත් සමග උපරිභාගයේ ඇති වූ වෙනස්වීම් හේතුකොට යූපය ස්තූපයෙන් ඉවත් වූ අතර ඊට සුරකෝෂ්ඨ හෙවත් දේවතා කොටුව එක්විණි. එසේ වුවත් යූපයේ මූලික අදහස ඒ තුළ අඩංගු වූ බව දේවතා කොටුවේ ස්තූපය ආරක්ෂා කරන දෙවිවරුන් සංක්තවත් කරන අෂ්ටදිග් පාලක දෙවිවරුන්ගේ රූප නිර්මාණ කිරීමෙන් පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- දීපවංශය, 1970, (පරි). කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ 11
- මහාවංශය ප්‍රථම භාගය, 1959, (පරි), ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
- මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර, 1993, සංස්.වෝල්ටර් මාරසිංහ, පියසිරි ප්‍රින්ටර්ස්, නුගේගොඩ
- වංසත්ථප්පකාසිනී, 1994, (පරි) අකුරැටියේ අමරවංස නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක, පාලි බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය
- කුලතුංග.ටී.ජී.2004, ලංකාවේ ස්තූපය, තරංජි ප්‍රින්ට්ස්, මහරගම
- පරණවිතාන, එස්. 1997, ලංකාවේ ස්තූපය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- පාකර් හෙන්රි, 2008, පුරාණ ලංකාව (පරි) නිස්සංක පෙරේරා, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන
- රසවාහිනී 1993, සංස්. සිරි තිලකසිරි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ 10
- වික්‍රමගමගේ චන්ද්‍රා, 2010, ස්තූප, තරංජි ප්‍රින්ට්ස්, මහරගම
- විමලකිත්ති හිමි මැදඋයන්ගොඩ, 1957, ශිලා ලේඛන සංග්‍රහය 4 වන කොටස
- විමලඤාණ හිමි වල්පොල, 1988, ස්තූප සංකල්පය, කල්‍යාණිගංගාරාම ග්‍රන්ථමාලා 1, ස්තූප පුරාණය, සංබ මුද්‍රණායතනය, කොළඹ
- සිරිසෝම එම්.එච්., උතුරු නැගෙනහිර පෙදෙස්හි හෙළ උරුමය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ,කොළඹ
- හෙට්ටිආරච්චි කරුණාසේන,2007, දාගැබ් ඉතිහාසය වෙනස් කළ සෙල්ලිපියක්, බෙල්ලන්විල ශ්‍රී බෝධිරාජ දහම් පාසල ස්වර්ණ ජයන්ති සමරු කලාපය, ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්, දෙහිවල
- ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, වැලිවිටියේ සෝරත හිමි, 1999, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ
- Bell H.C.P., 1909, **Archaeological Survey of Ceylon**, Government Printed
- Cowell.E.B. & Neal.R.A. (eds) 1886, **Divyavadana**, Cambridge University press
- Mullar E. 1883, **Ancient Inscriptions in Ceylon**, London
- Paranavithana.S.1933, **Epigraphia Zeylanica**, Vol.III, Oxford University Press
- Paranavithana.S.1983 **Inscriptions of Ceylon** Vol.II, Part I, Government Printing Ceylon
- **Ramayanaya**
- **Rigveda**
- Smither, J.G 1894, **Architectural Remains Anuradapura Ceylon**, Ceylon Government
- Shoeder Von Ulrich, 1990, **Buddhist Sculptures of Sri Lanka**, Visual Drama Publication, Hong Kong.
- Williams, Monier (ed) 1899. **A Sanskrite-English Dictionary**, Delhi




04



# වන්නි හත්පත්තුව හා බැද්දි සංස්කෘතිය


**එන්.එම්. පවිත්‍රා මුතුමාලි නාරායණ**
ශාස්ත්‍රවේදී (ගෞරව)
නිබන්ධක
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
muthumali.pavithra@gmail.com

සිංහල සංස්කෘතියේ අනන්‍යතාව පිළිබිඹු කරන්නා වූ සංකේතයක් ලෙසින් වැව හැඳින්විය හැකි ය. සිංහල භාෂාවේ ව්‍යාවහාර වන වැව යන වචනය පාලි හා සංස්කෘත "වාපි" යන්නෙන් බිඳී ආ වදනකි. එය පැරණි සෙල්ලිපිවල 'වාපි' හෝ 'වැවි' යනුවෙන් යෙදී තිබේ. ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ 'වාපි' යන වදනයට අරුත් සපයා ඇත්තේ ජලාශ විශේෂය, වැව, වැවේ වේල්ල, වැව් බැම්ම ආදි වශයෙනි. වියළි කලාපයේ වැව් බොහෝමයක් දැකගත හැකි ය.

වන්නි හත්පත්තුව ස්වභාවයෙන් ම අධික උෂ්ණත්වයකින් යුතු වේ. මෙම වියළි ස්වභාවය නිසා සෑම ගමකට ම වැවක අවශ්‍යතාව මැනවින් දැනුණි. මෙහි අවුරුද්දේ වැඩි කාල සීමාවක් නියං තත්ත්වයක් පවතී. මේ හේතු කොට ගෙන ප්‍රදේශයේ ජනතාව වැව හා සමීප ව බැඳී සිටිති. වැවට ජලය පිරෙන අවස්ථාවේ සිට වැව සිඳී යන අවස්ථාව දක්වා ම විවිධ සිරිත්විරිත් වැව් ගමට අයත් ජනතාව ඉටු කරති. මේ ඔස්සේ විද්‍යමාන වන්නේ වැව් හා බැඳුණු ජන ජීවිතයේ ඇති සහජීවනය යි.

වැව්ගංකරේ ජනතාව කෙතරම් වැව හා බැඳී තිබුණේ ද යත් ඔවුන් වැවට දේවත්වයක් ද ආරෝපණය කර තිබේ. ඒ අනුව සිරිත් විරිත්, පූජාකර්ම, ඇදහිලි විශ්වාස ඒ වටා ඇති වී තිබෙන අයුරු පෙනේ. මෙම අධ්‍යාත්මය මඟින් අපට අපේ යැයි උරුම වී ඇති විශිෂ්ට සංස්කෘතියෙන් මතුවන ගැමිකම හා බැඳී ඇති වැව පිළිබඳ යටගියාව මොනවට පැහැදිලි වේ.

## වන්නි හත්පත්තුවේ ඓතිහාසික පසුබිම

සත්කෝරළය හෙවත් බත් කෝරළය නමින් විරුදාවලිය ලබන්නා වූ ප්‍රදේශය වයඹ පළාත නමින් වර්තමානයේ හඳුන්වයි. කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්ක දෙක මෙයට අයත් වේ. පුරාණයේ සිට ම කෘෂිකාර්මික ජීවන රටාවකට අනුව තම දිවි පෙවත රැකගත් ජනයාගෙන් යුක්ත වූ ප්‍රදේශයක් ලෙසින් මෙම ප්‍රදේශය හඳුන්වා දිය හැකි ය. පැරණි බෙදීම අනුව වයඹ පළාත





හත්පත්තු හතකින් යුක්ත විය. එසේ ම මෙම එක් එක් පත්තුව කෝරළ කීපයකින් ද, කෝරළයක් කුඩා පළාත් කීපයකින් ද සමන්විත වී තිබිණි. වයඹ පළාතට අයත් හත්පත්තු හත නම්,

- ❖ දෙමළ හත්පත්තුව
- ❖ වන්නි හත්පත්තුව
- ❖ දෙවමැදි හත්පත්තුව
- ❖ දඹදෙණි හත්පත්තුව
- ❖ වෑ උඩවිල්ලි හත්පත්තුව
- ❖ හිරියාල හත්පත්තුව
- ❖ කටුගම්පළ හත්පත්තුව වශයෙනි.

මේ හත්පත්තුවල පාලනය ගෙනයන ලද්දේ රටේ මහත්තයකු විසිනි. එම හත්පත්තුව ඇතුළත නැවත කෝරාළවරුන් යටතේ බෙදා දුන් කෝරළ ගණනාවක් විය. එම එක් කෝරළයක් නැවත ගම් වසම් කීපයකට බෙදා එක් වසමකට එක් ආරච්චි කෙනෙකු බැගින් පත් කර තිබුණි.

ඉපැරණි ශ්‍රී ලංකාවේ 'වන්නි' ප්‍රදේශය ලෙසින් හඳුන්වා ඇත්තේ ලංකාවේ උතුරු ප්‍රදේශය යි. එනම්, යාපනය අර්ධද්වීපය සහ අනුරාධපුරය අතර වූ විශාල ප්‍රදේශය එයට අයත් වී තිබේ. වන්නිය නමින් හැඳින් වූ ප්‍රදේශය සීමා වරින්වර වෙනස් වූ බැව් පෙනේ. වර්තමානයේ 'වන්නිය' නමින් හඳුන්වනු ලබන ප්‍රදේශයට ලංකාවේ උතුරු, වයඹ හා මධ්‍යම පළාත් ඇතුළත් වේ.

වර්තමාන ව්‍යවහාරයට අනුව කුරුණෑගල සහ පුත්තලම් දිස්ත්‍රික්කවල අතුරු කොටසත්, අනුරාධපුර දිස්ත්‍රික්කය සහ වන්නි දිස්ත්‍රික්කය ඇතුළත් උතුරුමැද ලංකාවේ විශාල ප්‍රදේශයක් 'වන්නිය' යන පදයෙන් පොදුවේ හඳුන්වනු ලැබේ.

## වන්නි හත්පත්තුවේ වාරි සංස්කෘතිය

වන්නි හත්පත්තුව, උසස් වාරි සංස්කෘතියකට හිමිකම් කියන්නා වූ පෙදෙසක් වන අතර එය දිගු ඉතිහාසයකට ද නෑකම් කියයි. වියළි කලාපයට හිමිකම් කියන්නා වූ වන්නි හත්පත්තුවේ ජනතාව ජල සම්පත හිඟ බැවින්

නිරතුරු ව ම පීඩා විඳිති. කලකට ලැබෙන වැසි දියෙන් පමණක් යැපෙමින් දුෂ්කර වූ දිවියක් ගත කරන වැව්ගම්වාසීන් නිරතුරු ව ම උත්සාහ කළේ මෙම ජල අභියෝගය ජය ගැනීමට ය. එහි ප්‍රතිඵලයක් ලෙසින් සෑම ගමක් ගමක් පාසා ම කුඩා කුඩා වැව් ඉදි කරනු ලැබී ය. ශ්‍රී ලංකා භූමියෙන් 70% පමණ අයත් වන්නේ වියළි කලාපයට ය. මෙම ප්‍රදේශවල ලැබෙන සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය වන්නේ අඟල් 50 - 100 අතර ප්‍රමාණයකි. ප්‍රධාන වශයෙන් වර්ෂා සමය මාස තුනකට සීමාවනු දැකිය හැකි ය. නොවැම්බර්, ජනවාරි අතරතුර ඊසාන දිග මෝසම් වර්ෂාවෙන් ලැබෙන්නේ ද අඩු වර්ෂාපතනයකි. මෙම හේතුව නිසා එක් කන්නයක දී වර්ෂාව ලැබීමත් දීර්ඝකාලීන නියං තත්ත්වයක් නිසා වන්නි හත්පත්තුවේ ජනතාව පානීය ජල අවශ්‍යතාව මෙන් ම ගොවිතැන් සඳහා ජලය එක් රැස් කරගැනීමේ දුෂ්කර කාර්යය ජය ගැනීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙසින් වන්නියේ වාරි සංස්කෘතිය ගොඩ නැගී තිබේ.

හස්තිශෛලපුර හෙවත් කුරුණෑගල ප්‍රදේශය දඹදෙණිය යුගයේ දේශපාලනික වශයෙන් වැදගත් කේන්ද්‍රස්ථානයකි. සිවුවන විජයබාහු රජු ක්‍රි.ව. 1270 - 1272 මෙම පුරය වටා ප්‍රාකාරයක් හා දිය අගලක් කරවා තිබේ. දෙවැනි බුවනෙකබාහු රජු (ක්‍රි.ව. 1292 - 1932) සිය අගනගරය බවට පත්කර ගත්තේ කුරුණෑගල යි. හතරවන පරාක්‍රමබාහු රජු ද (ක්‍රි.ව. 1300 - 1326) තම රාජ්‍යය ලෙස පත්කර ගත්තේ කුරුණෑගල ය. පරාක්‍රමබාහු රජු කෘෂිකාර්මික කටයුතු දියුණු කරලීමට උත්සාහයක් ගත් රජ කෙනෙකි. විශේෂයෙන් ම සත්කෝරළයේ පවතින දේශපාලනය කෙරෙහි අවධානය යොමු කරමින් වාරිමාර්ග තැනීමට රජු උත්සුක වූ බැව් පෙනේ. දැදුරු ඔය ස්ථාන තුනකින් හරස් කොට අමුණු බැඳ ගොවිතැනට අවශ්‍ය ජලය සපයා දීමට පියවර ගෙන තිබීමෙන් ම එය පැහැදිලි ය.

''අහසින් වැටෙන එකඳු දිය බිඳක් පවා මනුෂ්‍ය ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා නො යා යුතු ය.''

යන ප්‍රකාශය පරාක්‍රමබාහු රජු විසින් කරන ලද්දේ දැදුරු ඔය ආශ්‍රිත වාපි කර්මාන්තය ආරම්භ කරන විට දී ය.

සත්කෝරළය තුළ දැකිය හැකි විශාලතම වාරි පද්ධතිය එය වේ. වන්නි හත්පත්තුව තුළ ක්‍රමවත් වැව් ක්‍රමයක් පැවතී ඇත. එය වූ කලී මහසෙන් රජුගේ අවධිය දක්වා ගමන් කරයි. මහසෙන් රජු විසින් දැදුරු ඔය ආශ්‍රිත ව





'මහාගල්ලවාපි' නම් වූ විශාල වැවක් කරවන ලදී. නිකවැරටිය ආසන්නයේ පිහිටි මෙම පුරාණ වැව ලෙස හඳුනා ගැනේ. මාගල්ල වැව පළමු වන පරාක්‍රමබාහු රජු මාගල්ල වැව නැවත ප්‍රතිසංස්කරණය කර ඇති බව මහාවංසයේ දැක් වේ.

පරාක්‍රමබාහු රජු සමයේ දැදුරු ඔය ආශ්‍රිත ව ඉදි කළ අමුණු තුනකි. කොට්ට බද්ද, සූකර නිජ්ජර හා දොරදත්තික යනු ඒ අමුණු තුන යි. මින් සූකර නිජ්ජර අමුණ ඉදි කර ඇත්තේ මෙම මාගල්ල වැවට ජලය සැපයීමට බැව් මහාවංසයේ සඳහන් වේ. මෙය ඉදිකිරීමෙන් රජතුමාගේ පරමාර්ථය වී ඇත්තේ මාගල්ල වැවට ජලය සපයා ඒ දක්වා වූ ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය නගා සිටුවීම ය. වර්තමානයේ රිදී බැඳි ඇල්ල නමින් ව්‍යවහාර කෙරෙන්නේ මෙම සූක නිජ්ජ අමුණ යි. එසේ ම වන්නි හත්පත්තුවේ දක්නට ලැබෙන අනෙක් විශාල ම වැව වන්නේ දැදුරු ඔයට ඊසාන දෙසින් පිහිටා ඇති මහසෙන් රජු විසින් ඉදි කරනු ලැබූ හුළුගල්ල වැව යි. මෙය 'සුළුගලු' හෙවත් 'සුළුගුළුව වැව' ලෙස හඳුනා ගෙන ඇත. වංශකතාවේ සීරු වැව ලෙස හඳුනාගෙන ඇත්තේ මෙම වැව විය හැකි ය. ක්‍රි.පූ. 1 වන වියළි කලාපයේ සෑම ගමකට ම වැවක් තිබෙන්නට ඇති බව සී.ඩබ්. නිකල්ස් දක්වයි. ක්‍රි.පූ. යුගයෙහි සිට ක්‍රි.ව. 12 තෙක් ම වියළි කලාපය තුළ දියුණු වාරි සංවර්ධනයක් දක්නට ලැබීම එයට හේතු ලෙස ඔහු පවසයි.

පොළොන්නරු යුගයේ දී දක්ෂිණ දේශයෙහි කොටසක් ලෙසින් කුරුණෑගල දිස්ත්‍රික්කය ඇතුළත් ව තිබූ අතර පඬුවස්නුවර, යාපහුව, නිකවැරටිය ආදී ප්‍රදේශ වාරි සංවර්ධනයට බඳුන් කර ඇති බැව් මහාවංසයෙන් පෙනේ.

පරාක්‍රමබාහු රජු විසින් රට සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රතිසංස්කරණය කරනු ලැබූ වැව් 38ක් පිළිබඳ මහාවංසයේ සඳහන් වන අතර ඒ අතරින් වැව් රාශියක් ම පඬුවස්නුවර, නිකවැරටිය, යාපහුව සීමාවට අයත් ව තිබෙනු දැකිය හැකි ය.

මේ අනුව බලන කල රජ කල සිට වන්නි හත්පත්තුවට අයත් ප්‍රදේශයේහි වාපි සභ්‍යත්වය ක්‍රමානුකූල පදනමක් මත සකස් වී තිබූ බව පෙනී යයි.

කෘෂි ආර්ථිකයේ උල්පතක් බඳු වූ ප්‍රදේශයක් ලෙස වන්නි හත්පත්තුව හැඳින්විය හැකි ය. වැව ඇසුරින් ජීවත් වූ ගැමියා තුළ සමගිය, එකමුතුකම, අහිංසකත්වය, සහෝදරත්වය, ආගන්තුක සත්කාර යන ගුණයන් නිතැතින් ම පිහිටියේ ය.

මහා පරිමාණයේ වැව් ගණනාවක් නො තිබුණ ද මෙම ප්‍රදේශයේ ගමක් ගමක් පාසා කෘෂිකර්මාන්ත කටයුතු සඳහා වැව් පිහිටා තිබේ. වියළි දේශගුණයකට හිමිකම් කියන්නා වූ මෙම ප්‍රදේශයේ කෘෂිකාර්මික අවශ්‍යතා පමණක් නො ව ගැමියන්ගේ මූලික ම ජල අවශ්‍යතා සඳහා දියවර ලබා දුන්නේ මෙම වැව් පද්ධතිය යි. ඉතා ක්‍රමවත් ලෙසින් වන්නි හත්පත්තුව පුරා ම විහිදී පවත්නා වැව් පද්ධතිය නිසා වර්ෂාව නො ලැබෙන දීර්ඝ කාලය මුළුල්ලේ භූමිය මත ජලය ගබඩා කරගෙන පොළොවේ භූගත ජල මට්ටම මෙන් ම වායු ගෝලයේ උෂ්ණත්වය ඇතුළු පාරිසරික හා භෞතික ජල අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වී තිබේ. එසේ ම ගැමියන්ගේ ආහාර අවශ්‍යතා අතුරින් මත්ස්‍ය සම්පත, විවිධ පලා වර්ග, නෙළුම් අල, ඕලු බත්, ආදි විවිධ ආහාර ද්‍රව්‍ය නො අඩු ව වැවෙන් ලබාගත්තේ ය. වාපි සංස්කෘතිය ජන ජීවිතයේ සභ්‍යත්වය මනාව විවරණය කෙරේ. වැව හා බැඳුණු සිරිත් විරිත්, පූජාකර්ම, අභිචාර ඔස්සේ ඔවුන්ගේ කළගුණ සැලකීමේ උතුම් ගුණය විද්‍යමාන වේ. එමගින් ප්‍රත්‍යක්ෂ වන්නේ ප්‍රදේශීය ජනයා වැව තම දිවිය සේ සැලකූ ආකාරය යි. ඔවුන්ගේ මුවින් නැගුණ ජනශ්‍රැති, ජනකවි, ජනවහර ආදි දෑ තුළින් පෙනෙන්නේ එම ගැමියන්ගේ අව්‍යාජත්වය හා අවංකභාවය යි.

නියඟය, වන සතුන්ගේ උවදුරු, වසංගත රෝගාදියෙන් ආරක්ෂා වීමට අයියනායක, ගම්භාර, කතරගම, පත්තිනි ආදි වූ දෙවිවරුන් උදෙසා පුද පඬුරු වෙන් කරන්නේ බිය මුසු ගෞරවයකින් යුක්ත ව ය.

වන්නි හත්පත්තුවේ ජනයා වැව මුල් කරගනිමින් ඔවුන්ට ම ආවේණික වූ සංස්කෘතියක් ගොඩනගාගෙන තිබේ. මුට්ටි මංගල්‍යය, සංහිඳේ කිරි ඉතිරවීම, මුළු මස් ඇල්ලීම, වැනි සිරිත්විරිත් හා පූජාකර්ම ගැඹුරින් විමසීමෙන් ඔවුන්ගේ ආකල්පවල ස්වභාවය ප්‍රකට වේ. එම සිරිත්විරිත් ඔස්සේ ගැමියාත් වැවත් අතර වූ දැඩි සම්බන්ධය ස්ඵුට වේ. මෙයින් ඔවුන් සතු වූ ගුණගරුක බව, මිනිස් සාරධර්ම, එකමුතුබව, සහයෝගය, තාක්ෂණික ඥානය වැනි ගුණාංග ඉස්මතු වේ.





වර්තමානය වන විට ගැමියාගේ සංස්කෘතිය නිරූපණය වූ කේන්ද්‍රස්ථානය වූ ගම නාගරීකරණයට ලක්වෙමින් පවතී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වැව් හා වැව්ගම්වල දැකිය හැකි වූ සිරිත්විරිත්, පූජාකර්ම, ජනප්‍රවාද, ජනශ්‍රැතීන් ක්‍රමයෙන් අභාවයට යමින් පවතී. වැව් ගොඩවීම, වැව් ප්‍රතිසංස්කරණය නො කිරීම වැනි හේතු ද මීට බලපා තිබේ. ජනයා ක්‍රමයෙන් වැවෙන් මෙන් ම වැව හා බැඳුණු සංස්කෘතියෙන් ද ඈත් වනු පෙනේ.

වන්නි හත්පත්තුවේ ගැමියන් වැවෙන් දුරස්වීම හේතුවෙන් වැව හා ගැමියා අතර තිබූ අන්‍යෝන්‍ය සම්බන්ධතාව බිඳවැටීම වේගවත් වී තිබේ. පුරාණ කාලයේදී වැව හා ගැමියා අතර ආධ්‍යාත්මික බැඳීමක් ගොඩ නැගී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙසින් වැව වෙනුවෙන් ඉටු කළ යුතු වූ යුතුකම් පැහැර නො හැර සිදු කෙරුණි. වැව කෙරෙහි ගැමියාගේ සිතෙහි පැවති ගෞරවයත් භක්තියත් ඉන් පෙනේ.

වැවේ වතුරට කෙළ පොදක්වත් නො ගැසූ ගැමියෝ අද වන විට එම වැවට මළමුත්‍ර වසවිස ද එක් කිරීම නො බිය ව සිදු කරති. පැරණි ගැමියෝ හිසෙහි ජටාවක් බැඳ පයට පාවහන් දමා කිසිදු දිනක වැ කන්ද මතින් ගමන් නො කළහ. වර්තමාන ජනයා ඒවා අද හිස් විකාර ලෙස සලකති. පූජා වෙඩිල්ල අද දැක ගැනීම දුෂ්කර ය. වැස්ස බලාපොරොත්තුවෙන් සියලුදෙනා ම එක් වී සිදුකළ වැහි පිරිත් කීම ඉතිහාසයට එක් වී හමාර ය. අදටත් දැකිය හැක්කේ එදා සිට නො මැකී පවතින එක ම පූජාකර්මය කිරි ඉතිරවීමේ මංගල්‍යය පමණි. එය ද සංහිඳේ හෝ වැව් බැම්ම අසල සිදු කරන්නේ පැරණි ගැමියන් අතිනි. පැරණි ගැමියන් කීප දෙනෙක් හැර බොහෝ පිරිස් මෙහි සිරිත් විරිත් පවා හරි හැටි නො දැනීම කනගාටුවට කරුණකි. එය ම මෙම සිරිත් සමාජය තුළින් දුරස් වී යාමට හේතු කාරණා සපයයි.

වැව් ආශ්‍රිත ජනප්‍රවාද හා ජනශ්‍රැති පිළිබඳ තොරතුරු දන්නෝ දුර්ලභ වෙති. මෙම තත්ත්වය හේතුවෙන් වර්තමානයේ නව පරපුරට වැව හඳුනා ගැනීමේ ක්‍රමවේද ලසු වී තිබේ. එම නිසා නව පරපුර බොහෝවිට වැවට ළංවිය නො හැකි ලෙසින් ම දුරස් වී යා හැකි ය.

වන්නි හත්පත්තුවේ වැව් හා බැඳුණු සංස්කෘතිය ආරක්ෂා කරගැනීම සිංහල සංස්කෘතියට හිමිකම් කියන්නා වූ සැමදෙනාගේ ම යුතුකමකි. ඒ සඳහා වැව් ගංකරේ වැසියන්ගේ සහ රජයේ නිලධාරීන්ගේ එකමුතුවෙන් විනාශ

වෙමින් පවතින වාපි සභ්‍යත්වය හා විශිෂ්ට සංස්කෘතිය රැක ගැනීමට වහ වහා කටයුතු යෙදිය යුතු ය. ඒ සඳහා තවත් කල් බලා සිටිය නො හේ. සිංහල සංස්කෘතිය යළි පණ ගැන්වීමට නම් වැවට පණ පෙවිය යුතු වේ. වන්නි හත්පත්තුවේ විනාශ වෙමින් පවත්නා වාපි පද්ධතිය පිළිසකර කර එහි වටිනාකම නූතන පරපුරට කියා දීම අත්‍යවශ්‍ය වේ.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- කපුරු බණ්ඩා, හොරපෙ, වන්නි පුරාණය, ඩී. බී. ටී. මුද්‍රණාලය, රාගම, 1998.
- කරුණාතිලක, එන්. ටී. වයඹ ලංකාවේ රාජධානි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1993.
- ගයිගර්, විල්හෙල්ම්, මධ්‍ය කාලීන ලංකා සංස්කෘතිය, (පරි) එම්. බී. ආරියපාල, සී/ස, එම්. ඩී. ගුණසේන සහ සමාගම, 1969.
- දිසානායක මුදියන්සේ, ඓතිහාසික වන්නියේ සංස්කෘතිය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන පාර, කොළඹ 10. 1997.
- ස්වර්ණසිංහ, කේ. අපේ වැවෙන් පැන් දෝතක්, චාග ප්‍රකාශන, පන්නිපිටිය, 2005.
- මහාවංශය, (සංස්)හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, දේවරක්ෂිත, බටුවන්තුඩාව, රත්නාකර මුද්‍රණාලය, කොළඹ, 1946.


### සඟරා හා පුවත්පත්


- සම්පත් පැතිකඩ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2008/2009, නිකවැරටිය. වයඹපුත්‍ර ප්‍රසාදිනී 2004, සංස්කෘතික දෙපාර්තුමේන්තුව, 2005.


### English


- **Epigraphia Zeyalannica,** Vol II /III London,1912.
- Paranavithana, S./ **Inscription of Ceylon,** Colombo, 1970.




05



# කෙටි පණිවිඩ සේවාවේ ප්‍රවර්ධනය හා වැදගත්කම


**හේමන්ත විපුල බණ්ඩාර**
ශාස්ත්‍රවේදී (ගෞරව)
නිබන්ධක
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
sjpsachintha@gmail.com

පණිවිඩ නැතහොත් message යන්න හඳුනා ගැනීමට පර්යාය පද රැසක් භාවිත කරයි. එහි දී "පයින්ඩය" "හස්න" "අස්න" "හසුන" "සන්දේශය" ආදි වූ පර්යාය පද භාවිත වන අයුරු හඳුනාගත හැකි ය.

පණිවිඩ යන්නට අර්ථ සපයන සුමංගල ශබ්දකෝෂය එය අර්ථ දක්වන්නේ පහත ආකාරයෙනි. "පණත්" "ආඥාව" "මෙහෙය" දූතයකු මඟින් යවන නියමය වශයෙනි. (සුමංගල ශබ්දකෝෂය,1970 :546)

සුමංගල ශබ්දකෝෂයෙන් පණිවිඩය යන්න ආඥාව දූතව නියාමයක් ලෙස දක්වා තිබේ. හරිස්චන්ද්‍ර විජයතුංග සිය ශබ්දකෝෂයෙන් පණිවිඩ යන්නට තරමක් සරල අර්ථ කිහිපයක් ලබා දී ඇත. ඊට අනුව පණිවිඩය යන්නට "මෙහෙවර" කෙනකුගේ අතේ යවන නියමය, ආරංචිය, ඉල්ලීම" (විජයතුංග, 2008: 36) යනුවෙන් දක්වා තිබේ. මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් සිය සන්නිවේදන ශබ්දාකාරයෙහි ද පණිවිඩ යන්න අර්ථකථනය කරයි. වාචික ව හෝ අවාචික ව හෝ ජනමාධ්‍යයක් ඔස්සේ හෝ ග්‍රාහක ක්ෂේත්‍ර ඔස්සේ යොමු කරවනු ලැබේ. ප්‍රකාශනය හෝ අන්තර්ගත විෂය මේ නමින් හැඳින්වේ." සන්නිවේදන ප්‍රාථමික සූත්‍ර පහදනයේ දී සන්නිවේදකයා, සන්දේශ, ග්‍රාහක යනුවෙන් හැඳින්වේ. ඉංග්‍රීසියෙන් මෙය SMR න්‍යාය හෙවත් Sender, Message, Receiver යනුවෙන් නම් කෙරේ. (මහේන්ද්‍ර,1997 :192) පණිවිඩය නොහොත් Message යන්න සන්නිවේදන ක්‍රියාවලියෙහි ප්‍රමුඛතම මූලිකාංගයක් ලෙස අපගේ සම්භාවනාවට පාත්‍ර වන්නකි. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය පණිවිඩය විග්‍රහ කරන්නේ පහත ආකාරයෙනි. "A written or spoken piece of information"යනුවෙනි. (Oxfords Dictionary 2010 :p.962) ලියන ලද හෝ කියන ලද තොරතුරු කඩ (ස්වල්පය යන අදහස), message නැතහොත් පණිවිඩය යන්නෙන් අර්ථ ගැන්වෙන බව යි.

Sms නැතහොත් කෙටි පණිවිඩ සේවාව (Short message service) දූරකථන මාධ්‍යයෙහි ඇති වූ නව ප්‍රවණතාවකි. ලිඛිත සන්නිවේදන





ඉතිහාසයෙහි නව ස්වරූපයක් මේ ඔස්සේ නිර්මාණය වී ඇත. කඩදාසි මාධ්‍ය කරගෙන, තීන්ත ආධාර කරගෙන යමක් ලියා ප්‍රකාශ කිරීමේ සම්ප්‍රදායයට නව ගැඹුරක් එක් කරමින් SMS ක්‍රමවේදය විශේෂිත ස්ථානයක් හිමි කරගෙන තිබේ. නුදුරු අනාගතයේ දී ලෝක සමාජය ගොඩනැගීමට අපේක්ෂිත කඩදාසි විරහිත ලෝකයකට මානවයා පුරුදු පුහුණු කරන පෙරහුරු පරීක්ෂණයක් ලෙස sms සන්නිවේදනය හඳුනා ගැනීමට පුළුවන. මෙහි ඉතිහාසය බොහෝ ඈතට විහිදී යන්නක් නො වේ. ඊට ඇත්තේ සීමිත කාල පරාසයක් සහිත ඉතිහාසයකි. එය තාම නව යොවුන් තරුණයකු හා සමාන ය. වර්ෂ 2012.11.02 දිනට 20 වෙනි ජන්ම දිනය සමරන sms නූතන සන්නිවේදන භාවිතයකි. බ්‍රිතාන්‍ය ඉංජිනේරුවකු වූ නීල් පැප්වර්ත් 1992 දෙසැම්බර් දෙවැනි දින සිය පරිගණකයෙන් වැඩ කරමින් සිටින අතරවාරයෙහි තම මිතුරු මිතුරියන්ට, හිතවතුන්ට නත්තල් සුභ පැතුමක් යැවීමේ ක්‍රමයක් පිළිබඳ ව කල්පනා කරන්නට විය. එම කල්පනාවේ ප්‍රතිඵලයක් ලෙස මිතුරන් සතු වොඩෆෝන් හැන්ඩ් සෙට්වලට, පරිගණකය හරහා නත්තල් සුභ පැතුමක් සම්ප්‍රේෂණය කරන ලදී. "merry christmas" යනුවෙන් යතුරු ලියනය කරන ලද කෙටි පණිවිඩය සිය මිතුරන්ගේ වොඩෆෝන් හැන්ඩ් සෙට්වල කියවීමට ලියූ පණිවිඩයක් ලෙස "ටෙක්ස්ට් මැසේජස්" ලෙස තැන්පත් වීමත් සමඟ ලොව වේගවත් ම තොරතුරු සම්ප්‍රේෂකයා වන sms ලොව ප්‍රභවය විය.

කෙටි පණිවිඩ සන්නිවේදනය ක්‍රියාත්මක වන ස්වරූපය අනුව එය මෙසේ වර්ගීකරණය කළ හැකි ය. එනම්,

- විධිමත් කෙටි පණිවිඩ සන්නිවේදනය
- අවිධිමත් කෙටි පණිවිඩ සන්නිවේදනය වශයෙනි.

විධිමත් කෙටි පණිවිඩ සන්නිවේදනය යනු කිසියම් ඉහළ සංවිධානාත්මක බවකින් යුක්ත ව, ආකෘතික රටාවක් හෝ අනුපිළිවෙළට අනුගත වෙමින් සිදුකරන පණිවිඩ සම්ප්‍රේෂණය යි. Email, Fax, Sms news alert ආදියෙහි මේ සංවිධානාත්මකබව, විධිමත්බව දක්නට ලැබේ. ඒ අනුව භාෂාව, අන්තර්ගතය, අක්ෂර, සංකේත, ආකෘතික රටාව, තොරතුරු සම්පාදනය, තොරතුරුවල විධිමත් ප්‍රමිතිකරණය, නිරවුල්බව, පැහැදිලිබව, ආදිය පිළිබඳ ව විධිමත් හා සංවිධානාත්මක බවක් නිර්මාණය කිරීම, විධිමත් කෙටි පණිවිඩ සන්නිවේදනයේ දක්නට ලැබේ. තවද,

1. ඉලක්කම්වල නිවැරදිභාවය
2. අක්ෂරවල නිවැරදිභාවය
3. සංකේතවල යෝග්‍යභාවය හා නිවැරදිභාවය
4. සංඥාවල යුක්ති යුක්තභාවය     ආදිය ද අවශ්‍ය වේ.

අවිධිමත් කෙටි පණිවිඩ සන්නිවේදනය යනු තොරතුරුවල නිශ්චිත ගලායාමකින් තොර වූ අසංවිධානාත්මකබවින් යුතු පණිවිඩ සම්ප්‍රේෂණය යි. මිතුරු මිතුරියන් අතර හුවමාරු වන එස්. එම්. එස් හි අවිධිමත් සන්නිවේදන ස්වරූපයක් දක්නට ලැබේ.

විශ්ව ගම්මාන සංකල්පයෙහි හමුවන කාර්ය බහුල මිනිස් වර්ගයාගේ තොරතුරු හුවමාරු කිරීමේ අවශ්‍යතාව එසැණින් සම්පූර්ණ කරන්නා වූ අවස්ථාවක් ලෙස කෙටි පණිවිඩ සේවාව හඳුන්වා දීමට පුළුවන. සංක්ෂිප්ත හා ක්ෂණික ව තොරතුරු හුවමාරු කිරීමේ ක්‍රමවේදය sms බව ඇමරිකානු සන්නිවේදන මහාචාර්ය නීල් පොස්ට්මන් මහතා සඳහන් කර ඇත. (පරිගණක සඟරාව, 2005 5 කාණ්ඩ, කලාප අංක 5, පි:21) ලොව වේගවත් ම සන්නිවේදන විධික්‍රමයක් ලෙස sms හඳුනා ගත හැකි බව ඉහත සන්නිවේදනඥයාගේ අර්ථ ගැන්වීම හා sms ක්‍රමවේදයේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීමේ දී පෙනී යනු ඇත.

පූර්ව යුගවල මිනිසා ලිඛිත සන්නිවේදන ක්‍රියාකාරකම් හැසිරවීමේ දී විශාල ලිපි, පුවත්පත්, ග්‍රන්ථ හරහා තම අදහස්, සිතුම් - පැතුම්, තොරතුරු සමාජගත කරන්නට සමත් විය. මනා ලෙස සංවිධානගත කරන ප්‍රමිතකරණයකට ලක් කළ විශාල තොරතුරු ප්‍රමාණයක් මේ ලිපිවල අන්තර්ගත කෙරිණි. පුවත්පතක නම් ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගෙන ලිඛිත සන්නිවේදනයේ සාම්ප්‍රදායික මූලධර්ම, ආකෘති රටා, අන්තර්ගතය, භාෂාව ආදියෙහි පරිවර්තනීය වෙනසක් සිදු කර තිබේ.

නූතන මානවයා (modern man) තම මනෝභාවයන් අන්‍යයන්ට ප්‍රකාශ කිරීමේ ලිඛිත මාධ්‍ය බවට දූරකථන තාක්ෂණයෙහි සංවර්ධනය මුල් කරගෙන ඇති වූ sms ක්‍රමය භාවිතයට ගන්නා ආකාරය නූතන සමාජ ප්‍රවාහයේ සන්නිවේදන ක්‍රියාකාරකම් අධ්‍යයනයෙන් තුළින් විශද වේ. අතීතයේ ආදරයේ ප්‍රකාශන මාධ්‍ය ලෙස "පෙම් හසුන්" විසිතුරු කොළ





කඩදාසි මත ලියා තැපැල් කරන ක්‍රමය වෙනුවට sms මඟින් තත්පර කීපයක් ඇතුළත ඉලක්ක ග්‍රාහකයා වෙත සම්ප්‍රේෂණය කිරීමේ හැකියාව ලැබී තිබේ.

sms සේවාව දූරකථන මාධ්‍ය හරහා ලැබීමත් සමග පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, ප්‍රේම සම්බන්ධතා පැවැත්වීම. ව්‍යාපාර කටයුතු මෙහෙයවීම අනෙකුත් අවශ්‍යතා සාධනය ආදි තත්ත්වයන්ගේ සාම්ප්‍රදායික මුහුණුවර බිඳවැටී නව මාදිලි, නව මොඩල බිහි ව ඇත. ඒ අනුව සලකන විට සමාජ ප්‍රවාහය ජංගමකරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස sms ක්‍රමය පහසුවෙන් සමාජගත වී ඇත. ඒ අනුව නූතනයේ දී පුද්ගල සම්බන්ධතා sms කරණය වී තිබේ. ප්‍රේම සම්බන්ධතාවන්හි සාම්ප්‍රදායික හඳුනා ගැනීමේ රේඛාවන් අතුගෑ වී මැකී ගොස් ප්‍රේමය sms කරණය වී තිබේ. ව්‍යාපාරික කටයුතු සම්බන්ධීකරණය කරන ක්‍රමය වූ දූරකථන ඇමතුම් ක්‍රමයෙන් ඔබ්බට ගොස් එය කෙටි පණිවිඩ ක්‍රමය සමඟ අත්වැල් බැඳගෙන ඇත. මහා පරිමාණ ලෝක සම්බන්ධතා හසුරුවාලන ක්‍රමවේදයන් තුළ ප්‍රබල බලපෑමක් කිරීමේ ශක්තිය දූරකථනයටත්, එහි එන sms ක්‍රමයටත් හිමි ව තිබේ.

කෙටි පණිවිඩ සේවාව වඩාත් ජනප්‍රිය ව ඇත්තේ තරුණ ප්‍රජාව අතර යි. එමෙන් ම ව්‍යාපාරිකයන්, බැංකු ක්ෂේත්‍රයෙහි නිලධාරීන්, වෛද්‍යවරුන්, ප්‍රභූ ජනතාව, දේශපාලනඥයන් අතර ද කෙටි පණිවිඩ ක්‍රමය ජනප්‍රිය පණිවිඩ හුවමාරු ක්‍රමයක් වී ඇත. 21 වන සියවසේ මිනිසා අත්විඳින විශාලතම ඇබ්බැහිවීම බවට දූරකථන භාවිතයත්, කෙටිපණිවිඩ ක්‍රමයත්, පත් ව ඇති බව ලෝක සන්නිවේදන විශේෂඥයන්ගේ මතය යි. බාසිලෝනා නුවර මනෝ විද්‍යාඥවරයකු වන ඇන්ඩ්‍රියාස් ගොන්සාලෙස් විසින් ස්පාඤ්ඤය මුල් කරගෙන සිදු කරන ලද සමීක්ෂණයකින් ජංගම දූරකථන ඇබ්බැහි ය (Mobile Phone Addiction) පිළිබඳ වැදගත් තොරතුරු රැසක් අනාවරණය විය. ඔහු DPA පුවත් සේවයට මෙසේ කියා තිබුණේ ය.

"තරුණ පරපුරට ජංගම දූරකථනය ආභරණයක් වෙලා. තමන්ට ලියූ පණිවිඩය (ටෙක්ස් මැසේජ්) එකක් ආවේ නැත්නම් තමන් ලෝකෙන් කොන් වෙලා කියා ඒ අය සිතින් දුක් වෙනවා. මෙය දිගට ම පැවතුණා ම එය ඇබ්බැහියක් බවට පත් වෙනවා. මම ඒ වගේ ගොඩක් දෙනෙක්ට උපදේශන දී තිබෙනවා" (වික්‍රමසිංහ, 2006 ජනවාරි, පි : 53) ඉහත සඳහන් ඇබ්බැහි වීම වැඩිපුර ම දකින්නට ලැබෙන්නේ තරුණ පරපුර අතර යි. ඒ අනුව දූරකථන

ක්‍රමය, ටෙක්ස්ට් මැසේජස් ක්‍රමය 'Addiction' නොහොත් ඇබ්බැහි වීමක්, උණක් බවට පත් ව ඇත. මින් විශද වන්නේ පුද්ගල සම්බන්ධතා සමාජයට විශාල බලපෑමක් සිදු කරන බවකි.

ලියූ පණිවිඩ හෙවත් ටෙක්ස්ට් මැසේජස් යැවීමේ ක්‍රමවේදය, අතින් අතට බෝවන ජංගම දූරකථනයක් හිතින් හිතට පැතිරී යන අදහස් ද එකට එක් තැන්කර සන්නිවේදනය කරන ලද යුගයේ සන්නිවේදන ක්‍රමවේදය යි. එය ලෝක පරිමාණ, සමාජ තලය තුළ සන්නිවේදන ක්ෂේත්‍රයෙහි සන්නිවේදන ක්‍රමවේදයන්හි ඇති වූ හිඩැසක් පූර්ණය කරවීමක් වැනි ය. ලොව පුරා දෛනික ව, මුද්‍රාහරින කෙටි පණිවිඩ ප්‍රමාණය කෙතරම් ද යන්න පිළිබඳ සොයා බලන්නට 'ඉන්ටර්නැෂනල් හෙරල්ඩ් ට්‍රිබියුන්' (International Tieald Tribune) පුවත්පත 2007 වර්ෂයේ කළ සමීක්ෂණය වැදගත් වේ.

"දැන් ලොව පුරා මිනිසුන් අවුරුද්දකට හුවමාරුකරන එස්. එම්. එස් ගණන ට්‍රිලියන තුනක් හෙවත් කෝටි ලක්ෂ තුනක් බව යි. එනම් දවසකට කෝටි අටසිය විස්සකට වැඩි ය." (අලහකෝන්, , 2008, ජනවාරි : පි : 13)

එහි දී අපට පෙනී යන කරුණක් වන්නේ 2008 ජනවාරි වන විට ලොව පුරා දිනකට දූරකථන පාරිභෝගිකයන් sms පණිවුඩ කෝටි අටසිය විස්සකට වැඩියෙන් හුවමාරු කර ගන්නා බවකි. අද වන විට මේ තත්ත්වය ශීඝ්‍රයෙන් වර්ධනය වී තිබේ. ඒ අනුව දූරකථනයක් භාවිත කරන සෑම පාරිභෝගිකයකු ම කවර අවශ්‍යතාවක් හෝ සාධනය කර ගන්නට කෙටි පණිවිඩ සේවාව යොදා ගනු නො අනුමාන ය.

ජපානයේ ප්‍රජාව ජංගම දූරකථන කෙටි පණිවිඩ ක්‍රමයට ආකර්ෂණය වී ඇති ආකාරය විස්මය උපදවන සුලු ය. ද ඩේලි යොමියුරි (The Daily Yomiuri) පුවත්පත මේ පිළිබඳ කරුණු දක්වා තිබේ. "තරුණ පරපුර ජංගම දූරකථනය තම ශරීරාංගයක් සේ සිතන බව පෙනේ. දූරකථන ඇමතුමක්, ටෙක්ස්ට් පණිවුඩ නො ලැබුණු දවසක් අවසානයේ ඔවුහු කළකිරීමට පත් වෙති. අනතුරුව කලහකාරී ගති පෙන්වති. එය ඇබ්බැහි ලක්ෂණය යි" (වික්‍රමසිංහ, 2006, ජනවාරි, පරිගණක, පි:53)





මින් ගම්‍ය වන්නේ ද ජපන් තරුණ ප්‍රජාව ද කෙටි පණිවිඩ පෙළක සම්ප්‍රාප්තිය තුළ ඔවුන් ඉච්ඡාභංගත්වයට පත්වන බව යි. දැන් ලොව පුරා විවිධාකාර සමාගම් සිය නව නිෂ්පාදනයන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ නවතම ක්‍රමවේදය බවට sms පත් කරගෙන ඇත. එනම් දූරකථන ආශ්‍රිත වෙළෙඳ ප්‍රචාරණ ක්‍රමවේදය sms හරහා බිහි ව තිබේ.

"ජංගම දූරකථන දැන්වීම්කරණය තවමත් පවතින්නේ මුල් අවධියේ ඕනෑ ම කෙනෙකුට හිතන්න පුළුවන් එය අවසාන හා එකම විසඳුම කියලා, අපට අවශ්‍යයි. Marketers හා දැන්වීම් නියෝජිත ආයතන සමඟ වැඩ කරන්න. ජංගම දූරකථන දැන්වීම්කරණය ප්‍රවර්ධනය කිරීම හා නාලිකා වර්ධනය කිරීමට" (Mr. Litvack)

මතු සඳහන් පරිවර්තනීය අදහස් මගින් sms වෙළෙඳ ප්‍රචාරණ කලාව ප්‍රාථමික මට්ටමේ පසුවන බවත් එය ප්‍රවර්ධනය කිරීම විෂයයෙහි දූරකථන සමාගම්වල අවධානය යොමු විය යුතු වගත් පැහැදිලි වේ.

නූතන දේශපාලන ප්‍රවාහය තුළ sms කලාව අනාගත රාජ්‍ය පාලකයා හෝ "පාලක පක්ෂය" "මැතිඇමතිවරුන්" කවුරුන් ද යන්න තීරණය කරන තීරක බලවේගය බවට පත් ව තිබෙන අයුරු දක ගැනීමට පුළුවන. ජනමත නිර්මාණකාරකයක් බවට පත් ව තිබෙන අයුරු දක ගැනීමට පුළුවන. ජනමත නිර්මාණයේ දී හා දේශපාලන ප්‍රචාරණයේ දී එස්. එම්. එස්. ක්‍රමවේදය, නව මාධ්‍යයේ ඇති ප්‍රබල සන්නිවේදන මාර්ගයක් සේ හඳුන්වා දීමට පුළුවන.

ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු මැතිවරණ, පළාත් සභා, ප්‍රාන්ත මැතිවරණ, ජනමත විචාරණ, ආදී වූ සෑම මැතිවරණ ක්‍රමයක ම ජනමත නිර්මාණ කිරීමේ, පාලකයන් තෝරා ගැනීමේ, ව්‍යායාමය තුළ සොඳුරු ප්‍රචාරකයා බවට පත් ව ඇත්තේ එස්.එම්.එස් ය. ඒ නිසා ම බොහෝ පාලකයන් දූරකථන සම්බන්ධතා ජාල සමඟ සම්බන්ධ වෙමින් තම දේශපාලන ප්‍රචාරණ ව්‍යාපාර ගෙනයන ආකාරය දැකිය හැකි ය.

ඇමරිකාව, බ්‍රිතාන්‍ය, වැනි රටවල ජනාධිපතිවරණ සමයන් තුළ ඉතා ප්‍රබල ලෙස නව මාධ්‍ය මෙවලමක් වන ජංගම දූරකථනය හා ඒ ආශ්‍රිත ව පවතින sms නොහොත් කෙටි පණිවිඩ සේවය භාවිත කරයි. විශේෂයෙන්

පසුගිය ඇමරිකන් ජනාධිපතිවරණයේ දී ඔබාමාගේ දේශපාලන ව්‍යාපාරයෙහි ජයග්‍රහණය කෙරෙහි දනෙන බලපෑමක් සිදු කරන්නට කෙටි පණිවිඩ සේවා, බලපෑම් කර ඇති වග දේශපාලන විචාරකයන්ගේ මතය යි. ''2001 පිලිපීන ජනාධිපතිවරණය දී පිලිපීනයේ ජනාධිපති ජෝසප් එස්ට්‍රාඩාට එරෙහි ව පිලිපීන උද්ඝෝෂකයෝ දවැන්ත sms ප්‍රචාරක ව්‍යාපාරයක් ගෙන ගියහ. එස්ට්‍රාඩා පැරදුණේ එහි ප්‍රතිඵලයක් වසයෙනි. 2002 දකුණු කොරියානු ජනාධිපතිවරණයේ දී පරාජයට පත්වෙතැයි සිතූ අපේක්ෂක රෝ මෝ හොයින් වැඩි ඡන්ද ගණනක් ලබා ජයග්‍රහණයක් කළේ අන්තිම මොහොතේ ගෙන ගිය ප්‍රචාරක ව්‍යාපාරය නිසා ය.'' (අලහකෝන්, පරිගණක, 2008. පි. 13)

ලෝක දේශපාලන නායකයන් මෙන් ම දේශීය දේශපාලන නායකයෝ ද සිය ප්‍රතිරූප වර්ධනය කර ගනිමින්, ඉහළ මහජන සම්බන්ධතාවක් පවත්වාගෙන යමින්, තමා විෂයයෙහි මහජන හොඳ හිත ගොඩ නගා ගැනීමෙහි ලා කෙටි පණිවිඩ ක්‍රමවේදය භාවිත කරති. විශේෂයෙන් ම වෙසක්, පොසොන්, ආදී පොහොය දිනවල ද, නත්තල්, සිංහල අලුත් අවුරුදු, ජාතික නිදහස් දිනය, රාමසාන්, දීපවාලි, මැයි 1 වැනිදා, ලෝක ළමා දිනය, ආදී වූ සුවිශේෂ දිනයන් පදනම් කරගෙන විශේෂ සුභපැතුම් පණිවිඩ ජංගම දූරකථන වෙත යොමු කරන්නේ කෙටි පණිවිඩ ක්‍රමය මුල්කරගෙන ය. ඒ අනුව කෙටි පණිවුඩ ක්‍රමවේදය මහජන සම්බන්ධතා ගොඩනගා ගන්නා මෙවලමක් ලෙස නූතන දේශපාලනඥයෝ භාවිතයට ගනිති. බටහිරින් ආරම්භ වී ජනප්‍රිය සංස්කෘතිය ලෝක ව්‍යාප්තිය සිදුවීමක් සමග පෙරදිග මාධ්‍ය මහත් අභිරුචියෙන් වැළඳගත් තරු සංකල්පය තුළ කෙටි පණිවිඩ ක්‍රමය වඩාත් ජනප්‍රිය වී තිබේ. කලාකරුවන්, නර්තන ශිල්පීන්. ගායකයන්, විකටයන්, පමණක් නොව හොඳ ම පරාජිතයන් ද වශයෙන් තරු බිහි කරලන්නා වූ ගාමක බලවේගය බවට එස්. එම්. එස් පත් ව තිබේ. ශාක්‍යතාවක්, නිර්මාණශීලිත්වය, කලාකාමිත්වය අබිබවා ගොස් තරු බිහි කරලීමේ සාම්ප්‍රදායික ආගමනය සිදු ව තිබේ. තරු බිහිවනු වෙනුවට සුපිරිතරු බිහිකරලීමේ දුෂ්කර ව්‍යායාමය පහසු කරවන තරු මැවුම්කරුවා බවට එස්. එම්. එස් පත් ව ඇත.

කෙටි පණිවිඩ සේවාව තුළින් සත්‍යාසත්‍ය ලිඛිත ප්‍රකාශ සහිත කෙටි පණිවිඩ ලැබෙන අවස්ථා ද දක ගැනීමට පුළුවන. එය සිදුවන්නේ ජංගම දූරකථන මාධ්‍යයෙන් දුර්භාවිත පින්තූර ආදිය sms හා mms පණිවිඩ ලෙස





ජංගම දූරකථන අතර හුවමාරු වන නිසා ය. මෙලෙස හුවමාරු වන පණිවුඩ යවන්නාගේ ඍණාත්මක මනෝභාවයන් හා මනෝමූලික විකෘතිතාව බව මනෝ විද්‍යාඥයන්ගේ මතවාදය යි.

කෙටි පණිවිඩ සේවාව පුද්ගල සිත් සතුටු කරන්නට මෙන් ම සිත් දූෂ්‍ය කරන මාධ්‍යයක් ලෙස ද හඳුනා ගැනීමට පුළුවන. කෙටි පණිවිඩ සේවාවෙන් අනවශ්‍ය දෑ සංසරණයවීම වළක්වා ගැනීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කර ගත යුතු අතර sms භාවිතය සුභාවිතය උදෙසා ම යෙදවීමට යත්න දැරිය යුතු ය. සදාචාරාත්මක කෙටි පණිවිඩ භාවිතාවක් උදෙසා දූරකථන මාධ්‍ය මෙහෙයවන්නට, භාවිත කරන්නා උත්සුක විය යුතුය. ලෝ වටා සිදු වන නව්‍යවූත්, ප්‍රවෘත්ති වටිනාකමකින් යුත් අලුත් ආරංචි ග්‍රාහක ක්ෂේත්‍රයන් වෙත සම්ප්‍රේෂණය කරන මාධ්‍ය බවට ජංගම දූරකථන මඟින් ලබාදෙන කෙටි පණිවිඩ සේවාව පත් ව තිබේ. කවර ස්ථානයක සිදුවන ප්‍රවෘත්තියක් වුව ද අනෙකුත් ජනමාධ්‍ය හරහා ඇසෙන්නට ප්‍රථම ජංගම දූරකථන මඟින්, කෙටි පණිවිඩ ක්‍රමය මුල්කරගෙන sms news alerts ලෙස අදාළ ප්‍රවෘත්ති උණු උණුවේ ලැබෙන ආකාරය දකගත හැකි ය.

කෙටි පණිවිඩ ක්‍රමයෙහි භාෂාව හඳුනා ගැනීමේ දී සංක්ෂිප්ත ලිඛිත සන්නිවේදනයක් වන පණිවිඩයක අඩංගු විය යුතු වචන ප්‍රමාණය ඉතා වැදගත් වේ. මන්ද කෙටි පණිවිඩ යනු කියවීම උදෙසා ලියන ලිපියක් බැවිනි. එනිසා කෙටි වැකි භාවිත කළ යුතු ය. කෙටි බව ආත්මය කරගෙන පණිවිඩ ක්‍රමය හැසිරවිය යුතු ය. කෙටි පණිවිඩ භාවිත කිරීමේ ක්‍රමවේද වර්ධනය උදෙසා එහි කියවීමේ පහසුව ඉවහල් වනු ඇත. කියවීමේ පහසුව ගොඩනැගෙන්නේ වාක්‍යයක අඩංගු වචන සංඛ්‍යාව අවම වූ විට ය. කියවීම පමණක් නො ව, තේරුම් ගැනීමේ හැකියාව කෙරෙහි ද ප්‍රබල දායකත්වයක්, අව ම වචන ප්‍රමාණයක් සහිත කොට වැකි තුළින් ලැබෙනු නො අනුමාන ය.

වාක්‍ය සාමාන්‍ය දිග වචන ගණන අනුව කියවීමේ පහසුව

| | |
|---|---|
| වචන 8 ක් | ඊට අඩු කියවීමට ඉතා පහසු |
| වචන 11 | කියවීමට පහසු |
| වචන 14 | කියවීමට තරමක් පහසු |
| වචන 17 | සාමාන්‍ය |
| වචන 21 | කියවීමට අමාරු |

| | |
|---|---|
| වචන 25 | කියවීමට තරමක් අමාරු |
| වචන 29 හෝ ඊට වැඩි | කියවීමට ඉතා අමාරු |

(දිසානායක, 1999, පි : 40)

කෙටි පණිවිඩ කලාවේ දී බොහෝ විට වචන 20 කට අඩු වන පරිදි කෙටි පණිවිඩ සැලසුම් කරන අතර වචන හතර පහේ කෙටි වාක්‍ය බහුල ව භාවිත කරයි. කියවීමේ පහසුව පමණක් නො ව අවබෝධ කර ගැනීමේ පහසුව ද මෙමගින් නිර්මාණය කරයි.

කෙටි පණිවිඩ රචනයේ දී බොහෝ විට කෙටි යෙදුම් සහිත භාෂා භාවිතය සාමාන්‍ය දෙයක් බවට පත් ව තිබේ. දිගුවැකි කෙටි යෙදුම් බවට පත්කර sms වල යොදන ආකාරය දැකගත හැකි ය. ඉඩ පිරිමැසීමේ උපක්‍රමයක් ලෙස මෙය භාවිතයට ගනී. ඉඩ කළමනාකරණය පිළිබඳ සිද්ධාන්තය කෙටි යෙදුම් භාවිතයට විෂයය වී තිබේ. පද රැසකින් හෙබියා වූ දිගුවැකි අකුරු කීපයකින් ඉදිරිපත් කිරීම sms පාරිභාෂිතය වී ඇත.

| | | | |
|---|---|---|---|
| afaik | - as far as I know | asap | - as soon as poossible |
| atb | - all the best | b4 | - before |
| bbfn | - bye bye for now | bc | - bccause |
| bcnu | - be seeing you | bg | - big grin |
| brb | - be right back | btw | - by the way |
| cm | - call me | cu | - see you |
| cub | - see you baby | dk | - don't know |
| eod | - end of discussion | f2f | - face to face |
| f2t | - free to talk | fya | - for your amusement |
| fyi | - for your information | gf | - girl friend |
| hak | - hugs and kisses | h2cus | - hope to see you soon |
| Idk | - I don't know | Imho | - In my humble opinion |
| Iow | - In other words | Iou | - I owe you |





| | | | |
|---|---|---|---|
| Itys | - I thank you stink | J4f | - just for fun |
| kc | - keep cool | LoL | - laughing out loud |
| L8 | - Late | L8r | - later |
| Luv | - Love | m8 | - mate |
| nc | - no comment | Nething2+? | - anything to add? |
| njoy | - enjoy | pcm | - please call me |
| pls | - please | ruok | - are you ok? |
| sol | - sooner or later | spk | - speak |
| t+ | - think positive | t2ul | - talk to you later |
| wan2 | - want to | 2dy | - today |
| 2moro | - tomorrow | | |

( විජය පරිගණක, 2005 මැයි පි : 29)

මේ අන්දමට හඳුනාගත හැකි එස්. එම්. එස් ක්‍රමයෙහි වාසි, අවාසි. රැසක් ද දක්නට ලැබේ. "short message service" හි වාසිදායක තත්ත්වයන් අපට පහත ආකාරයට හඳුන්වා දීමට පුළුවන. එනම්,

(1) පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කරමින් තොරතුරු බෙදා හැරිය හැකි වීම.
(2) කොටස් මිල ගණන් දැනගත හැකි වීම.
(3) ක්‍රීඩා විස්තර හා ලකුණු ප්‍රමාණයක් දැනගත හැකි වීම.
(4) භාණ්ඩ අලෙවිය පිළිබඳ තොරතුරු හඳුනාගත හැකි වීම.
(5) ගුවන්යානා ධාවනය වන කාල සටහනක් දැනගත හැකි වීම.
(6) රැකී රක්ෂා සොයාඃ ගතහැකි වීම.
(7) ලොතරැයි ප්‍රතිඵල ලබාගත හැකි වීම.
(8) ප්‍රවෘත්ති සිරස්තල ලබාගත හැකි වීම.
(9) කාලගුණ තොරතුරු ලබාගත හැකි වීම.
(10) ප්‍රේම ප්‍රකාශන මාධ්‍යයක් ලෙස ක්‍රියාත්මක වීම. යනාදී වශයෙනි.

එහෙත් sms ක්‍රමවේදයෙහි අවාසිදායක තත්ත්වයන් ද දක්නට ලැබේ. එනම්,

(1) ආතරයිටිස් රෝගය වැළදීමේ වැඩි සම්භාවිතාවක් තිබීම.
(2) ප්‍රවෘත්තියක සමස්ත තොරතුරු දැනගත නො හැකි වීම.
(3) කෙටි පණිවිඩ සේවාව පිළිබඳ ප්‍රමාණාත්මක සාක්ෂරතාවක් එය භාවිත කරන්නට අවශ්‍ය වීම.
(4) කියවීමේ හා අකුරු යතුරු ලියනය (type) කිරීමේ ශක්‍යතාව භාවිත කරන්නට තිබිය යුතු වීම.
(5) මූල්‍යමය ධනයක් වැය කිරීමට සිදුවීම.
(6) තාක්ෂණික දෝෂ මුල් කරගෙන කෙටි පණිවිඩ සේවාවට බාධා පැමිණිය හැකි වීම.
(7) සිත් දූෂ්‍ය කරන කෙටි පණිවිඩ යැවීමට හැකි වීම.

ආදි වූ අවාසිදායක තතත්වයන් ද කෙටි පණිවිඩ ක්‍රමය තුළ දක්නට ලැබේ. කෙසේ නමුත් නූතන පෘථිවිතලය තුළ වේගවත් තොරතුරු සම්ප්‍රේෂකයා ලෙස sms ලෝක ජනයාගේ සම්භාවනාවට හා සම්මානයට පාත්‍ර වී ඇත. යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදනය ශක්තිමක් කරන දූරකථන සන්නිවේදන ක්‍රමය තුළින් ජන්මලාභය ලද කෙටි පණිවිඩ කලාව තුළ සන්නිවේදන ක්‍රමය තුළ දොරටු පාලකයා මෙන් ම සන්නිවේදකයා ද වන්නේ තමාම ය. එස්. එම්. එස් සම්ප්‍රේෂණය කරනවා ද නැද්ද යන්න තීරණය කරන්නේ තමන් ම වීම නිසා ඒ පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය. කෙටි පණිවිඩ සන්නිවේදනය තුළ පුරවැසි ජනමාධ්‍යකරණය ප්‍රබල ලෙස ඉස්මතු ව පෙනේ. sms ප්‍රවෘත්ති ආයතනවල නම් බොහෝ අවස්ථාවල දොරටුපාලකයකු සිටිනු දැකගත හැකි ය. මෙලෙස ලොව පතළ එස්. එම්. එස්. කලාව විවිධාකාර වෙනස්කම් නිර්මාණය කරමින් මානව ශිෂ්ටාචාරයේ නව මායිමක් සටහන් කර තිබේ.

### ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


ශබ්ද කෝෂ

මහේන්ද්‍ර, සුනන්ද, (1997). සන්නිවේදන ශබ්දාකරය, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජේතුංග, හරිස්චන්ද්‍ර,(2008). ගුණසේන මහා සිංහල ශබ්ද කෝෂය, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සෝරත හිමි, වැලිවිටියේ (1970). ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, ගල්කිස්ස: අභය ප්‍රකාශකයෝ.

සඟරා

විජය පරිගණක, 2005 මැයි.

විජය පරිගණක 2006, ජනවාරි,

විජය පරිගණක 2008, ජනවාරි.

**English**

New Oxford Advanced Lerners Dictionary(2005).




06



# ඓතිහාසික කොළොම්පුරයේ මාර්ග, ප්‍රවාහනය හා ස්ථාන


**උදය නෙලුම් රත්නායක**
ශාස්ත්‍රවේදී (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කැලණිය)
සහාය කථිකාචාර්ය
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
nelukit@yahoo.com

කොළොම්පුරය ආසන්නයේ කෝට්ටේ රාජධානිය ගොඩනැගීමත් සමඟ දේශපාලන, සමාජ හා ආර්ථික ක්ෂේත්‍රයන්හි කේන්ද්‍රස්ථානය බවට පත්වූයේ එම ප්‍රදේශයයි. 16 වන සියවස ආරම්භයේ සිට යුරෝපා ජාතීන් ලංකාවට පැමිණීම දක්වාත් ඉන් පසුව අද දක්වාත් අඛණ්ඩ ව කොළඹ නව දේශපාලන හා ආර්ථික ප්‍රවාහය හමුවේ සංවිධානාත්මක හා දියුණු නගරයක් බවට ක්‍රමයෙන් පත් විය. රට අභ්‍යන්තරයේ සිට වෙරළ තීරය දක්වා වෙළඳ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට අවශ්‍යවන ක්‍රමානුකූල මාර්ග පද්ධතියක් හා ප්‍රවාහන ක්‍රම එහිදී වර්ධනය විය. වර්තමානයේ පවා කොළඹ නගරයේ සැරිසරන අපට අතීතයේ සිට පැවති හා පසුව විදේශීයන් විසින් ක්‍රමවත් ලෙස සකස් කරන ලද මාර්ග පද්ධතියක ලක්ෂණ දක්නට ලැබේ.

## ජයවර්ධනපුර සමයේ කොළොම්පුර

ගම්පොළ රාජධානි සමයේදී අලගක්කෝනාර විසින් ජයවර්ධනපුර බලකොටුව ගොඩනැංවීමත් සමඟ කොළොම්පුරය දේශපාලන වශයෙන් වැදගත් මධ්‍යස්ථානයක් බවට පත් විය. 14 වන සියවසේදී ලංකාවට පැමිණි අරාබි ජාතික සංචාරක ඉබන් බතූතා ද කලංපු යන නමින් කොළොම්පුරය පිළිබඳව විස්තරයක් සපයා ඇත.[1] බොහෝ විදේශීය සංචාරකයෝ සෙරෙන්ඩිබ්වල අතිශය අලංකාර හා විශාලතම නගරය කොළොම්පුර බව අදහස් කළහ.[2] 14 වන සියවසේ සිට මුස්ලිම්වරු වෙළඳ අවශ්‍යතා මත කොළොම්තොට හා කොළොම්පුරය සිය අණසකට ගැනීමට උනන්දු වූහ.[3]

නිරිතදිග ප්‍රදේශයට රාජධානි විතැන් වීමෙන් අනතුරුව දිවයිනේ ප්‍රධානතම තොටුමුණ ලෙස මෙම ප්‍රදේශය හැඳින්වූයේ සාරවත් භූමි භාගයක පිහිටා තිබීම නිසාවෙනි. 15 සියවසෙහි රචිත සන්දේශ කාව්‍ය රැසක දිවයින අභ්‍යන්තරයේ සිට කොළොම්තොට දක්වා විවිධ වෙළඳ ද්‍රව්‍ය රැගෙන කැලණි ගඟ හරහා ඔරු-පාරු පැමිණි බවට තොරතුරු සඳහන් වේ. කොළඹ පිළිබඳ ව හංස පුත්තුරයේ සිට වෙළඳ ද්‍රව්‍ය පටවාගෙන පැමිණෙන වෙළෙඳුන් පිළිබඳ ව හංස





සන්දේශයේ තොරතුරු ඇත.[4] බොහෝ මුස්ලිම් වෙළඳුන් වෙළඳ ද්‍රව්‍ය සිය කර මත තබා ඔරු පාරුවල නැගී මෙසේ පැමිණ තිබේ. තොටමුණු බැඳ නගරයේ වෙළඳාම ඇරඹියේ ද මෙසේ ඔරු පාරු මගින් වෙළඳ ද්‍රව්‍ය රැගෙන ඒමේ විශේෂ පහසුකම නිසාවෙනි. මොවුහු සිය ප්‍රවාහන මාධ්‍ය ලෙස වල්ලම, හම්බාන හා කප්පර ආදී වූ යාත්‍රා විශේෂ ප්‍රයෝජනයට ගත්හ.[5]

කොළොම්පුරයේ පැවති මාර්ග පිළිබඳ අධ්‍යයනය කිරීමේදී නගරය පුරා විහිදී ගිය වීථි පිළිබඳ අතීත සටහන් ඇත. ඇත්, අස් හා රථ යෑමට තරම් ශක්තිමත්, ඉතා පුළුල් හා ක්‍රමවත් වීථි පැවති බව ගිරා සන්දේශයේ සඳහන් වේ.[6] කෝට්ටේ හා කැලණිය යන නගර අතර අතීතයේ මනා වීථි පද්ධතියක් තිබිණි. රථ ගමන් කිරීමට ගල් අතුරාලූ වීථි හා ඇතුන් ගමන් කිරීමට සුදුසු පරිදි වැලි අතුරාලූ අතුරු වීථි ඒ අතර විය. කෝට්ටේ නගරය පුරා අශ්වයන් නිතර ගමන් කිරීම නිසා අහසට නැගෙන දූලි වලාවන් සහිතය.[7] කැලණියේ මහා වීථියේ රාත්‍රී දර්ශනය පිළිබඳවද සැළලිහිණි සන්දේශයේ වර්ණනා කර තිබේ.[8] සංදේශ කාව්‍ය වීථි හා මාර්ග හැරුණු කොට නගරයේ ආරක්ෂාව සඳහා ඉදිකළ ශක්තිමත් පවුර හා එය වටා ඉදිකළ දිය අගල පිළිබඳ ව නිරතුරු වර්ණිතය.[9]

ජයවර්ධනපුර බලකොටුවේ සිට දකුණු දෙසට බටහිර වෙරළ තීරය ඔස්සේ ප්‍රධාන මාර්ගය පැපිලියාන, අත්තිඩිය, මොරටුව, පානදුර හා කළුතර දක්වා විහිදී ගියේය. මෙම මාර්ගය ඉතා දුර්ලභ වූ ගස්වැල්වලින් සමන්විත බව සමකාලීන මූලාශ්‍රය සාක්ෂ්‍ය දරයි.[10] ජයවර්ධනපුරයේ සිට යාපා පටුන දක්වා උතුරු දෙසට විහිදුණු දීර්ඝ මාර්ගයක් තිබිණි. එය කොන්තගංතොට,[11] කැලණිය, වත්තල, මාබෝල හරහා බටහිර දිග වෙරළ තීරය ඔස්සේ විහිදිණි.[12]

## පෘතුගීසීන් විසින් ගොඩනගන ලද කොළොම්පුර

16 වන සියවස ආරම්භයේ දී කොළොම්තොට බලා පෘතුගීසින්ගේ සම්ප්‍රාප්තිය සිදුවිය. පෘතුගීසින්ගේ ප්‍රථම කාර්යය වී ඇත්තේ මුහුදු වෙරළ අසල තිබූ ගල් පර්වතයක සිය ලාංඡනය හා වර්ෂය සටහන් කොට මෙම දිවයින සිය අධිරාජ්‍යයට අයත් බව තහවුරු කිරීම ය. වර්තමාන ජනාධිපති මන්දිරය හෙවත් රජ ගෙදරට යාබද ව පිහිටා ඇති ගෝර්ඩන් උද්‍යානයට මෙම ස්මාරකය රැගෙන ගිය නමුත්[13] අද වනවිට එය කොළඹ වරායේ ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල ඉදිරියේ තබා ඇත.

පෘතුගීසින් ලංකාවට පැමිණි අවධියේ දී මෙරට රාජ්‍ය මෙහෙය වූයේ viii වන වීර පරාක්‍රමබාහු රජුය. කෝට්ටේ රාජ්‍යයේ විසූ රජු හමුවීමට ලොරන්සෝද අල්මේදා විසින් පෘතුගීසි කපිතාන්වරයකු වූ ෆර්නාඩ් කොට්රිට් නම් දූතයා ඇතුළු පිරිස යවනු ලැබූහ. එහිදී සිංහල සේනාව ඔවුන් වල්මත් කිරීම සඳහා මයිල 6ක පමණ වූ කෙටි දුර යැමට දින 3 ක කාලයක් ගත කර ඇත. මෙයින් අදහස් වනුයේ එම කාල වකවානුවේදී මෙම ප්‍රදේශය ලඳු කැලෑවලින් ගහන දුෂ්කර මාර්ගයන් සහිත බවය.

කොළොම්පුරයේ පෘතුගීසීන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව විමසා බැලීමේ දී ඔවුන් ප්‍රථම වරට කෝට්ටේ රජුගේ අවසරය මත නිරිතදිග දිය කඩනය අසල වෙළඳ ගබඩාව ඉදිකිරීම වැදගත්ය. පෘතුගීසි වාර්තා සඳහන් කරන ආකාරයට එවකට කොළඹ වරාය දකුණු දෙසින් මුහුදට නෙරා ගිය තුඩුව ගොඩබිම දෙසින් උස් කඳු ගැටයක කෙළවරින් අවසන් වී ඇත. මෙම කඳු ගැටයේ පෘතුගීසින් විසින් සිය පෙරදිග ආගමනයට පදනම් වූ මූලික හේතු සාධක සාක්‍ෂාත් කරමින් අසල කැලෑවෙන් සපයා ගත් ලී දඬු හා කොළ ඉති සෙවිලි කර ලෝරන්ස් සාන්තුවරයාට වෙන් වූ දේවස්ථානයක් ඉදිකර ඇත. පෘතුගීසි සමයේදී හා ඉන් පසුවද මෙම ප්‍රදේශය ශාන්ත ලෝරන්ස් කන්ද යනුවෙන් නම් කර තිබේ.[14]

පෘතුගීසින් නිරතුරුව සිය ආරක්‍ෂාව කෙරෙහි යොමු වූ පිරිසක් වූ බැවින් කොළොඹ බලකොටුව ඉදිකර එය ශක්තිමත් කිරීමට ගල් වැටි ද යොදා ඇත. එසේ ම ලෝරන්ස් තුඩුවේ පිහිටීමට සමාන්තර ලෙස ආරක්‍ෂක අට්ටාල ද තනා තිබේ. ආරක්‍ෂාව හා ප්‍රවාහන අවශ්‍යතා මත කොටු බැම්මට දකුණු පසින් ලාපෝද බ්‍රිටෝ නම් සෙන්පතිවරයා විසින් දිය අගලක් කැණ වීය. එය පසුව වත්මන් බේරේ වැව දක්වා ක්‍රමයෙන් වර්ධනය විය. එසේ ම වරායේ සිට කපන ලද තවත් අගලක් මඟින් මෙම බලකොටු ප්‍රදේශය ප්‍රධාන භූමි තීරයෙන් වෙන්කර තිබේ. එනිසා හදිසි අවස්ථාවක් උදාවුවහොත් ප්‍රයෝජනයට ගැනීමට හැකිලිය හැකි ලී දඬුවලින් නිර්මාණය කළ පාලමක් තිබිණි. මෙසේ ද්වාරයක් සහිත ස්ථානය මාපනේ (ගෝල්පේස්) නම් වූ අතර එය ජල අගලෙන් අවසන් විය.[15] 16 වන සියවස මැද භාගය පමණ වන විට කොළඹ බලකොටුව උතුරින් හා බටහිරින් වරායෙන් ද මුහුදින් ද වට වූ අතර දකුණු දෙස දිය අගලකින් ද නැගෙනහිර දෙස වරායේ සිට කපන ලද තවත් දිය අගලකින් ද සීමා වී තිබේ.[16] පෘතුගීසින්ට අවශ්‍ය වූ ආහාරපානාදිය කොළඹ කොටුවට





රැගෙන ඒම කැලණි ගඟ ඔස්සේ අලුතින් කණින ලද ඇළ මාර්ගය ඔස්සේ සිදු විය. එසේ ම මෙම ඇළ මාර්ගය හැර වෙනත් මඟක් එවකට කොටුවට ඇතුළු වීමට පවා නොතිබිණි.[17] පෘතුගීසින් විසින් ඉදි කරන ලද මෙම කොළඹ නගරය, පියවර 400 ක භූමි ප්‍රදේශය වටා ගව් 2 ක පමණ කිඹුලන්ගෙන් ගැවසී ගත් විලක් මඟින් සුරක්ෂිත විය.[18] නගරය මධ්‍යයේ විල මැදින් දිව ගිය ඇළක් හරහා එකල පාලම් 2 ක් ඉදි වී තිබිණි. පවුරු අට්ටාල අසල තවත් එසවිය හැකි පාලමකින් කෙළවර වන දිය අගලක් ද වූයෙන් නගරයේ ආරක්‍ෂාව හා ප්‍රවාහන පහසුකම් ද ඉන් සැලසිණි.

කොළඹ නගරය පෘතුගීසි සමයේ දී ඉතා ක්‍රමවත් සැලැස්මක් මත ගොඩනැගුණුබව පැහැදිලි කරුණකි. නගරයේ උතුරු දෙසට කෙළවර වන ප්‍රකාරයක් හා දිය අගලක් පැවති අතර නො උස් බැම්වලින් වරාය අවට ප්‍රදේශය ද ආරක්‍ෂා විය. නගරයේ දකුණු ප්‍රදේශයේ වෙඩි බෙහෙත් කම්හල ඉදි වූ අතර එය ඇළ මාර්ගය හරහා නගරයෙන් වෙන් කරන ලද ප්‍රදේශයකි.[19]

පෘතුගීසි ලේඛනවලට අනුව එකල කැලණි ගඟේ අතු ගංගාවක් වූ කොළොන්නා ඔය පිටාර ජලය ද රැගෙන මාලිගාවත්තේ වගුරු බිම් මැදින් පැමිණ මරදානේ ශාන්ත සෙබස්තියන් කඳු පාමුලින් කයිමන් දොරටුව දෙසට ගලාවිත් රෙක්ලෙමේෂන් මාවතට සමාන්තර ව ගොස් මුහුදට වැටුණි. පෘතුගීසින් විසින් සාන්ත ජෝන් ගංගාව නමින් මෙය හැඳින්වූ අතර පසුව බේරේ වැව ඉදිකිරීමට මෙම ගංගාවේ ක්‍රියාකාරීත්වය හා එහි ගමන් මඟ බෙහෙවින් උපකාරී විය.[20]

පෘතුගීසි සමයේ දී බංගසාල නම් ප්‍රදේශයේ පොල් අතුවලින් සකස් කළ ගබඩා කාමර කිහිපයක් වූ අතර මෙහි එක් කුඩා වීථියක් හා මාවත් පමණක් දක්නට ලැබිණි. මෙම ප්‍රදේශය අද බංගසාල වීථිය හෙවත් බැන්ක්ශෝල් වීථිය ලෙස ව්‍යවහාර වේ. මෙම ප්‍රදේශයේ අතීතයේ සිට මුස්ලිම් වෙළෙන්දෝ සිය වාණිජ කටයුතුවල නිරත වූහ.

පෘතුගීසින්ට කොළොම්පුරයේ පාලන කටයුතු ගෙන යැමේදී මුහුණදීමට සිදුවූ ප්‍රධාන අභියෝගය වූයේ සීතාවක මායාදුන්නේගේ යුද සංග්‍රාමයන් ය. මායාදුන්නේ හා පසුව ඔහු පුත් සීතාවක රාජසිංහ විසින් කොළඹ කොටුව වටලෑමේ ප්‍රයත්නයක් දියත් කරන ලදී. මාලිගාවත්ත නම්

ස්ථානයේ කඳවුරු බැඳ, සිංහල සේනාව මාලිගාකන්ද ප්‍රදේශයේ රැඳී සිටියහ. මෙකල කොටුවේ සිටි පෘතුගීසින්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයුවේ කැලණි ගඟ හරහා ඇළ මාර්ග ඔස්සේය. ඔවුන්ගේ ප්‍රධාන වෙළෙඳපොළ පිහිටියේ ද මහාදූවේය. මෙම සියලු ප්‍රධාන ගමනාගමන මාර්ග වසා දැමීමට රජු විසින් පියවර ගැනීම නිසා ඔවුහු මහත් අසීරුතාවකට පත්වූහ. එම අභියෝගය හමුවේ සීතාවක රජු විසින් මහා සංග්‍රාමය ඇරඹීය. එම සටන් වත්මන් පිටකොටුවේ නැගෙනහිරින් පිහිටි 5 වන හරස්වීථිය, ගෑස් කර්මාන්තශාලාව, පරණ නගර ශාලාව හා පොදු වෙළඳපොළ පිහිටි ප්‍රදේශය තුළ දියත් විය. මෙම සංග්‍රාමය අතරතුර රාජසිංහ රජු වෙනත් ඇළ මාර්ගයක් කප්පවා කොළඹ වැවේ ජලය බැස්සවීමට පියවර ගත්තේය. මෙම ඇළ මාර්ගය හා ශාන්ත බස්තියන් ඇළ මාර්ගය ද එකල යුද්ධ උපාය මාර්ගයන්හි නෂ්ටාවශේෂ වේ. පසුව සිංහල කඳවුරේ සිට ශාන්ත බස්තියමේ පිහිටි කෝෂ්ටාගාරය දක්වා උමං මාර්ගයක් ද සකස් කර ඇත.[21] කොළඹ නගරයේ පිහිටි ප්‍රධාන වැව පෘතුගීසි සමයේ සිට පැවති එකක් වු අතර එය කිඹුලන්ගෙන් ගහණ වූවක් බවත් ප්‍රධාන ප්‍රවාහන මාර්ගයන්හි කේන්ද්‍රස්ථානයක් බවත් පෘතුගීසි ලේඛනවල නිතර සඳහන් වේ. කැලණි ගඟ ද වඩා වැදගත් වූයේ එය කොළොම්තොට මෝදර අසලින් සාගරයට එක්වන නිසා රට අභ්‍යන්තරයේ සිට වෙරළබඩ දක්වා ප්‍රවාහන පහසුකම් සපයන බැවිනි. ඒ අසල මහාදූව පිහිටි අතර කැලණි නදියේ දකුණු කෙළවර පහළින් ඇති නාගලගම් පටුන ද ඔරුගොඩවත්ත අසල මැද දූව ද කොළොම්පුරයට ඇතුළුවීමේ ප්‍රධාන ප්‍රවේශ මාර්ගය වූ බව සඳහන් වේ.[22]

පෘතුගීසින් විසින් කොළොම්පුරයේ සිය පාලන කටයුතු මෙහෙයවීමේදී ඔවුන්ගේ අවශ්‍යතාවන්ට අනුගත ව නගරය සැලසුම් කොට තිබේ. එහිදී කොටුව හා ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථාන හා නිවාස අතර මාර්ග පද්ධතිය ක්‍රමවත් පරිදි නිර්මාණය කිරීමත් විශේෂයෙන් කැලණි ගඟ හා ප්‍රධාන වැව ආශ්‍රයෙන් ඇළ මාර්ග නිර්මාණය කර ගැනීමෙන් තම දෛනික කටයුතු සඳහා ක්‍රමවත් පරිවහන රටාවක් සකස් කර ඇත. පසුකාලීන ව ලන්දේසීන් හා ඉංග්‍රීසින් විසින් මෙම මාර්ග පද්ධතිය හා පරිවහන රටාවන් ඔවුනට අවශ්‍ය පරිදි වෙනස් කරගනු ලැබුවත් වර්තමානයේ පවා කොළොම්පුර සංචාරය කළවිට පෘතුගීසි සමයේ සැලසුම්කරණයේ අවශේෂ ලක්ෂණ අපට හමු වේ.





## ඕලන්ද ජාතිකයන් විසින් දියුණු කරන ලද කොළොම්පුර

කොළොඹ කොටුව පෘතුගීසින්ගෙන් බේරා ගැනීමට මහනුවර II වන රාජසිංහ රජු ඕලන්ද ජාතිකයන්ගේ සහය ලබා ගත්තේ ය. එහිදි පෘතුගීසීන් පරාජය කිරීමට ඕලන්ද ජාතික ජෙරාඩ් හල්ෆ්ට් නම් අද්මිරාල් ප්‍රමුඛ සේනාවක් කොළඹට නුදුරු ප්‍රදේශයේ හා ශාන්ත බස්තියම් කන්දේ ලැගුම් ගත්හ. 1655 දී ගොඩබිම, මුහුද හා බේරේ වැව දෙසින් කොළඹ කොටුවේ සිටි පෘතුගීසින්ට ප්‍රහාර දියත් කර තිබේ. නමුත් මුල් සටන්වලදී ලන්දේසි හේවායන් හා අද්මිරාල් හල්ෆට් ජීවිතක්ෂයට පත් විය.[23]

එහෙත් මැනවින් සංවිධානගත යුද්ධෝපාය මාර්ග ඔස්සේ පසුව පෘතුගීසීන් පලවා හැරීමට ලන්දේසීන්ට හැකිවිය. ලන්දේසීන් 1656 සිට 1796 දක්වා වසර 140 කට ආසන්න කාලයක් කොළඹ නගරය ඇතුළු මුහුදුබඩ ප්‍රදේශ රැසක පාලනය මෙහෙයවීය. ලන්දේසීහු වූ කලී වාණිජ අධිකාරියක් සහිත ව සිය අපේක්ෂාවන් මුදුන් පමුණුවාලීමට සැලසුම් සහගත ව කටයුතු කළ පිරිසකි. එබැවින් ඔවුන් කොළඹ නගරය සියතට ගැනීමෙන් අනතුරුව ද අඩු පිරිවැයක් යොදා වැඩි ප්‍රතිලාභයක් ලැබීමට සුදුසු පරිසරයක් සැකසීය. ප්‍රථමයෙන් එතෙක් විශාල නගරයක්ව පැවති කොළොඹ නඩත්තු කිරීම අපහසු බැවින් එය 1/3 ක ප්‍රමාණයට සීමා කර ඇත.[24] පිරිවැය අවම මට්ටමක පවත්වා ගෙන යමින් නගරයේ උපරිම ආරක්ෂාව තර කිරීමට පියවර ගත් ලන්දේසීන් ශක්තිමත් පවුරු පදනම් ඉදි කිරීමට පියවර ගනු ලැබීය.[25]

කොළඹ කොටුවට ඇතුළුවීමට ඕලන්ද ජාතිකයන් විසින් ප්‍රධාන ගේට්ටු 3 ක් ඉදි කර ඇත.[26] එම ගේට්ටු Water Gate, Delft Gate හා Gall Gate යනුවෙන් හැඳින්විය.[27] ඕලන්දවරුන්ගේ මුල් සමයේ දී කොටුව හා පිටකොටුව වෙන් කර තිබුණේ ද එළිමහන් බිම් කඩකිනි. එම භූමිය පසු කලෙක වැවේ ජලය හැරවීමෙන් පොකුණක් බවට පත් විය. කොටුවේ සිට උතුරු හා දකුණු දෙසට මේ සමයේ දී ප්‍රධාන වීථි 2ක් තිබිණි. මේ අතරින් වඩා දිගු වීථිය ඍජු වීථියක් නොවූ නමුත් ඉතා පළල් වූ එකකි. මෙම වීථිය දෙපස කුඩා ප්‍රමාණයක නිවාස පිහිටි අතර වීථියේ මැද කොටසේ දේවස්ථාන දක්නට ලැබිණි. කොටුව ඇතුළත ක්‍රමානුකූල වූ ද චිත්තාකර්ශනීය වූව ද වීථි ජාලාවක් පැවතිණි. ඒවා ගස් වැල්වලින් අලංකෘතය. ආණ්ඩුකාරවරයා, නිලධාරීන්, සෙබලුන් හා

වෙළඳුන්ගේ වාස භූමි පිහිටියේ ද කොටුව තුළ ය. ප්‍රාකාරයෙන් පිටත කොටසේ 4000 කට ආසන්න පැල්පත් ප්‍රමාණයක් තිබිණි.[28]

පෘතුගීසින් විසින් පිටකොටුව හෝ කොටුව තුළ ඉදිකළ මාර්ගවලට වඩා පළලින් වැඩි, ඍජු ක්‍රමානුකූල ඒවා තැනීමට ලන්දේසීහු උනන්දු වූහ. කෙළින් වීථිය ලෙස පෘතුගීසින් භාවිත කළ ප්‍රධාන වීථිය ඕලන්දවරුන් කොනිංස් (රජ) වීථිය ලෙස නම් කළ අතර කයිසර් හා කුමාර නමින් තවත් ප්‍රධාන වීථි 2ක් ඉදි කර ඇත. ඒවා මුල් නමින් ම අද ද හැඳින්වීම විශේෂත්වයකි. ක්‍රි.ව. 1723 දී ලන්දේසී සිතුවමක දක්නට ලැබෙන පරිදි මෙම වීථි හා ඒවායේ ගොඩනැගිලි වර්තමානයේ පවා කිසිදු වෙනස්කමකින් තොරව දක්නට ලැබේ.[29] එදා සෙමිනරියක් වූ ගොඩැගිල්ල අද පිටකොටුවේ ප්‍රධාන තැපැල් කාර්යාලය ලෙස ප්‍රයෝජනයට ගැනේ. මෙම ගොඩනැගිල්ල හා කුමාර වීථියේ සුසාන භූමියට දකුණු දිගින් ඇති වෙළඳපොළ වෙන්කළ හිස් භූමිය නිසා පළමුවැනි හරස් වීදිය, මාකට් (වෙළඳ පොළ) වීථිය හා ලෙමර් වීථිය නමින් ද තුන්වැනි හරස් වීථිය ක්‍රැයිස් (හරස්) වීථිය නමින් ද භාවිතය අනුව වෙනස් විය. ඕලන්දවරුන් පැරණි නගර කොටුව හා යා කළ මඟ වැටී තිබුණේ දැනට මහා වීථිය නම් වූ වේල්ල මතය.[30] අද එක් පසෙකින් වරායේ සිට කැනල් රෝ පෙදෙස දක්වාත් අනෙක් පසින් යොර්ක් වීථිය සිට ගොල්බෙක් දක්වා විහිදුණු මාර්ග නිසා කොළඹ කොටුව පරිදිම තවත් ඉතිරි වූ බිම් කොටසක් ද තිබිණි.

17 වන සියවස අඩක් ගත වූ කල කොළඹ නගරයේ සැලැස්ම විධිමත් වූවකි. මුළු නගරයම එකිනෙකට හරස්ව කැපී යන වීථි 2 කින් කොටස් 4 කට බෙදිණි. ඒ හා සමාන්තරව දිවෙන පටු මංමාවත් හා කුඩා මාර්ග සියල්ල ජාලගත විය. කොටු තාප්පයට ඇතුළතින් දිවෙන වෙනත් ප්‍රධාන මාර්ගයක් ඔස්සේ ඔවුන්ගේ සියලුම හමුදාමය පාලන කටයුතු මෙහෙයවීමට අවශ්‍ය පහසුකම් සැලසිණි.[31] සැතපුම් ගණනාවක් ඈතට විහිදී ගිය කොළඹ හා තදාසන්න ප්‍රදේශ සියල්ල එකල පැතලි භූමියක් විය. සාරවත් කුඹුරු, පොල් හා කුරුඳු වතු, තණපිටි මගින් ලංකාවේ බටහිර වෙරළ තීරය අලංකාර කර තිබිණි. එසේ ම මෙම සාරවත් භූමිය තීරුවලට වෙන් කෙරෙන, ගංගා ඇළ දොළ, මංමාවත්, වීථි හා කුඩා වැව් එදා තිබූ බව ලංකාවට පැමිණි විදේශීය සංචාරකයකු වූ පර්සිවල් නැමැත්තා සඳහන් කර ඇත.[32]





වර්තමානයේ දක්නට ලැබෙන වීථි ජාලාවලට බොහෝ දුරට සමාන තත්ත්වයක් ඕලන්දවරුන්ගේ පාලන සමයේ දී පැවතිණි. එදා පැවති වීථි හැඳින්වූ නාමය පමණක් අද වන විට වෙනස් වී ඇත. නිදසුන් ලෙස කැනල් රෝ මාර්ගය එදා සිට පැවතිණි. නමුත් අතීතයේ දී ඊට යාබද ව ජල මාර්ගයක් තිබිණි. ඊට නැගෙනහිරින් පිහිටි යෝර්ක් වීථිය අද ද එසේම ය. මෙය අද්දරින් ජලය අස් කිරීම සඳහා භාවිත වූ ඇතුළු නුවර පිහිටි වරාය හා යා කෙරෙන ස්වභාවික ඇළ මාර්ගයක් පැවති බව බ්‍රෝහියර් මහතා සඳහන් කරයි.[33] වත්මන් බේලි වීථිය සමීපයේ අතීතයේ දී වීදියක් පැවති අතර එය වැතැම් වීථිය ලෙස එදා මෙන් අද ද දක්නට ලැබේ. බේලි වීදිය ඕලන්දවරුන්ගේ කිංග්ස් හවුස් පිහිටි ප්‍රදේශයයි. මෙම බේලි හා යෝර්ක් වීථි මුණගැසෙන තැන ඕලන්දවරුන්ගේ විශාල මන්දිරයක් විය. බේලි වීථියේ සිට මාලිගා වීථිය දක්වා විහිදුණු මෙම මන්දිරය යෝර්ක් වීථියට සමාන්තරව පිහිටා ඇත. කාර්ගිල්ස් මිලර් සාප්පුව පිහිටියේ ද එහි කෙළවරක ය.[34] රැජින වීථියේ ද මේ යුගයට අයත් ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් තිබිණි. මැට්රියල් නම් හිස් භූමිය ආසන්නයේ පූජක ආරාම අඩවිය පෘතුගීසි සමයේ පිහිටා ඇත. ඕලන්දවරුන් පෘතුගීසි දේවස්ථාන විනාශ කළ බැවින් මෙහි කම්හලක් ඉදි කර ඇත. ලන්දේසී කාන්තාවන් රථවාහනවලින් එදා ගමන් කර ඇත්තේ මැලිබන් වීථියේය. වත්මන් මල්වත්ත වීථිය එදා ෆිෂර් (ධීවර) වීථිය නම් විය. හල්ස්ඩෝර්ෆ්හි ඇඳුරුප්පු වීථියේ දේවස්ථානයට නුදුරින් ඉහළ උසාවිය පිහිටා ඇත. 1744 දී නිකුත් කළ හිඩ්ට් ගේ වාර්තාව අනුව හල්ස්ඩෝර්ෆ් පිහිටියේ කොටුවේ සිට කාලතුවක්කු වෙඩිල්ලක දුර කඳු ගැටයකය.[35] රොටර්ඩෑම් නම් පවුරු අට්ටාලය අසල කොටු පවුර මැදින් පැන්නුම් පාලමකින් වහල්දූව (Slave Island) නම් ප්‍රකට භූමි භාගය සඳහා මෙකල ප්‍රධාන වීථියක් පැවතිණි. එය අලංකාර භූමියක් යැයි විශ්වාස කෙරේ.[36]

ඕලන්දවරුන් විසින් මුහුද හෝ වැවක් හෝ නොමැති ස්ථානවල ගැඹුරු දිය අගල් කණින ලදී. සිය මව් භූමියේ ආභාසය සහිත ව ඔවුන් විසින් නිර්මාණය කරන ලද ඇළ මාර්ග හා දිය අගල් වැදගත් ප්‍රවාහන මාර්ගයන් බවට පත්විය. ආරක්ෂාව පතා නැගෙනහිර කොටුවේ මායිම අසල පිහිටි නිසරු බිම ජලයෙන් පිරවූහ. මෙම දිය අගල හා සෙසු ආරක්ෂක ජල ක්‍රමෝපායන වෙයර් නම් ඉංජිනේරුවාගේ විස්මිත නිර්මාණ ලෙස සැලකේ.[37] කොටුව ආරක්ෂාවීමට ද බඳින ලද මිටි තාප්පය වටා ගැඹුරු දිය අගල් කැප්පවීය. එනිසා කොටුව හා ගොඩබිම සම්බන්ධ කිරීමට දිය අගල මතින් ඇකිලිය හැකි

පාලමක් ඉදි කරවීය.[38] මුහුද දෙසින් ද කොටුවට ඇතුළුවීමට ගේට්ටුවක් සවිකර ඇකිලිය හැකි පාලමක් හා සම්බන්ධ කර තිබේ.[39]

මෙරට ලොකු කුඩා ගංගා ඇළදොළ රාශියක් තිබිණි. ඕලන්දවරුන් ඒවා භාණ්ඩ ප්‍රවාහනයට ද යොදා ගෙන ඇත. මීගමුව දක්වා කොළඹ සිට කපන ලද ඇළ මාර්ගය හරහා ස්වදේශිකයන් ද බොහෝ භාණ්ඩ ප්‍රවාහනය කර ඇත. එසේම මෙම ඇළ මාර්ගය නිසා කොළඹ අලුත් මාළුවලින් හිඟයක් නොවූ බව පර්සිවල් සඳහන් කරයි.[40] ඕලන්දවරු ප්‍රථමයෙන් මහනුවර සිංහල රජු මුණ ගැසීමට යෙදුණු දූත මෙහෙවරේ දී ද යුද සංග්‍රාමය දියත් වූ සමයේ දී සැතපුම් 35 ක් පමණ කොළඹ සිට සීතාවක දක්වා කැලණි ගඟේ ඔරුවලින් අවි ආයුධ හා අවශ්‍ය ආම්පන්න ප්‍රවාහනය කර ඇත.[41]

ඕලන්දවරුන් නිර්මාණය කළ බොහෝ ඇළ මාර්ග සිය ආර්ථික අවශ්‍යතා මත පදනම් විය. එහිදී පහත් බිම්වලට ජලය සැපයීමෙන් කෘෂිකර්මාන්තය දියුණු කිරීමට ද අවස්ථාව උදා කර ගැණිනි. 18 වන සියවසේ දී මීගමුව කලපුව විශාල කිරීමත් සමඟ කැලණි ගඟ ගලා බසිනා උතුරු ප්‍රදේශයේ මෝදර සිට මුතුරාජවෙල දක්වා විශාල ඇළ මාර්ගයක් නිර්මාණය කිරීමට පියවර ගෙන ඇත. ඕලන්ද ජාතික ආණ්ඩුකාරවරයකු වූ වැන් ඉම්හොප් විසින් කැලණි ගඟ ගලා බස්නා පහළ තීරයේ කුඩා ගංගා හා ඇළ දොළ හසුරුවා ඇළ මාර්ග දියුණු කරමින් එම ප්‍රදේශය සංවර්ධනය කිරීමට පියවර ගැනිණි.[42] කැලණි ගඟ හා කළු ගඟ අතර ජලය ගෙන යාමට ඇළ මාර්ග ද මෙකල ඉදිවිය. විශේෂයෙන් නැදිමාල හා කෝට්ටේ අතර ඇළ මාර්ග ඉදි වී තිබේ. කොළඹ නගරයේ ඉදි වූ බොහෝ ඇළ මාර්ග කැලණි ගඟේ හා කොළඹ වැවේ ජලය ගෙන යන ලදී. ග්‍රැන්ඩ්පාස් අසලින් බොහෝ ඇළ මාර්ග සාගරයට එක් විය. ශාන්ත සෙබස්තියමේ සිට ග්‍රෑන්ඩ්පාස් දක්වා ද හල්ස්ඩෝප් කන්දේ සිට බ්ලූමැන්ඩල් හා බේරේ වැව දක්වා ද එහි සිට නැවත මෝදර දක්වා ද ජලය රැගෙන යාමට ඉතා වටිනා වාණිජ අගයක් සහිත ඇළ මාර්ග කොළඹ නගරය පුරා විහිදිණි.[43] කැලණි ගඟ පහළ තීරයේ ගංවතුර තර්ජන වැළැක්වීමට හා වාරිමාර්ග කටයුතු දියුණු කිරීමට මුල්ලේරියා වැවේ සිට ද ඇළ මාර්ගයක් නිමවා ඇත. මෙය ලන්දේසීන්ට අවශ්‍ය ආහාරපාන හා වෙනත් ද්‍රව්‍ය රට අභ්‍යන්තරයේ සිට කොළඹ කොටුවට ගෙන ඒමේ ප්‍රධාන ගමන් මාර්ගය විය. මෙම නිර්මාණයේ වටිනාකම වර්තමාන භෞතික දියුණුව හා සංවර්ධන ක්‍රියාවලිය තුළ සිදුවූ වෙනස්කම් හමුවේ හීන විය.





## බ්‍රිතාන්‍යයන් විසින් සංවර්ධනය කරන ලද කොළොම්පුරය

ක්‍රි.ව. 1796 පමණ වන විට බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඕලන්ද ජාතිකයන් පරාජය කර කොළඹ නගරයේ පාලනය සියතට ගන්නා ලදී. ඕලන්ද ජාතිකයන් පලවා හැරීමෙන් ශතවර්ෂයක් පමණ ගත වන තුරු ද නගරයේ සුවිශාල විපර්යාසයන් දක්නට නොලැබේ. පෘතුගීසීන් හා ලන්දේසීන් මෙන් ම මුල් බ්‍රිතාන්‍යයන් ද කොටුව ප්‍රදේශයේ පදිංචි විය. එය වඩාත් නිවාස ඉදිකිරීමට හා පදිංචියට යෝග්‍ය භූමියක් සේ සැලකිණි. මෙම ප්‍රදේශය පවිත්‍රතාව හෙබි, මනා වාතාශ්‍රය සහිත අතිශය සුන්දර, පරිසර දූෂණයෙන් තොර වූවකි.[44] කෝඩිනර් පවසන ආකාරයට මෙම භූමි භාගය සරල සමාන්තර සැතපුම් 1/2 පමණ දුර වීථි 5 කට ද එම වීථි හරහා සෘජුකෝණාකාර තවත් වීථි 5 කට ද බෙදී ගිය මාර්ග පද්ධතියක් සහිත වූ අතර අධික ජනගහනයකින් සමන්විත වූවකි.[45]

කොළඹ නගර සීමාවට බ්‍රිතාන්‍යයන් භාවිත කර ඇත්තේ ග්‍රැවැඩ්ස් යන නාමයයි. මෙය සාගරයෙන් ද බේරේ වැවෙන් ද සම්පූර්ණයෙන් වෙන් වූ ප්‍රදේශයකි. එක් මායිමක ග්‍රෑන්ඩ්පාස් දක්වා විහිදුණු කැලණි ගඟේ මෝය ද නැගෙනහිර දෙසින් බේස්ලයින් පාර ද දකුණු දෙසින් බේස්ලයින් පාර දක්වා වූ ග්‍රීන් පාත් (අද ආනන්ද කුමාරස්වාමි මාවත) සීමාවෙන් ද වට විය. මෙම මාවත ලන්දේසි සමයේදී ගාලුපාර දක්වා විහිදුණු විශාල කුරුඳු යායක් සහිත කෙටි මාවතකින් කෙළවර විය.[46]

ඉන්දියාවේ බ්‍රිතාන්‍යයන් සතු සෑම බලකොටුවක ම පිටතින් ගමක් හෝ නගරයක් පිහිටා ඇත. ඔවුන් එය Pettah යනුවෙන් හඳුන්වා ඇත. මෙම ප්‍රදේශවල බොහෝ කළු ජාතික වෙළඳුන් වාසය කළ නිසා කළු නගරය (black town) ලෙස හඳුන්වා තිබේ. එනිසා කොළඹ ද Pettah හෙවත් පිටකොටුව විය.[47] එම අර්ථයද සහිතව වර්තමානය දක්වා එම ප්‍රදේශය අඛණ්ඩව එනමින් ම හැඳින්වේ. මෙම පිටකොටුව මැදින් දිවෙන මාර්ගයකින් එය දෙකට බෙදිණි. මේ මාර්ගය කොටු තාප්පයකට පිටින් ඇති පිට්ටනියෙන් ආරම්භ වී කයිමන් දොරකඩ අසල ඇති ගඩොල් තාප්පයෙන් අවසන් විය. කොටුව තුළ ප්‍රධාන වීථි 2ක නිසා කොටස් 4 කට බෙදී ඇත.[48]

බ්‍රිතාන්‍ය ජාතික ප්‍රථම ආණ්ඩුකාර ෆ්‍රෙඩ්රික් නෝර්ත් පදිංචි වූයේ ගෙශගෙබර් ස්ලුයිස්කින්ස් නම් වූ තනි මහල් බංගලාවක ය. එය අද කුමාර වීථිය හා යෝර්ක් වීථිය මංසන්ධියේ පිහිටි කාර්ගිල්ස් ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ ඉදි කර තිබිණි. එම ප්‍රදේශය ජනාශ්‍රිත, උෂ්ණාධික වාසයට නුසුදුසු පරිසරයක් වූයෙන් පසුව හල්ස්ඩෝප්වල (Hultsdrop) නව නිවසක් මිලට ගෙන ඇත.[49] මෙම ප්‍රදේශය ද ඔහුගේ සිත් නොගත්තේය. කොස් හා ජම්බු වන ලැහැබ් නිසා මුහුදු සිසිලස නොලැබුණු අතර ඇතැම් විට ජලයෙන් පිරීගිය කුඹුරු හා සනට වැඩුණු ගස් විවරයකින් දිස් වූයේ සමනොල කන්ද පමණක් බව සඳහන් වේ.[50] 1803 න් පසුව නෝර්ත් ආණ්ඩුකාරවරයා හල්ස්ඩෝප්වල නිවසින් ඉවත් වී ශාන්ත බස්තියමේ වෙඩි බෙහෙත් ශාලාව තිබූ තැන නව නිවසක් නිර්මාණය කර ගත්තේ ය. පසුව හල්ස්ඩෝප්වල පිහිටි නිවස කොළඹ නගරයේ ප්‍රධාන රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යාල හා මහජන කාර්යාල සඳහා ද රජය විසින් ගොඩනැංවූ නව වෙළෙඳපොළට ද වෙන් විය. මෙම ඉඩම ඇළ මාර්ගයට සමීපයේ පිහිටි බැවින් වටිනාකමින් හා පහසුකම්වලින් ද අනූනය.

නෝර්ත්ට පසුව මෙරටට පැමිණි බ්‍රිතාන්‍ය ජාතික ආණ්ඩුකාරවරයා වූයේ තෝමස් මේට්ලන්ඩ් ය. ඔහු ගම්බද පෙදෙසකට වඩාත් රුචිකත්වය දක්වූ බැවින් එවකට නිසංසල ප්‍රදේශයක් වූ ගල්කිස්සේ සිය මන්දිරය ඉදි කරවූයේය. පසුව ලන්දේසි ආණ්ඩුකරවරයකු වූ ජෝන් ජෙරාඩ් වැන් එංගල්බෙක්ට අයත් වූ වර්තමානයේ කොළඹ ගාලු පාරට මුහුණලා පිහිටි මාලිගයක් කුලියට ගෙන ඇත. ප්‍රධාන වීථියේ පිහිටි දෙමහල් ගෙඩනැගිල්ලක් වූ මෙය වඩාත් පහසුකම් සහිත මන්දිරයක් වූ අතර මෙහි සඳළුතලයේ සිට මුහුදු වෙරළ තීරය ද අනෙක් පසින් බේරේ වැව, පිටකොටුව, කුරුඳු වතු හා සමනල කන්ද දක්වා රට අභ්‍යන්තරයේ භූමි භාගය ද මැනවින් දර්ශනය විය. වික්ටෝරියා රැජින සිංහාසනාරූඪ වූ පසු මෙය රජගෙදර ලෙස හැඳින්වීය.[51] බ්‍රිතාන්‍යයන්ගේ ආගමනය සමඟ නවීන විලාසිතාවන් සහිත නාගරික සමාජ පන්තිය බිහි වූ අතර එහිදී පන්ති පරතරය නිවාස හා ගොඩනැගිලිවල බාහිර පෙනුමින් ද පැහැදිලි විය.[52] කොළඹ නගරය වාණිජ නගරයක් බවට වර්ධනයවීමත් සමඟම ඉඩම්වල මිල ගණන් ද සැලකිය යුතු ප්‍රමාණයෙන් ඉහළ ගොස් තිබේ.[53]

කොළඹ වාණිජ මධ්‍යස්ථානයක් බවට පත්වූයේ බ්‍රිතාන්‍ය පාලනය පැවති අවසාන කාලවකවානුවේදී ය. එබැවින් ක්‍රමවත් මාර්ග පද්ධතියක් මෙකල නිර්මාණය කෙරිණි. කොටුව හා පිටකොටුව අද මෙන් එදා කෙළින්





වීථිය හරහා සම්බන්ධ විය. කෙළින් වීථියට දකුණු දෙසින් පොල් වත්තක් හා වැව තිබිණි. බේලි වීථිය කොටුවේ පිහිටි වඩාත් ම ජනාකීර්ණ කලබලකාරී මාර්ගය විය. ඊට තරමක් දුරින් සමාන්තරව චැතැම් වීථිය පිහිටා ඇත. මේ වීථිය දිගේ දිවා රාත්‍රී නැව්ගත කිරීමට අවශ්‍ය භාණ්ඩ රැගෙන කරත්ත ඇදී යයි.[54] බ්‍රිතාන්‍ය පාලනය මුල් යුගයේදී භාණ්ඩ ප්‍රවාහනයට තරම් සුදුසු ශක්තිමත් මාර්ග හෝ පාලම් නොතිබුණි. කබොක් ගල් ඇතුරූ ගුරු පැහැ ගත් මාර්ග තිබිණි. කොළඹ සිට ගාල්ල දක්වා විහිදී ගියේ බොරලු සහිත පාරකි.[55] පිටකොටුවේ වීථි දහවල් කාලයේ අශ්ව රථ ගමන් කිරීමට කිසිසේත් නොහැකි තරම් ජනාකීර්ණ වූ අතර වෙළඳුන් එය අරක් ගෙන ඇත. ජනාශ්‍රිත කොළඹ බිම් ප්‍රමාණයෙන් වර්ග සැතපුම් 20කට වැඩි ප්‍රමාණයක් උසස් පන්තියේ ධනවතුන්ට වෙන් වූ අතර එම ජනාවාස පඳුරු අතරින් දිවෙන විශේෂිත මාර්ග පද්ධතියක් පැවතිණි. කොළඹ කොටුව ප්‍රදේශයේ සිට සැතපුම් භාගයක් පමණ රට තුළට යන විට කුරුඳු වත්ත පිහිටා ඇති අතර එය පොල් ගසින් සෙවණ වූ කුරුඳු වගාව හොඳින් කෙරුණු තැනිතලා භූමියක් වූ අතර එය වටා දිව යන ගුරු පැහැති අතුරු මාර්ග ඉතා අලංකාර ඒවාය.[56]

බ්‍රිතාන්‍ය පාලන සමයේ මුල් අවධියේදී නගරයේ මාර්ග ගමනාගමනයට සුදුසු පරිදි ක්‍රමවත් සැලසුමක් සහිතව සකස් නොවිණි. පසුව මිනින්දෝරුවකුගේ පදනම් රේඛාවක් ලෙස ඉදි වූ බේස්ලයින් මාවත කදිම මාර්ග සැලැස්මකි. 1901 සිට කොළඹ හා තදාසන්න ප්‍රදේශවල මුදලිවරුන් විසින් රජයට ප්‍රධාන මාර්ග, පටු මාර්ග හා අතුරු මංමාවත් පිළිබඳව වාර්තා කර එහි නඩත්තු කටයුතු පිළිබඳව උනන්දු වී ඇත.[57]

කැලණි ගඟට හා දකුණු දෙසින් බොල්ගොඩ ගඟට ජලය බැසයාමේ ක්‍රමවේදයක් බ්‍රිතාන්‍යයන් විසින් සකසන ලදී. කෝට්ටේ හා ඒ අවට වැව්වලින් ගලා එන ජලය ඇළ මාර්ග ඔස්සේ බේරේ වැවට එක් වී ඒ හරහා මුහුදට ගලා යැමට සැලැස්වීය. එහෙත් බ්‍රිතාන්‍ය පාලන සමය අවසානයේ සිදුවූ නාගරීකරණය හා කාර්මීකරණය හේතුවෙන් මෙම ඇළ මාර්ග බොහෝමයක් ගොඩකර නව මාර්ග තැනීම නිසා නගරය ආශ්‍රිත දිය උල්පත් බොහෝමයක් සිඳිණි. කෝඩිනර්ගේ වාර්තාවේ ද 1802 දී කොළඹ නගරයේ උතුරු දෙසින් කැලණි ගඟට සම්බන්ධ වන ප්‍රධාන ඇළ මාර්ගයක් දැක්වේ.[58]

1940 දී පමණ ප්‍රථම වරට කොළඹ නගරය ක්‍රමවත් පරිදි සැලසුම් කිරීමට බ්‍රිතාන්‍ය රජයට යෝජනා ඉදිරිපත් විය. එහිදී කොළඹ නගර සභාව ක්ලිෆර්ඩ් හොලිඩේ නම් නිලධාරියා ප්‍රමුඛ පිරිසගෙන් වාර්තාවක් කැඳවීය. එහිදී කොටුව හා පිටකොටුව අතර හිතුමතේට ගොඩනැගිලි ඉදි කිරීම නිසා ක්‍රමවත් බව හා සුන්දරත්වය විනාශවීම පිළිබඳවත් ජල මාර්ග විනාශ කිරීම පිළිබඳවත් දීර්ඝ ව සාකච්ඡා කර ඇත. එබැවින් සැලසුම්සහගත, ක්‍රමවත් මාර්ග පද්ධතියක් ගොඩනැංවීමේ අවශ්‍යතාව එහිදී අවධාරණය කර තිබේ.[59]

## කොළඹ නගරයේ ප්‍රධාන ජනාවාස, වීථි හා ස්ථාන

යුරෝපීයයන් මෙරටට පැමිණීමට පෙර පටන් කොළොම්තොට ආශ්‍රිත ව වෙළඳ කටයුතුවල නිරත වූ මුස්ලිම් ප්‍රජාවක් වූහ. ඔවුන්ගේ වාස භූමිය පැරණි හා නව යෝන් වීදිය ආශ්‍රිත ව පිහිටා ඇත. ඉන්දියාවේ සිට සංක්‍රමණය වූ චෙට්ටියාර්වරුන් හෙවත් චෙට්ටිවරුන් කොළඹ වරාය සමීපයේ සිය වාසස්ථාන හා වෙළඳ ව්‍යාපාර ඉදි කර ඇත්තේ හෙට්ටිවීදිය ප්‍රදේශය ආශ්‍රිත ව ය. කොළඹ උපනගරයක් ලෙස පසුකාලීන ව වර්ධනය වූ වැල්ලවත්ත දෙමළ ජනතාව ඒකරාශී වූ ප්‍රදේශයයි. සිංහල මුදලිවරුන් හා ප්‍රභූන් සිය වාසභූමිය ලෙස තෝරා ගෙන ඇත්තේ වුල්ෆෙන්ඩෝල් පෙදෙසයි. ඔවුන්ගේ ආරක්ෂක ලස්කිරිඤ්ඤා හේවායෝ ලස්කිරිඤ්ඤ වීදියේ පදිංචි වූහ. පිටකොටුවේ විසූ සීමිත පිරිසක් වූ බර්ගර්වරු ජම්පටා හා බාබර් වීථි ආශ්‍රිත ව විසූහ. මෝදර ප්‍රදේශයේ ජීවත් වූයේ විලාසිතා ඇගයූ නවීන පන්නයට හැඩ ගැසුණු බ්‍රිතාන්‍ය සිරිත් විරිත් වැළඳගත් පිරිසය. ඔවුන්ගේ නිවාස වත්මන් නැව් තටාකයේ කොටසක්ව පැවති ලුණුපොකුණ ප්‍රදේශයේ පිහිටා ඇත.[60] මේ අවට විස්ට් බංගලාව, මෝදර නිවාස, රොක් හවුල් හා එලිහවුස් මන්දිරයන් ද පිහිටා ඇත. එහෙත් පිටකොටුවේ සිට උතුරු දෙසට ගමන් කිරීමේදී ස්වදේශිකයන් වාසය කරන මැටියෙන් තැනූ නිවාස විශාල ප්‍රමාණයක් හමුවේ. කුරුඳු වත්ත ප්‍රදේශයේ නවීන මන්දිර ඉදිවූවත් අවට ඝන කැලෑව හා කුරුඳු වතු නිසා ග්‍රාමීය පරිසරය තවදුරටත් සුරැකිණි.[61] වැලි කතරක් සහිත ප්‍රදේශය මරදාන වූ අතර එහි හොඳම කුරුඳු වර්ගය වගා කෙරිණි. මල්ගොමු සහිත ප්‍රදේශය යන අරුත සහිත බ්ලූමැන්ඩෝල් පිහිටියේ කොළඹට උතුරු පෙදෙසිනි. මෙහි ආදර්ශ ගොවිපළක් වූ අතර ඊට අවශ්‍ය ජලය ඇළ මාර්ග ඔස්සේ සැපයිණි.[62] කොම්පඤ්ඤ වීදිය කොටුවට සම්බන්ධ කර තිබුණේ පාලම්වලින් හා දිය කඩිති මැදින් වට වූ පටු මාර්ගයකිනි. මෙහි බ්‍රිතාන්‍ය යුගයේ පවා වහලුන් සිරකර





තැබීය. මෙය ග්‍රාමීය නොදියුණු ප්‍රදේශයක් ලෙස සැලකේ. මෙසේ සරල ව පැවති ජනාවාස කෝපි වගාව දියුණුවීමත් සමඟ වෙනස් විය. බ්‍රිතාන්‍යයන් විසින් නිරිතදිග දිය කඩනය බැඳ කොටු බැමි ඉවත් කිරීම හා දිය අගල පස් පිරවීමෙන් කොළඹ නගරයේ සැලැස්ම වෙනස් වූ අතර එහිදී ලෙහෙසියෙන් ළඟා වීමට හැකි පරිදි නව මාර්ග පද්ධතියක් ඉදි විය. මෙය 1869 දී ශ්‍රීමත් හර්කියුලස් රොබින්සන් ගේ (රොස්මීඩ් සාමි) අවසරය මත සිදු කෙරිණි.[63]

කොළඹ නගරයේ ප්‍රධාන ජනාවාස පිහිටි ප්‍රදේශ හැරුණු කොට වීථි දහසකට වඩා තිබේ. පැරණි සෑම වීථියක්ම අතීත සිහිවටනයක් හා බැඳී පවතී. යුරෝපීයන්ගේ පැමිණීමත් සමඟ කොළඹ නගරයේ හා ඉන් පිටත වීථි නම් කිරීමේදී යම් ක්‍රමවත්භාවයක් දක්නට ලැබිණි.[64] එනම් පෘතුගීසින්ගේ සම්ප්‍රදාය වූයේ කන්‍යාරාමයක්, දේවස්ථානයක් සාන්තුවරයකුගේ නමකින් අසල වීථිය හැඳින්වීම ය. උදා:- ග්‍රෑන්ඩ්පාස් (ග්‍රෑන්ඩෙ පාසෝ), කෙලින් වීදිය (රොආ ඩිර්ටෝ) ලන්දේසීන් වීථි නම් කිරීමේ දී ඉන් පෙර පෘතුගීසින් යෙදූ නම් එසේම පවත්වා ගැනීමට රුචිකත්වයක් දක්වූ නමුත් සිය දේශයේ ස්ථාන, හා ආණ්ඩුකාරවරුන්ගේ නම් යෙදීමට ද පෙලඹිණි. උදා:- හර්ෆට් අද්මිරාල්ගේ නාමය, ලේඩන් බෙල්ෆ්ට් ස්ථාන නාමය එපරිදි ය. එසේම හර්ඩ්ස්ඩෝප් (අලුත්කඩය), කයිමන් දොරටුව (කිඹුලන් ගහන වීම) හා වුල්ෆොන්ඩොල් (ආදුරුප්පු වීදිය) ආදී වීථි හා ස්ථාන නාම ලන්දේසීන් භාවිත කර ඇත.

බ්‍රිතාන්‍යයන් විසින් වීථි හා ස්ථාන නාම යෙදීම ආකාර කිහිපයකින් සිදුවිය.[65] එහිදි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් සිහිවීමට ගිල්ෆර්ඩ් චන්ද්‍රවංකය, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය ආදි නම් යෙදී ය. එසේ ම ප්‍රධාන මාවත් ද ආණ්ඩුකාරවරුන් නමින් වෙන් විය. එනම් උදා:- සර් හෙන්රි වොඩ් මාවත, ටොරින්ටන් සාමි මාවත හා සර් එඩ්වඩ් බාන්ස් මාවත ආදියයි. දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ව මෙසේ නම් යෙදීම වෙනස් වී සිංහල රජවරුන්ගේ නම් භාවිත විය. උදා:- දුටුගැමුණු මාවත, ගජබා මාවත හා පරාක්‍රමබාහු මාවත, පසුව ශ්‍රී නාමය වීථි නාම සඳහා යෙදීමට කටයුතු කර ඇත. එනම් ශ්‍රී ධම්ම මාවත (කැම්බල් පාර), ශ්‍රී ධර්මකීර්ති මාවත (ඇල්බට් පෙදෙස), ශ්‍රී සංඝරාජ මාවත (ස්කිනර් මාවත) විය. බ්‍රිතාන්‍ය රාජකීය පවුලේ නාමය සහිතව ද වීථි නම් විය. උදා :- රැජින වීථිය, කුමාර වීථිය, වේල්ස් කුමර වීථිය, වික්ටෝරියා උද්‍යානය ආදියයි.

මෙරට නගරාධිපතිවරුන් හා නාගරික සභිකයන් වෙනුවෙන් ද විථි නාම දැක්වීය. සර් ඩී.වී. ලෙයාර්ඩ් මාවත, ඒ.ඊ. ගුණසිංහ මාවත, ජෝර්ජ්. ආර්. ද සිල්වා මාවත ආදිය වේ. එසේම ප්‍රධාන බිම් සලකුණු, ආසන්න රජයේ ගොඩනැගිලි ආදිය පදනම් කර ගනිමින් ද මාර්ග නම් කර ඇත. එනම් වේල්ල විථිය, කච්චේරිය පාර, උසාවි පාර, කොඩිගහ විථිය හා වැව පාර ආදියයි. වෙළඳ විථි ද මෙකල පැවතිණි. එනම් පනික්කි විථිය, ලෝකුරු විථිය හා කොම්පඤ්ඤ වීදිය ආදිය එබඳු ය. ජාති, ගෝත්‍ර හා රටවල් වෙනුවෙන් ද මෙකල විථි නම් කර ඇත. එනම් චීන විථිය, හෙට්ටි විථිය අලුත් යෝන් හා පරණ යෝන් විථිය, කොච්චිකඩේ, හා ජාවා පටුමග ඊට නිදසුන් වේ.

සමතලා බිම් පෙදෙස් හැඳින්වීමට පිටිය යන නාමය එක් කර ඇත. එම් බම්බලපිටිය, නාරහේන්පිටිය, ජිත්තුපිටිය හා කොල්ලුපිටිය ඊට නිදසුන් ය. තව ද වත්ත යන නාමය ද අගට යෙදුණු විථි ඇත. වැල්ලවත්ත, කොස්වත්ත, කුරුඳුවත්ත, මාලිගාවත්ත, කෙසෙල්වත්ත, කුප්පියාවත්ත හා පංචිකාවත්ත නිදසුන් කිහිපයකි. මීට අමතර ව වෘක්ෂලතා හා පුෂ්පනාම සහිත ව ෆල්වර් රොඩ්, ඇලෝයි රොඩ් ද මසන්ගස් පිහිටීම නිසා මසංගස් විදිය හා මාදන්ගස් නිසා මාදම්පිටිය ද දෙමට ගස් පිහිටි දෙමටගොඩ ද තිඹිරිගස් පිරි තිඹිරිගස්යාය ද මීට කදිම නිදසුන් කිහිපයකි.

මෙම ප්‍රධාන මාර්ග හා සෙසු විථිවල තත්වය පිළිබඳ ව සැලකීමේදී ද පොදුවේ මාර්ගවලින් 2/3 කට ආසන්න ප්‍රමාණයක් රතු බොරලු සහිත වූ බව කොටුව හා පිටකොටුව ආශ්‍රිත ව ඉදි වූ මාර්ගවලින් තහවුරු වේ. කරත්ත ගමන් කිරීමට යෝග්‍ය පරිදි ඇතැම් මාර්ග ගල් අතුරා තිබූ අතර බොහෝ මාවත් මඩ හෝ දූවිලිවලින් ගහන විය. ප්‍රමාණවත් පළලින් යුත් මාර්ග වූයේ රැජින වීදිය, යෝක් වීදිය, චැතම් වීදිය, බුලර්ස් පාර හා යුනියන් පෙදෙස පමණි.[66] බොහෝ මාර්ගවල පදික වේදිකා ඉදි නොවීය. එකල වැල්ලවත්ත ප්‍රදේශය කෙතරම් නොදියුණු තත්ත්වයක පැවතියේ ද යත් උරගයන් පිරි ඝන කැලෑවක් විය. එහෙත් අද වන විට එම ප්‍රදේශ අතිශය ජනාකීර්ණ ය. 1848 දී මාර්ග ආඥා පනත පැනවීමෙන් අනතුරු ව නව වාණිජ ආර්ථික රටාව හමුවේ බ්‍රිතාන්‍යයන් විසින් නගරය තුළ හා ඉන් පිටත විථි හා මාවත් බහුල ලෙස ඉදි කරන ලදී.[67]





## බේරේ වැව සහ වහල් දූපත

කෝට්ටේ රාජධානි අවධියේ සිට කොළඹ නගරයට පිවිසිය හැකි විලක් පිළිබඳව සාකච්ඡා වේ. විජයබා කොල්ලය පැවති අවස්ථාවේදී පෘතුගීසි ජාතීන් හා කොල්ලකරුවන් පිළිබඳ විස්තර කරන විටදී ප්‍රධාන දොළක් පිළිබඳව ක්වේරෝස් වාර්තා කර ඇත.[68] මෙම දොළපාර තෙක් නගරය වටා ආරක්ෂිත වැවක් ඉදිකර තිබූ බව තවදුරටත් පෙන්වා දෙයි. මේ වැව පෘතුගීසි පාලන සමයේදී සාන්ත බස්තියම, අලුත් කඩේ (Hulldts drop) ආදූරිප්පු (වුල්ෆෙන්ඩෝල්) නම්වලින් හැඳින්වෙන කඳු ගැට තුනෙහි පාමුල තෙක් විහිදී පැවතිණි.[69] ශාන්ත ජෝන් ඇළ වර්තමානයේදී වැවේ දිය මුහුදට ගෙන යන ප්‍රධාන වාරි මාර්ගයකි. වේල්ල වීථිය යන නාමය ලැබී ඇත්තේ ද මෙහි පැරණි වේල්ල නිසාවෙනි.

පෘතුගීසීහු සීතාවක සිංහල රජුන්ට එරෙහිව සටන් කළහ. ඒ අවස්ථාවේදී රාජසිංහ රජු කොළඹ නගරය වටලා ඇළ මාර්ග මගින් මෙම වැවේ ජලය පතුලට ම හිස් කර ඇත. මෙම බේරේ වැව තුළ උග්‍ර පෘතුගීසි-ලන්දේසි සංග්‍රාම ද දියත් විය. පෘතුගීසීහු විසිරී ගිය පවුරු පදනම් වෙනුවට වැව කෙළවර දක්වා නව ආරක්ෂක වැටක් ඉදි කර වූහ. ඉන් පිටත පහත් බිම් හාරා වැව කයිමන් දොරකඩ දක්වා පුළුල් කර ඇත. මෙම වැව කිඹුලන්ගෙන් සමන්විත වූ බැවින් එහි කෙළවර කයිමන් දොරකඩ නමින් ප්‍රකට විය. ලන්දේසි සමයේදී කොටුවේ ඉදිරිපස යාර 500 ක් හෝ 600 ක් දක්වා පළල් ගොඩබිම් තීරුව පසු කළ විට ඇරඹෙන මෙම වැව සැතපුම් 3 ක් හෝ 4 ක් දක්වා විහිදේ. වැව පටන් ගන්නා තැන සිට කොටුව දෙසට රහස් උමඟක් තැනීමට ද ලන්දේසීන් කල්පනා කර ඇත.[70] 1665 දී ලන්දේසීන්ට එරෙහි ව පෘතුගීසීහු සටන් මෙහෙයවූහ. ඔවුන් තාල වර්ග ලී දඬු ගෙන ඒමට හා ගිනි මෙලවීමට ද්‍රව්‍ය හිඟ වූ බැවින් වෙඩිපර ගසේ පට්ටා ගැනීමට මෙම වැව ප්‍රයෝජනයට ගෙන ඇත.[71]

බේරේ වැව කොළඹ නගරයේ ප්‍රසන්නබව කෙරෙහි බෙහෙවින් වැදගත් වූ නමුදු එය දීර්ඝ කාලයක් නොසලකා හැරීම නිසා අපවිත්‍ර විය. 1904 දී පත් කළ කමිටුවක් මගින් බේරේ වැව, ඇළ මාර්ග හා දියවේලි මඟින් වරායට සම්බන්ධ කිරීමට යෝජනා ඉදිරිපත් විය. එහෙත් 1905 දී එය සාර්ථක ක්‍රියාවක් නොවන බව තීරණය වූ අතර වැවෙන් ප්‍රයෝජනය ගැනීම තවදුරටත් පමා

විය. 1905 ඉංජිනේරු වාර්තාවලට අනුව වැව අක්කර 416 ක් පමණ දියෙන් යට වී තිබුණ ද එය පසුව ක්‍රමයෙන් සීමාසහිත විය. 1911 ජනවාරි 28 දින මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත කොළඹ නගර සභාව විසින් යවන ලද ලිපිවල කොළඹ වැවේ විනාශයට පත් කොටස් නිශ්චිත හඳුනා ගෙන ඊට නිසි පිළියම් යෙදීම පිළිබඳව ද මෙම වැව ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය කිරීමට පියවර ගැනීම සම්බන්ධයෙන් ද බොහෝ තොරතුරු ඇත.[72] අදට වඩා විශාල ජලාශයක් වූ මෙය විනෝදාත්මක පාරාදීසයක් විය. ඔරු, කුඩා යාත්‍රා, බෝට්ටු හා හම්බන් ආදි ජල යාත්‍රා නිරත මෙම වැවෙහි දක්නට ලැබිණි.[73] වැව් ඉවුරු අසල විලා නිවාසවල වැසියන් රාජකාරියට යෑමට ද වැව හරහා කුඩා ඔරු භාවිත කළ අතර රාත්‍රියේ මෙහි සුන්දරත්වය අගනේය.

බේරේ වැව තුළ දූපත් කිහිපයක් ම පිහිටි නමුත් ඉන් බොහෝමයක් අද දක්නට නොලැබේ. මෙහි මැද රජකයන්ට ප්‍රයෝජනවත් දූවක් තිබිණි.[74] එය අතීතයේ දී වහල් දූව (Slave Island) නමින් හැඳින්විණි.[75] එහි විශාල කුරුඳු වත්තක් තිබුණු අතර පොල් ගස් 600 ක් සහිත විශාල භූමියක් විය. කැලණි ගඟේ ඉහළ සිට ඔරු මගින් ආහාර, එළවළු, පලතුරු හා වෙනත් ද්‍රව්‍ය කොළඹට ගෙන ඒමෙන් පසුව පිටකොටුව හා කොටුව ඇතුළු තදාසන්න ප්‍රදේශවලට ඒවා බෙදා හරින මධ්‍යස්ථානය බේරේ වැව මැද පිහිටි දූව තුළ තිබුණු බව විශ්වාස කෙරේ.[76]

වහල් දූවේ පෘතුගීසි පාලන සමයට අදාළ තොරතුරු විමසා බැලීමේදී මෙරට වහල් සේවය කළ කාපිරි ජනතාව මෙහි රැඳ වූ බවට තොරතුරු දක් වේ. ඔවුන් ලන්දේසීන් යටතේ ද සේවය කළ අතර මෙරට මාර්ග තැනවීම, නගරය ඉදි කිරීම, ආරක්ෂාව සැලසීම ඇතුළු විශාල සේවාවක් ඔවුන්ගෙන් ඉටු විය. 18 වන සියවස වන විට කොළඹ නගරයේ සැලකිය යුතු ප්‍රමාණයක කාපිරි සංඛ්‍යාවක් සිටි නිසා කැරැල්ලක් ද ඇති විය. ඔවුහු රාත්‍රී කාලයේ බේරේ වැව සමීපයේ හුදකලා ප්‍රදේශයක රැඳවූහ. එය දූපතක් ලෙස සාවද්‍ය ලෙස අවබෝධ කර ගෙන ඇති බැවින් වහල් දූපත Slave Island යන නාමය භාවිතය නිවැරදි නොවන බව බ්‍රෝහියර් මහතා පෙන්වා දෙයි.[77] මෙම දූපත හා මුහුද තීරය බෙදෙන බිම් තීරුවක් වූ අතර එය ගාලු මුවදොර ලෙස හැඳින්වේ.[78]





## කයිමන් දොරටුව (Kayman Gates)

17 හා 18 වන සියවස් අතර කාලයේ දී කොළඹ කොටුවේ නැගෙනහිර ප්‍රදේශයේ පිහිටි ආරක්ෂිත ප්‍රවේශය වූයේ කයිමන් දොරකඩ ය. පෘතුගීසි හා ලන්දේසි පාලන සමයේදී බේරේ වැවේ සිට වරාය දක්වා පිවිසීමේ දී මෙම දොරටුව ඔස්සේ යා යුතුය. මෙම ස්ථානයට කෙයිමන් යන නාමය යෙදුණේ බේරේ වැවේ සිටි විශාල කිඹුලන් මෙතැනට රැස්ව සිටින බැවිනි.

16 වන සියවසේදී මෙම ස්ථානයේ පෘතුගීසි දේවස්ථානයක් ඉදි වූ අතර එහි දැවැන්ත සීනු කණුව අදට ද ඉතිරි වී ඇත. ලන්දේසින් විසින් එම දේවස්ථාන විනාශ කළ පසු ඉතිරි වූ මෙම සීනුව නාද කිරීමෙන් කොටුව හා පිටකොටුව අතර ඉදි වූ හැකිළෙන ලී පාලම හා ගේට්ටුව විවෘත කිරීම හා වැසීම සංඥා විය.[79] එහෙත් බ්‍රිතාන්‍ය යුගයේදී මෙම සීනු කණුව වුල්ෆෙන්ඩෝල් පල්ලියට අයත් වූ අතර මෙම ස්ථානය වැරදිකරුවන්ට දඬුවම් දීමට ද යොදා ගැනිණි. ලන්දේසි සමයේ දී දේශීය-විදේශීය මුදල් මාරු කරන්නන්ගේ හා මුදල් පොළියට දෙන පිරිසගේ රහස් හමුව සිදුවූයේ මෙහිය. ලන්දේසීන් විසින් උඩරට රාජධානියේ සිට පැමිණෙන රාජකීය දූතයන් පිළිගැනීමට විශාල මන්දිරයක් ද මෙහි ඉදි කරවීය.[80] මෙම ප්‍රදේශයේ දේශගුණය ද ඉතා උෂ්ණාධිකය වූ අතර මේ හරහා විශාල මංමාවත් ද වැටී තිබිණි. එසේම ස්වදේශිකයන් විසින් පවත්වා ගෙන යන ලද එළවළු, පලතුරු හා කරවල ආදිය පිරි වෙළඳපොළ පිහිටියේ මෙම ප්‍රදේශයේය.

## ගාලු මුවදොර පිටිය

බේරේ වැව ආසන්නයේ ගාලු මුවදොර පිටිය ඇත. කන්ද උඩරට සමඟ සටන් කොට මියගිය බ්‍රිතාන්‍ය සෙබළුන් මිහිදන් කිරීමට භූමියක් අවශ්‍ය වූ නිසා එදා දකුණු මළුව නම් වූ මෙම ප්‍රදේශය ඒ සඳහා යොදා ගැනිණි.[81] එහෙත් පසු ව 20 වන සියවසේ තුන්වන දශකයේදී එම භෂ්මාවශේෂ කොළඹ කනත්තේ තැන්පත් කෙරිණි. ගාලු මුවදොර දෙවැනි ලෝක සංග්‍රාමයේදී නැවත යුද හමුදා කඳවුරක් වූ අතර ප්‍රසිද්ධ දඬුවම් ලබා දුන්නේ ද මෙම ස්ථානයේදීමය. කොටුවෙන් බැහැර වී දකුණු දෙසට මුහුණලා පැමිණෙන විට හමුවන මෙම මනස්කාන්ත තණ පිට්ටනිය පිළිබඳ ව කේව් නම් විදේශිකයා ද සඳහන් කර ඇත.[82]

1850 දී ගාලු මුවදොර පිටිය නොයෙක් ධනවතුන් හා නිලධාරීන්ගේ වාහනවලින් සමන්විත විය. මෙහි හයිඩ් නම් උද්‍යානයක් වූ අතර අසල තුරඟ තරඟ පිටිය ද පිහිටා ඇත. මෙහි දකුණු කෙළවර ශීඝ්‍රයෙන් දියුණුවන කොල්ලුපිටිය ඇත. 1853 දී හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා විසින් මෙම පිටිය අබියස ඇති සක්මන් මළුව නිර්මාණය කළේ ය. කොළොම්පුරයේ කාන්තාවන්ට හා දරුවන්ට නිර්මාණය කළා වූ විනෝද උද්‍යානයකි.

## වුල්ෆෙන්ඩෝල් පල්ලිය

Wolveended හෙවත් වෘකයන්ගේ තැන්න යන අදහස මෙම ප්‍රදේශයට ආරූඪ වී ඇත. මෙහි දී පෘතුගීසින් විසින් භාවිත කරන ලද ආක්මා-ඩෙ-ලුප් යන පදය ලන්දේසි පරිවර්තනයේ දී මෙම අදහස සහිතව ඉදිරිපත් විය. මෙහි කඳු මුදුනත පිහිටි 'ග්වාඩෙලූවෙ' නම් දේව මෑණියන්ගේ දේවස්ථානය යන පද පෙරළීමෙන් මෙම ආරූඪ නාමය සැකසිණි.[83] කෙසේ හෝ මෙම ප්‍රදේශය සිංහල-දෙමළ භාෂාවෙන් ආදිරිප්පු හෙවත් ආදිලිප්පු වීථිය ලෙස අද දක්වා භාවිත වේ.

මෙම දේවස්ථානය 18 වන සියවසේ මැද භාගයේ ඉදි කර ඇති බව හෙයිඩ්ට්ගේ විස්තරයේ දැක්වේ.[84] මෙහි පෘතුගීසි සමයේ ද පල්ලියක් ඉදි වී තිබූ නමුත් පසුව ලන්දේසින් විසින් රෙපරමාදු ආගමේ බුහුමන් ලද දේවස්ථානයක් බවට එය පත් කර ඇත. වත්මන් දේවස්ථානය ලන්දේසි පාලන සමයට අයත් සම්භාවනීය ගෘහ නිර්මාණයකි. මහමුහුද තරණය කර පැමිණෙන නැවියන්ට මුලින්ම දක්නට ලැබෙන්නේ මෙම දේවස්ථානයයි. මෙම නිර්මාණය තුළින් අද්විතීය උත්කෘෂ්ටබවක් හා සරල බවක් දක්නට ලැබේ.[85] මෙහි ධර්මාසනය ද අගනා නිර්මාණයකි. අත්වැටක් සහිත එය කරා ළඟාවීමට තරප්පුවක් ඇත.[86] මෙය කොළඹ ක්‍රිස්තියානි ආගමික ස්ථාන අතුරින් ප්‍රමුඛස්ථානය ගන්නා අතර ඩච් රිපෝට් චර්ච් සභාවට අයත් ය. මෙය 1757 දී ආගමික වතාවත් සඳහා විවෘත කළ අතර ගෝඩන් උද්‍යානයේ පැරණි පල්ලිය සතු පුරාවස්තු ද මෙම ස්ථානයේ තැන්පත් කර ඇත.

## කොළඹ පැවති ගමනාගමන ක්‍රම

පෘතුගීසි සමයේ දී ප්‍රභූවරුන් සිය ගමන් බිමන් සඳහා අනුරාධපුර යුගයේ සිට පැවති දෝලාව යොදා ගෙන ඇත.[87] ප්‍රෙඩ්රික් නෝර්ත්[88] හා 1737 දී





වැන් ඉම්හොෆ් ද[89] දිවයින වටා ගමන් කළේ දෝලාවෙනි. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ඩැන්ටිය නම් ආවරණ සහිත සැප පහසු පුටුව කුල කාන්තාවන් හා ආණ්ඩුකාරවරයා ගමන් බිමන් සඳහා යොදා ගෙන ඇත.[90] උද්‍යාන කොටුව තුළ කුල කාන්තාවන් ගමන් කර ඇත්තේ 'කියුරිකල්' නම් රෝද තුනක තල්ලු කරන කරත්තයකිනි.[91] බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ කරත්ත, බක්කි කරත්ත, රේස් කරත්ත හා තිරික්කල ආදි නොයෙක් මඟී ප්‍රවාහනය ක්‍රම භාවිත වූ නමුත් ප්‍රභූන් අශ්වරථ යොදා ගත් බව සමකාලීන සිතුවම් අධ්‍යයනයෙන් තහවුරු වේ.

අපූර්වතම මිනිස් බලයෙන් ක්‍රියාකරන රික්ෂෝ රථය කොළඹ විටෝල් සමාගම විසින් ප්‍රථමවරට මෙරටට ගෙන්වනු ලැබිණි. එය ධනවතුන් මිලට ගත් අතර මෙහි අලංකාර නිමාවක් ද තිබිණි.[92] 1832 දී තැපැල් සේවය කාර්යක්ෂම හා සුරක්ෂිත කිරීමේ අරමුණින් ආසියාවේ ප්‍රථම තැපැල් රථය වූ අශ්ව කෝච්චිය ආරම්භ විය. මෙය රෝද 4ක රථයක් වූ අතර අශ්වයන් දෙදෙනකු විසින් ගෙන යන ලදී. කොළඹ සිට මහනුවර දක්වා ප්‍රථම වරට මෙම සේවය ක්‍රියාත්මක වූ අතර වැවිලිකරුවන් අතර මෙය ඉක්මනින් ජනප්‍රිය විය. පසුව පාපැදිය ද ක්‍රමයෙන් කොළඹ නගරය පුරා ජනප්‍රිය වූ බව සඳහන් වේ.[93]

20 වන සියවස ආරම්භය වන විට වඩාත් කාර්යක්ෂම සේවාවක් සඳහා විදුලි රථ අවශ්‍ය විය. එනිසා ප්‍රථම වරට 1900 ජනවාරි 31 දින බවුන්ටඩ් සමාගම ට්‍රෑම් රථ සේවය ආරම්භ කළේය.[94] මෙය ඉතා ජනප්‍රිය ගමනාගමන ක්‍රමයක් වූ අතර පළමු සතිය තුළ පමණක් 20,000 කට අධික පිරිසක් ගමන් කර ඇත. මේ සේවයට කරත්තකරුවන්ගේ හා රික්ෂෝ රථ රියදුරන්ගේ තර්ජන එල්ල විය. කොළඹ ජනයා ට්‍රෑම් රථ සේවයට බෙහෙවින් රුචිකත්වය දැක්විය. මෙම සේවය ග්‍රෑන්ඩ්පාස් හා බොරැල්ල දක්වා ද කොළඹ නගරය තුළ හොඳින් ක්‍රියාත්මක විය. එහෙත් කොළඹ නගරයේ මාර්ග තදබදය වැළැක්වීමට පසුව නගර සභාව ට්‍රෑම් රථ ප්‍රවාහනය නවතා ට්‍රොලි රථ ගෙන්වීය.

## කැලණිය පාරු පාලම

අතීතයේ සිට ම අභ්‍යන්තර ගමනාගමනයට යොදා ගත් කැලණි ගඟ වූ කලී පහත් බිමක ගලා ගිය කොළඹට සැතපුම් 3 ක් පමණ උතුරින් මුහුදට එක් වන මුහුදු වැලි නිසා වේගය අඩාල ව වැවක ස්වරූපය ගත් ප්‍රධාන ගංගාවකි.[95] මුල් අවධියේ කැලණි ගඟ හරහා පාලමක් නොවීය. 1822 දී ප්‍රථම

වරට එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයා රන් පවුම් 16,000 ක් වැය කර පොන්ටූන් හෙවත් පාරු පාලමක් ඉදි කරවීය. එක ළඟ නතර කරන ලද ඔරු 21 කින් සමන්විත මෙය අඩි 499 ක් දිග මගී පාලමකි. එකල පාරුවලින් ගඟ තරණය කිරීමට තොටුපොළ 2 ක් තිබිණි. පෘතුගීසි සමයේ සිට පිහිටා ඇති නාගලගම් (පාගෝ ග්‍රෑන්ඩ්/ග්‍රෑන්ඩ්පාස්) තොටුපොළ හා දෙවැනි තොටුපොළ ඒ අසල පාස් බීට්ල්වල පිහිටා ඇත. බ්‍රිතාන්‍ය සේනාංක කොළඹ කොටුවට පහර දීමට මෙම පාස් බීට්ල් පසු කර පැමිණ ඇත.[96] 1895 දී වික්ටෝරියා පාලම ඉදිවන තුරු වසර 75 ක් පුරා මහනුවර හා මීගමුව දක්වා කොළඹ සිට ගමන් කළේ ඉහත සඳහන් කළ පාරු පාලම හරහා ය.[97] මෙම වික්ටෝරියා පාලම 1952දී නව කැලණි පාලම ඉදිවන තුරු භාවිත විය.[98]

## කොළඹ නුවර මාර්ගය

එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයා ලංකාවට පැමිණීමෙන් පසු මෙරටට ප්‍රථම, දෙවන හා තෙවනුව ද අවශ්‍ය වන්නේ අන් කිසිවක් නොව මාර්ග යැයි පිළිගෙන ඇත. එනිසා ඔහු ස්කීනර් සමඟ එක් වී වසර 10 ක් තුළ දියුණු මාර්ග පද්ධතියක් ඇති කිරීමට කැපවූයේ ය.[99] කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හා නිර්දේශ අනුව ද වැවිලි ආර්ථික අවශ්‍යතා මත ද කොළඹ නගරය රට අභ්‍යන්තරයට ප්‍රවේශ කිරීමේ අරමුණ මත කොළඹ-නුවර මාර්ගය ඉදිවිය.[100] කොළඹ රජ ගෙදර සිට ආරම්භ වන මෙම මාර්ගය 1821-31 දක්වා කාලවකවානුවේදී ඉදි කෙරිණි.[101] කුමාර වීථියට පසුව යෝක් වීථිය හරහා කෙළින් වීථිය ද එතැන් සිට වුල්ෆෙන්ඩල් වීථිය, වේල්ස් කුමාර වීථිය පසුකර වික්ටෝරියා පාලම හරහා නුවර මාර්ගයට පිවිසීම සිදු වේ.[102] මෙය කොළඹ නගරයේ මාර්ග පද්ධතිය තුළ ඉතා වැදගත් නිර්මාණයකි.

## කොළොම්පුර දුම්රිය මාර්ගය

1858 දී මරදාන මුස්ලිම් දේවස්ථානය අසල ප්‍රථම දුම්රිය මාර්ගය තැනීමට මංගල පස් පිඬැල්ල කැපී ය.[103] මෙම මාර්ගය සඳහා සැතපුමට රන් පවුම් 6000 ක් වැය කෙරිණි.[104] මුල් පියවරේදී හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් පරිදි කොළඹ සිට රාගම දක්වා වගුරු බිම් පිරවීමේ අපහසු කාර්ය දියත් විය.[105] 1862 දී කොළඹ-නුවර දුම්රිය මාර්ගය ඉදි කිරීම ඇරඹුණු අතර එහිදී අඹේපුස්ස දක්වා ප්‍රථම අදියරේ ඉදිකිරීම් සඳහා





කැලණි ගඟ හරහා පාලමක් ද ඉදි කර ඇත. 1864දී ප්‍රථම දුම්රිය ගමන බෙල්ජියමේ රාජකීය අමුත්තන් කැටුව ඇරඹිණි. 1867දී මරදානේ ඉදි වූ ප්‍රථම දුම්රිය පර්යන්තය සිට මරදාන පාලම, කෝට්ටේ ඔය හා ඇළ හරහා ඉදි වූ පාලම, ග්‍රෑන්ඩ්පාස් කම්හල, ඔරුගොඩවත්ත කැලණි ගං මිටියාවත, කැලණිය ඔරු පාලම පසුකර මහනුවර බලා ධාවනය විය.[106] 1870 දි කොළඹ වාණිජ කේන්ද්‍රය බවට පත්වීමෙන් පසුව දකුණු දිග දුම්රිය මාර්ගය ඉදි කිරීම ආරම්භ විය. 1877දී ඊට බාධා එල්ල වූ අතර ගාලු මුවදොරපිටිය හරහා මෙම මාර්ගය ඉදි කිරීමට විකල්පය ලෙස කොම්පඤ්ඤ වීදිය තෝරා ගැනිණි. 1874දී වරාය දක්වා නව අතුරු දුම්රිය මාර්ගය ඉදිවීම හෙවත් බ්රේක් වෝටර් දුම්රිය මාර්ගය ඉදි කිරීමද වැදගත්ය. 1923දී එය ගලවා ඉවත් කෙරිණි.[107]

## සමාලෝචනය

13 වැනි සියවසේදී සිංහල රාජධානි නිරිතදිගට විතැන්වීමෙන් අනතුරුව කොළොම්තොට හා ඒ ආශ්‍රිත ප්‍රදේශය වැදගත් වූයේ දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයන්හි ප්‍රගමනයත් සමඟ ය. එහිදී විශේෂයෙන් වාණිජ අවශ්‍යතා මත විවිධ ප්‍රමාණයේ මාර්ග නිර්මාණය විණි. 16 වැනි සියවසින් පසුව මෙම වාණිජ කටයුතු මෙහෙයවීම යුරෝපීයන්ගේ ආගමනයත් සමඟ වඩාත් ප්‍රබලත්වයට පත් වූ බැවින් මෙම ප්‍රදේශය මුල් කරගනිමින් රට අභ්‍යන්තරයේ සිට වෙරළබඩ දක්වා දිවෙන නව මාර්ග පද්ධතියක් සකස් වුණි. මෙහිදී විශේෂයෙන් අවධානයට යොමු වූයේ එසේ ඉදි වූ නව මාර්ග පද්ධතියක් හා එහි ව්‍යාප්තියත් ඒ හරහා අද දක්වා වර්ධනය වූ එම ප්‍රවාහන පද්ධතිය හා එහි විශේෂතා හඳුනා ගැනීමත් ය. තව ද කොළොම්පුරය පිළිබඳ ඓතිහාසික විග්‍රහයක යෙදීමේදී අදටත් වලංගු ඓතිහාසික ස්ථාන හා ස්මාරක කිහිපයක් හමු වේ. ඒවා සම්බන්ධයෙන් ද මෙහිදී අවධානය යොමුවූයේ නිතැතිනි. ක්‍රමයෙන් විකාශය වූ මෙම මාර්ග පද්ධතිය හා එහි ක්‍රියාකාරීත්වය වර්තමානයේ ද සක්‍රිය ලෙස දක්නට ලැබෙන බැවින් එහි වැදගත්කම අවධාරණය කිරීම මේ හරහා සිදුවිය.

## ආන්තික සටහන්

1. ෆාහියන් බතූතාගේ චාරිකා, අනුඃ රාජේන්ද්‍ර ජයසුන්දර, කුරුළු පොත් ප්‍රකාශන, 28 පිටුව.
2. එමර්සන් ටෙනන්ට් ඇසූ දුටු ලංකාව, මධ්‍යකාලීන ඉතිහාසය, පරිඃ මැන්දිස් රෝහණදීර, පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ 07, 2000, 58 පිටුව.
3. ගාමිණී ලෙස්ලි, පුරාණ ලංකාවේ වරායයන්, සූරිය ප්‍රකාශන, කොළඹ 10, 2007, 109 පිටුව.
4. කොළඹ විසිල් වත්තල් පුන්තුරුයෙහි - නරඹ යනෙන වෙළඳුන් ඔරු පාරුයෙහි (හංස සංදේශය,78 කවිය)
5. හම්බන්කාරයා, මරක්කලයා ලෙස මුස්ලිම්වරුන් හැඳින්වූයේ මෙම ජල යාත්‍රා විශේෂය භාවිත කිරීම නිසා විය හැකිය. (සන්නස්ගල පුංචි බණ්ඩාර, සිංහල සන්දේශ සාහිත්‍ය,දිනමිණ මුද්‍රණාලය,කොළඹ,1955, 147 පිටුව)
6. ගිරා සන්දේශය, 18 කවිය (සංස් :- ටි. සුගතපාල. කොළඹ ග්‍රන්ථ ප්‍රකාශන, බු. ව. 2471).
7. හංස සන්දේශය, 16 කවිය.
8. දියකද ගැඹර පිරි පුවතර මහ — සයුර<br>මුවරද ලෙසින් වන අගතිසි කර — තඹර<br>මනනද කරන මිනි ගනමෙන් දිස් — එවර<br>පැහැනද පහන් එහි මඟ වෙසෑ බල — මිතුර (සැළලිහිණි සංදේශය, 54 කවිය,).
9. සැළලිහිණි සංදේශය, 6 හා 8 කවි, ගිරා සංදේශය, 14 කවිය, හංස සංදේශය, 13 කවිය
10. මුණසිංහ, ඉන්ද්‍රානි, ශ්‍රී ලංකාවේ මාර්ග ප්‍රවාහන, ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්, දෙහිවල , 2000, 47- 48 පිටු.
11. වර්තමාන බත්තරමුල්ල ප්‍රදේශය
12. කෝකිල සංදේශය, 230 හා 231 කවි, (සංස්:- ඩබ්. එෆ්. ගුණවර්ධන වාසල මුදලි, කොළඹ. 1924)
13. කළුආරච්චි සමන්, කොළඹ පුරාණය, සූරිය ප්‍රකාශනය, කොළඹ 10, 2005, 37 පිටුව
14. එම, 41 පිටුව
15. විදේශීයයන් දුටු පුරාණ ලංකාව II,පරංගි යුගයේ හෙළදිව, පරිඃ රෝහණ පොන්නම්පෙරුම, පේරාදෙනිය, 1969, 123 පිටුව.
16. කළුආරච්චි, සමන්, කොළොඹ පුරාණය, එම, 41 පිටුව.
17. හුලුගල්ල එච්.ඒ.ටී, ශත සංවත්සර පුස්තකය, කොළඹ නගර සභාව, 1865-1965, පරිඃ වී.ඒ. සමරතුංග, බී.ගුරුගේ, කොළඹ නාගරික මුද්‍රණාලය, 1965, 21 පිටුව.
18. විදේශීයයන් දුටු පුරාණ ලංකාව II, පරංගි යුගයේ හෙළදිව, එම 124 පිටවු.
19. එම, 125 පිටුව
20. කළුආරච්චි, සමන්, කොළොඹ පුරාණය, 20 පිටුව.
21. පෙරේරා එස්.ඩී, ලංකා ඉතිහාසයේ පෘතුගීසි යුගය 1505-1658,එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ, 1960, 61 පිටුව.
22. Queyroz Ferno De, TheTemporal and Spirtual Conquest of Ceylon, Government Print Ceylon, 1930, 29-31 pp.
23. Goonawardene K.W., The Foundation of Dutch Power in Ceylon, International Cultural Relation Netheralnd Insititue, 1958, 64-65 pp.





24. කළුආරච්චි සමන්, කොළොඹ පුරාණය, එම, 30 පිටුව.
25. හුලුගල්ල එච්.ඒ.ටී, ශත සංවත්සර පුස්තකය, එම, 26 පිටුව.
26. රොබට් පර්සිවල් දුටු ලංකාව, පරිඃයසපාල වනසිංහ, එස්. ගොඩගේ සහ සමාගම, කොළඹ 10. 2007, 77 පිටුව.
27. Heydt, Johan Wolffgang, Heydt's Ceylon, Ceylon Governer Press, Colombo 1952, 02 page.
28. කළුආරච්චි සමන්, කොළොඹ පුරාණය, එම, 53 පිටුව.
29. හුලුගල්ල එච්.ඒ.ටී, ශත සංවත්සර පුස්තකය, එම, 29 පිටුව.
30. පෙරේරා එස්.ජී, ලංකා ඉතිහාසයේ පෘතුගීසි යුගය 1505-1658, එම, 176 පිටුව.
31. රොබට් පර්සිවල් දුටු ලංකාව, පරිඃ යසපාල වනසිංහ, එම, 78 පිටුව.
32. එම, 89 පිටුව.
33. බ්‍රෝහියර් ආර්.එල්, කොළොම්පුර පුරාවෘත්තය, පරිඃපද්මා එදිරිසිංහ, විසිදුණු ප්‍රකාශන, බොරලැස්ගමුව, 2000, 33 පිටුව.
34. එම, 42 පිටුව
35. Heydt, Johan Wolffgang, Heydt's Ceylon, ibdib, 07 page
36. Elliott C. Brooke, The Real Ceylon, H.W. Care & Company, Colombo, 15 page.
37. බ්‍රෝහියර් ආර්.එල්, කොළොම්පුර පුරාවෘත්තය, එම, 30 පිටුව.
38. රොබට් පර්සිවල් දුටු ලංකාව, පරිඃ යසපාල වනසිංහ, එම, 77 පිටුව.
39. An Account of the Island of Ceylon, Robert Fercival, Asian Education services, New Delhi, 1990, 38 page.
40. Ibid, 40 page.
41. Ibid, 18 page
42. De Silva K.M, A History of Sri Lanka, Vijitha Yapa Publication, Colombo 04, 2005, 228 page.
43. Ibid,
44. හුලුගල්ල, එච්.ඒ.ටී. ශත සංවත්සර පුස්තකය, එම,34 පිටුව, කළුආරච්චි සමන්, කොළඹ පුරාණය, එම 61 පිටුව.
45. එම.
46. බ්‍රෝහියර්, ආර්.එල්. කොළොම්පුර පුරාවෘත්තය, එම, 64 පිටුව.
47. රොබර්ට් පර්සිවල් දුටු ලංකාව, පරිඃ යසපාල වනසිංහ, එම, 82-83 පිටු.
48. හුලුගල්ල, එච්.ඒ.ටී, ශත සංවත්සර පුස්තකය, එම, 35 පිටු
49. කළුආරච්චි, සමන්, කොළඹ පුරාණය, එම, 62 පිටුව.
50. Heydt, Johan Wolffagang, Heydt's Ceylon, Ibdib, 7 page.
51. හුලුගල්ල, එච්.ඒ.ඩී. ශත සංවත්සර පුස්තකය, එම, 62 පිටුව.
52. කළුආරච්චි, සමන්, කොළඹ පුරාණය, එම, 64 පිටුව.
53. 1910 දී පිටකොටුව නෝර්ත් පාරේ (ඔල්කට් මාවත) පර්චස් 12 ක ඉඩම් කැබැල්ල රු. 16000 ක් ද කොටුවේ පර්චස් 13 ක ඉඩම් කැබැල්ල 37000 කට ද විකිණිය. (කළුආරච්චි සමන්. කොළඹ පුරාණය, එම)

54. හෙන්රි ඩබ්.කේව්, දහනවවැනි සියවසේ ලංකා සංචාරයක්, පරිඃ නිශ්ශංක පෙරේරා, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2006, 35 පිටුව.
55. බ්‍රෝහියර්, ආර්.එල්, කොළොම්පුර පුරාවෘත්තය, එම, 60 පිටුව.
56. හෙන්රි, ඩබ්.කේව්, දහනවවැනි සියවසේ ලංකා සංචාරයක්, එම, 52-53 පිටු.
57. රාජ්‍ය ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුව, 33/1943 ලිපි ගොනුව.
58. හුලුගල්ල, එච්.ඒ.ටී. ශත සංවත්සර පුස්තකය, එම, 85 පිටුව.
59. එම, 78 පිටුව.
60. එම, 44 පිටුව.
61. එම 47 පිටුව.
62. බ්‍රෝහියර්, ආර්.එල්. කොළොම්පුර පුරාවෘත්තය, එම, 64 පිටුව.
63. හුලුගල්ල, එච්.ඒ.ඩී. ශත සංවත්සර පුස්තකය, එම, 49 පිටුව.
64. එම, 141-142 පිටු.
65. එම, 143-149 පිටු.
66. එම, 159 පිටුව.
67. Letters on Ceylon 1845-50 The Administration of viscount torrington and the rebellion of 1848, Ed: K.M. De Silva, K.V.G. De Silva & Son,s Colombo, 1965, 09 page.
68. Queyroz Ferno De, The temporal and Spiritual Conquest of Ceylon, Government print Ceylon, 1930, 30 page.
69. පෙරේරා, එස්.ඩී. ලංකා ඉතිහාසයේ පෘතුගීසි යුගය 1505-1658, එම, 60 පිටුව.
70. රොබට් පර්සිවල් දුටු ලංකාව, පරිඃ යසපාල වනසිංහ, එම, 77-78 පිටු.
71. හුලුගල්ල, එච්.ඒ.ටී, ශත සංවස්තර පුස්තකය, එම, 138 පිටුව.
72. රාජ්‍ය ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුව, 33/3349 ලිපි ගොනුව.
73. බ්‍රෝහියර්, ආර්.එල්, කොළොම්පුර පුරාවෘත්තය, එම, 61 පිටුව.
74. හුලුගල්ල, එච්.ඒ.ටී. එම, 159 පිටුව.
75. ලන්දේසීන් යටතේ සේවය කරන කළ වහල් සේවකයන් අසනීප වූ විට ගාල් කළ දිවයින. (රොබට් පර්සිවල් දුටු ලංකාව, පරිඃ යසපාල වනසිංහ, එම, 78 පිටුව)
76. හුලුගල්ල, එච්.ඒ.ටී, එම, 206 පිටුව.
77. බ්‍රෝහියර්, ආර්.එල්, කොළොම්පුර පුරාවෘත්තය, එම, 42 පිටුව.
78. Charles, Henry, Ceylon and Cingalese, Asian Education Serives, New Delhi, 1991, 47 page.
79. බ්‍රෝහියර්, ආර්.එල්, කොළොම්පුර පුරාවෘත්තය, එම.
80. රොබට් පර්සිවල් දුටු ලංකාව, එම, 83 පිටුව.
81. බ්‍රෝහියර්, ආර්.එල්, කොළොම්පුර පුරාවෘත්තය, එම, 83 පිටුව.
82. හෙන්රි, ඩබ්.කේව්, දහනව වැනි සියවසේ ලංකා සංචාරයක්, එම, 47-48 පිටු.
83. පෙරේරා, එස්.ජී, එම, 60 පිටුව.
84. Heydt Johan Wolffgang, Ibdib, 12 page.





85. බ්‍රෝහියර්, ආර්.එල්, එම, 38 පිටුව.
86. Elliott, C. Brooke, The Real Ceylon, Ibdib, 23 page.
87. මුණසිංහ, ඉන්ද්‍රානි, ශ්‍රී ලංකාවේ මාර්ග ප්‍රවාහනය, ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්, දෙහිවල, 2000, 146-147 පිටු.
88. Cordiner, James, A Description of Ceylon, Vol. I, Lond, 1908, 168 page.
89. Munukulasooriya, R.C. De S., Transport in Sri Lanka in Ancient and Mediaval Times, Jounral of Sri Lanka branch of Royal Asiastic Society, New Series, Vol. xxiv, 1978-79, 60 page.
90. ඩේවි දුටු ලංකාව, පරිඃ ඇල්ලෙපොල එච්. විසිදුණු ප්‍රකාශන, 2002, 199 පිටුව.
91. බ්‍රෝහියර්, ආර්.එල්, එම, 60 පිටුව.
92. හෙන්රි, ඩබ්. කේව්, එම, 46 පිටුව.
93. Elliott, C. Brooke, Ibdib, 16 page
94. මුණසිංහ, ඉන්ද්‍රානි, එම, 162 පිටුව.
95. ඩේවි දුටු ලංකාව, එම, 65-66 පිටු.
96. බ්‍රෝහියර්, ආර්.එල්, එම, 65 පිටව.
97. Munukulasooriya, R.C. De. S, Transport in Sri Lanka in Ancient and Mediaval time,s ibdib, 61 page.
98. කොළඹ-කැලණි පාලම විවෘත කිරීම, රජයේ මුද්‍රණාලය, 1959, 21 පිටුව.
99. Perera, S.C., Perniola V, A History of Ceylon, Lake House, Colombo, 76 page.
100. Perera, Horace L.H, Ceylon Under Westen Rule, Macmillian & Company lTd, 1956, 252 page.
101. Jennings, William Ivor, The Kandy Road, Ed: H.A.I., Goonatilaka, The State printing Corporation, Colombo 02, 1993, 21 page.
102. Forbes Major, Eleven Years in Ceylon, Vol. I, Asian education service, New Delhi, 1994, 56-58 page.
103. රාජපක්‍ෂ, සිරිසේන, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ඉතිහාස කථාව 1845-2005, ආර්ට් ප්‍රින්ටර්ස්, කොළඹ 10, 2005, 03 පිටුව.
104. මුනිදාස, කේ.වී.එච්, අපේ රටේ දුවන්න පටන් ගත් යකඩ යකා, සිළුමිණ, 209/01/18
105. සෝමරත්න, ජී.පී.වී, ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය, කොළඹ විශ්වවිද්‍යාල ප්‍රකාශන, 1991, 52 පිටුව.
106. රාජපක්‍ෂ, සිරිසේන, එම, 21 පිටුව.
107. එම, 50 පිටුව.

07



# රූපවාහිනී වෙළඳ දැන්වීම් සඳහා නර්තන ප්‍රවේශය

**එන්.ජී. ශෂී නිරෝශනී**
ශාස්ත්‍රවේදී (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර
නිබන්ධක
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
shashiniroshini@ymail.com



වෙළඳ දැන්වීම යනු ඉතා ඉක්මනින් ග්‍රාහකයා වෙත සමීප විය හැකි මාධ්‍යයක් වන අතර ම අනෙකුත් ප්‍රචාරණ ක්‍රමවලට වඩා ග්‍රාහකයා පෙළඹවීමේ විශාල ශක්තියක් ඇති ප්‍රචාරණ ක්‍රමවේදයකි. රූපවාහිනිය, ගුවන්විදුලි මෙන් ම මුද්‍රිත මාධ්‍ය හරහා ද ප්‍රචාරය වන වෙළඳ දැන්වීම්හි ප්‍රබල භාෂාවක් දක්නට ඇත. එය ග්‍රාහකයා පෙළඹවීමට පමණක් නොව තොරතුරු ලබා දීමටත් භාණ්ඩය හෝ සේවාව පිළිබඳ ව මතකය අවදි කිරීමත් නිරතුරු ව සිදු කරයි.

වෙළඳ දැන්වීමක් දෘශ්‍යමාන වූ විට එය මතකයේ රඳවා ගැනීම පහසු වේ. දුර්වල සැලසුමකදී හෝ දක්ෂ ඉදිරිපත් කිරීමකදී වුව ද භාණ්ඩය, සේවාව සහ දැන්වීම්කරු ප්‍රකට ව හඳුනාගත හැකි විය යුතු ය. වෙළඳ දැන්වීමක දැන්වීම්කරු හෝ භාණ්ඩය හෝ සේවාව හෝ නිසා නොව එහි අන්තර්ගත විශේෂ පාඨයක් චිත්‍රයක් හෝ ඉදිරිපත් කිරීමේ විලාසයක් නිසා එය දුටු කෙනෙකුගේ මතකයේ රැඳෙන්නට පුළුවන."

( දයාරත්න, 1994 , 22 පි.)

යම් වෙළඳ දැන්වීමකට අදාළ භාණ්ඩය හෝ සේවාව පිළිබඳ ව වරින් වර මතක් කිරීමක් සිදු වන්නේ එසේ නො වුණහොත් පාරිභෝගිකයාගේ හෝ ගනුදෙනුකරුවාගේ මතකයෙන් එය ගිලිහී යාමට ඉඩ ඇති බැවිනි. වෙනස් වන ජීවන රටාවන්ට අනුව වෙළඳ දැන්වීම නිර්මාණය කළ යුත්තේ ඒ සමඟ මිනිසුන්ගේ ආකල්ප, සිතුම් පැතුම් වෙනස් වන බැවිනි.

භාණ්ඩයකට අදාළ වෙළඳ දැන්වීම ද ග්‍රාහකයා සමග වෙනස් වෙයි. ඒ ඒ කාලයේ තාලයට අනුව ඇවතුම් පැවතුම් විවිධ විලාසිතා මෝස්තර අනුව වෙළඳ දැන්වීමේ අන්තර්ගතය ද වෙනස් වෙයි. (අත්තනායක, 2001 , 24 පි).

මේ සඳහා හොඳම නිදසුන කොකාකෝලා වෙළඳ දැන්වීම යි. කාලානුරූපී ව විවිධ විලාසිතා මෙන් ම සංස්කෘතික තේමාවන් අනුව ද

දැන්වීම්කරණ ආයතන දැන්වීම් නිර්මාණය කරයි. කොකාකෝලා නවතම සන්නම් නාමය යන කික්කෝලා වෙළඳ දැන්වීමෙහි ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය සමයෙහි ඒ හා ගැළපෙන වෙළඳ දැන්වීමක් නිර්මාණය කර තිබුණි. එය නැවතත් සිංහල හින්දු අලුත් අවුරුද්ද තේමාව කර ගනිමින් ඊට ගැළපෙන පරිදි නව වෙළඳ දැන්වීමක් නිර්මාණය කරන්නට විය. මෙම නවතාව ග්‍රාහක ආකර්ෂණය ලබා ගැනීමට පිටිවහලක් වන්නේ ය. අනෙකුත් ප්‍රචාරණ ක්‍රම සමග සැසඳීමේ දී වෙළඳ දැන්වීම ප්‍රබල වන්නේ ග්‍රාහකයා වෙත එල්ල වන බලපෑම අනෙකුත් සියලු ම ප්‍රචාරණයන් අභිභවා සිටින බැවිනි. එහි දී අනෙක් ප්‍රචාරණ ක්‍රමවලට වඩා වේගයෙන් ග්‍රාහකයාට සමීප වීමට වෙළඳ දැන්වීමට හැකියාව පවතී.

මංගල යෝජනා, මෝටර් රථ වාහන විකිණීම හා ලබා ගැනීම, නිවාස හා ඉඩකඩම් විකිණීම හා ලබා ගැනීම, නැති වූ බඩු බාහිරාදිය සහ ඥාති මිත්‍රාදීන් සොයා ගැනීම, ලිංගික බෙලහීනතාවලට පිළියම්, සුරා සූදු, අතහැර දමන සැමියන් ලබා දීම, නැති වී ගිය පෙම්වතුන් පෙම්වතියන් යළි ගෙන්වා දීමේ යන්ත්‍ර ගුරුකම් හදි හූනියම්, සෙත්කවි හා වස්කවි ආදී ලුහුඬු දැන්වීම් ගණයට වැටෙන පෞද්ගලික දැන්වීම් ද විවිධ මාදිලියේ බාහිර උපකාරක පන්ති (ටියුෂන්) දැන්වීම් ද, පුණ්‍යායතනවල දැන්වීම් ද (යුනිසෙෆ් ආයතනය, ජාත්‍යන්තර රතු කුරුස ආයතනය) විශේෂයෙන් මුද්‍රිත මාධ්‍ය ඔස්සේ අපට දැකිය හැකි ය."( ජයතිලක, 2000, 13 පි.)

වෙළඳ දැන්වීම අලෙවි වර්ධනයට ඍජුව ම බලපායි. ඒ සඳහා වෙළඳ දැන්වීම ඉටු කරන මූලික කාර්යය මෙසේ ය.

- භාණ්ඩය හෝ සේවාව ජනප්‍රිය කරවීම, එහි වෙළඳ සන්නම පිළිබඳ රුචිකත්වයක් ඇති කිරීම නිෂ්පාදනය කෙරෙහි ග්‍රාහකයා පොළඹවාලීම.
- අදාළ භාණ්ඩය හෝ සේවාව අනෙකුත් භාණ්ඩවලින් වෙන් කර හඳුනා ගැනීම.
- නිෂ්පාදිතය පිළිබඳ තොරතුරු ලබා දීම. ( භාණ්ඩයේ හෝ සේවාවේ නවතාවන්, මිල, බාහිර ස්වරූපය පිළිබඳ ව)
- නිෂ්පාදනය කෙරෙහි නව පාරිභෝගිකයන් පොළඹවාලීම.
- නිෂ්පාදනයේ බෙදා හැරීම් සහ පාරිභෝගික ගැනුම් ස්ථාන පිළිබඳ ව දැනුවත් කිරීම.





ප්‍රචාරණය මෙවලමක් ලෙස වෙළඳ දැන්වීමක ප්‍රධාන අංග 05 ක් හඳුනාගත හැකි ය. දැන්වීම ඉදිරිපත් කරන තැනැත්තා, දැන්වීම ග්‍රහණය කරන අය, දැන්වීමට ලක් කෙරෙන භාණ්ඩය හෝ සේවාව, දැන්වීමේ අරමුණු මෙන් ම දැන්වීමේ මාධ්‍යය එම අංගයන් ය. දැන්වීම් ප්‍රචාරණය සඳහා යොදා ගනු ලබන මාධ්‍ය කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

| | |
|---|---|
| පුවත්පත් | රූපවාහිනිය |
| සඟරා | සිනමාව |
| ගුවන් විදුලිය | පෝස්ටර් |
| දැන්වීම් පුවරු | ජංගම දැන්වීම් |

දැන්වීම්කරණ ප්‍රචාරක මාධ්‍යක් ලෙස රූපවාහිනිය ග්‍රාහකයාට ඍජු ව ම සමීප විය හැකි ප්‍රබලම මාධ්‍යය වන්නේ ය. එබැවින් දැන්වීම් සඳහා අධික මුදලක් අය කරන සහ වියදම් කරන මාධ්‍යයක් ලෙසත් තරගකාරී මාධ්‍යයක් ලෙසත් හඳුනා ගත හැකි ය.

**"As an advertisement medium" television is uniquely personal and demonstrative , yet it is also expensive, and subject to considerable competitive clutter"** ( Shimp, 388 p. )

රූපවාහිනී මාධ්‍යය මෙහිදී ප්‍රමුඛස්ථානය ගනී. ඊට හේතු වන්නේ ලාංකේය ජනසමාජය බෙහෙවින් රූපවාහිනිය සමඟ බැඳී සිටීම යි. අද තරුණ පරපුරේ බොහෝ අය ලෝකය පිළිබඳව මෙන් ම අනෙකුත් කලා මාධ්‍යයන් පිළිබඳ ව මුල් වරට හඳුනා ගන්නේ හා ඒ පිළිබඳ අරුත් සම්පාදනය කරන්නේ පවා රූපවාහිනී මාධ්‍ය තුළින් බව පෙනී යනවා."(විද්‍යාපති, 2000, 116 පි).

බොහෝ වෙළඳ දැන්වීම්හි අන්තර්ගත නාට්‍යමය ගුණාංග හේතුවෙන් වැඩිදෙනා ඒවාට පෙළඹෙන බව පර්යේෂණවලින් හෙළි වී ඇත. සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටක බොහෝ දෙනා සුඛෝපභෝගී ජීවිත ගත කරන්නෝ නොවෙති. එබැවින් ඕනෑම භාණ්ඩයකට හෝ සේවාවකට ඔවුන් පොළඹවා ගැනීම පහසු වෙයි. එහිදී බොහෝ දැන්වීම්කරුවන් භාවිත කරනුයේ අදාළ භාණ්ඩය හෝ සේවාව වටා වඩා සුන්දර වූත් සුඛෝපභෝගී වූත් පරිසරයක් මවා පෑම යි. එහි දී ඔවුහු යථාර්ථවාදී පරිසරයෙන් මඳක් ඈත් වී අපූරු සුරලොවක් මවන්නට උත්සාහ ගනිති.



15 DEC 2019
VICE - CHANCELLOR'S OFFICE
NUGEGODA

ලංකාවේ වෙළඳ දැන්වීම් නිර්මාණයට වැඩි වශයෙන් ඉලක්ක කර ගනුයේ ළමා පරපුර යි. රූපවාහිනී මාධ්‍ය හරහා ළමා මනසට බලපෑම් කිරීමට ඇති හැකියාව වැඩි ය. රූපවාහිනී දැන්වීම් හරහා ළමා මනසට බලපෑම් කිරීමට ඔවුන් විසින් යොදා ගනු ලබන්නේ දැන්වීමෙහි ඇති ලස්සන, වර්ණවත් බව, මෙන් ම ළමා සිත් ගත් ස්කූබි ඩූ, කැස්පර් වැනි කාටූන් චරිත ආදිය යි. එලෙස ම දැන්වීම් සඳහා ළමුන් දායක කර ගන්නා අවස්ථා ද බොහෝ වේ. ඇතැම් විටෙක ළමුන් සම්බන්ධ දැන්වීම් නිර්මාණය කෙරෙනුයේ වැඩිහිටියන් පොළඹවා ගැනීමේ අරමුණිනි. සමාජ විද්‍යාත්මක පර්යේෂණයන්ට අනුව සොයාගෙන ඇත්තේ ළමා මනසට බලපෑම් කරන වෙළඳ දැන්වීම් ළමුන් අතර ජනප්‍රිය වීමත් සමග ඒවා නැරඹීමට වැඩිහිටියන් ද පෙළඹෙන බව යි.

ලාංකේය රූපවාහිනී වෙළඳ දැන්වීමට බලපෑම් කරන තවත් කණ්ඩායමක් ලෙස කාන්තාවන් හඳුන්වා දිය හැකි ය. ලිංගිකත්වය රාගය වැනි හැඟීම් උද්දීපනය කිරීමටත් ලාලිත්‍යය මටසිලිටි බව පෙන්වීමටත්, මව් සෙනෙහස වැනි උත්තරීතර හැඟීම් ජනිත කරවීමටත් දැන්වීම්කරුවෝ කාන්තාවන් යොදා ගනිති. අද නිර්මාණය වන වෙළඳ දැන්වීම්වල 99% ක්ම කාන්තාවන් යොදා ගන්නා බව පෙනේ. කිසිදු අදාළත්වයක් නැති ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ද ඇතැම් විට කාන්තාව භාවිත කරයි. බොහෝ කාන්තා නිෂ්පාදන සඳහා සුරූපී කාන්තාවන් යොදා ගැනීම තුළින් ග්‍රාහකයා පොළඹවාලීමට උත්සාහ කරයි. ලංකාව ඇතුළු බොහෝ රටවල තරුණ තරුණියන් තම අවශ්‍යතාවලට සරිලන භාණ්ඩ තෝරා ගනු ලබන්නේ ප්‍රචාරණය මාර්ගයෙනි. දේශීය තරුණ තරුණියන් බොහෝ විට දැන්වීම් නරඹන්නේ නව විලාසිතා, ජනප්‍රිය රැල්ල පසුපස යාමේ අරමුණ ඇතිව ය. එම අරමුණ ඇති කරන ලද්දේ ජනමාධ්‍ය විසිනි. එය තවදුරටත් වර්ධනය කිරීමට වෙළඳ දැන්වීම් උත්සාහ ගනී. දේශීය රූපවාහිනී දැන්වීම් සඳහා සංගීතය බහුල වශයෙන් යොදා ගනු ලබන්නේ ප්‍රේක්ෂක ආකර්ෂණය ලබා ගැනීමේ අරමුණ ඇතිව ය. වර්තමානය වනවිට අදාළ කාල සීමාව තුළ වඩාත් ජනප්‍රිය වන ගීත පද වෙනස් කරමින් වෙළඳ දැන්වීම් නිර්මාණය කරයි. ලොව ජනප්‍රියත්වයට පත් ව ඇති නළු නිළියන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වැනි අය යොදා ගනිමින් දැන්වීම් නිර්මාණය කරන අතර එම දැන්වීම් ලංකාවේ රූපවාහිනී නාලිකාවල ද විකාශනය වේ. ජාත්‍යන්තර නිෂ්පාදන සඳහා දේශීය වශයෙන් වෙළඳ දැන්වීම් නිර්මාණය වීම අවම වේ. ඒ සඳහා ඔවුන් භාවිත කරනුයේ ජාත්‍යන්තර වශයෙන් භාවිත වන වෙළඳ දැන්වීම් ය. මීට අමතර වශයෙන් දේශීය වශයෙන්





නිෂ්පාදනය වන වෙළඳ දැන්වීම් සඳහා දේශීයත්වය අගය කරමින් ලාංකික සංස්කෘතියට ගැළපෙන වෙළඳ දැන්වීම් නිර්මාණය වීම ද බොහෝ අවස්ථාවල දැකිය හැකි ය. එහිදී දේශීය ජනශ්‍රැතියේ අන්තර්ගත ජනශ්‍රැතිකාංග බහුල ව යොදා ගනී. ජනකතා, ජනකවි, ආගම, යාතු කර්ම, ඇදහිලි හා විශ්වාස, ජනක්‍රීඩා ආදි ජනශ්‍රැතිකාංග මෙහිදී ප්‍රධාන වේ. ජනකවිය, නර්තනය, සංගීතය වැනි අංගයන් අද වනවිට යොදා ගනු ලබන්නේ දේශීයත්වයට ගැළපෙන අයුරින් යයි පැවසීම තරමක් අපහසු ය. සියල්ල ජනප්‍රිය රැල්ල මත රැඳෙමින් වෙනස් වී ඇත. සාම්ප්‍රදායික ජනකවිය අද රූප සංගීතය හා මුසුව ඉදිරිපත් කරයි. සාම්ප්‍රදායික වෙස් නර්තනය ඇතැම් විටෙක බටහිර නර්තනය හා මිශ්‍රව යොදා ගනු ලබයි. මීට ප්‍රධානම හේතුව වන්නේ වෙළඳ දැන්වීම් නිර්මාණය කරනුයේ හුදෙක් වෙළඳ අරමුණු සඳහා වීම ය. ලාංකේය රූපවාහිනී වෙළඳ දැන්වීම් මගින් ජනතාවගේ සිතුම් පැතුම්, ආකල්ප, හැසිරීම් මෙන් ම ජීවන තත්ත්වය ද වෙනස් කර ඇත. එබැවින් ලාංකික සංස්කෘතියේ ද විකාශනය වීමක් දක්නට ඇති බව කිව හැකි ය.

රූපවාහිනී දැන්වීම් නිර්මාණයේ දී අදාළ භාණ්ඩය ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කිරීම සඳහා යොදා ගනු ලබන ප්‍රවේශයන් රාශියක් ඇත.

i. බිය/ ත්‍රාසය
ii. සිනහ උපදවන/හාස්‍ය උපදවන ප්‍රවේශය
iii. ලිංගිකත්වය හුවා දැක්වීමේ ප්‍රවේශය
iv. සංගීතමය ප්‍රවේශය
v. තර්කානුකූල ප්‍රවේශය
vi. හැඟීම් දනවීම
vii. හිඟකම පිළිබඳ ප්‍රවේශය

ප්‍රචාරණ විග්‍රහයන්හි දැන්වීම්කරණ ප්‍රවේශයන් අතර නර්තනය පිළිබඳ ව ප්‍රවේශයක් අන්තර්ගත වීමක් දක්නට නො ලැබේ. අද වනවිට රූපවාහිනී වෙළඳ දැන්වීම් වැඩි වශයෙන් රිද්මයානුකූල චලන භාවිතයකට යොමු වී ඇත. ඇතැම් අවස්ථාවන්හි දී හුදු චලන භාවිත කර ඇති දැන්වීම් මෙන් ම ශාස්ත්‍රීය නර්තනාංග දක්වා වර්ධිත දැන්වීම් ද දක්නට ලැබේ. නර්තනය, මානවයාගේ මනෝ රසඥතාව උද්දීපනය කරන්නා වූ සන්නිවේදන මාධ්‍යයකි. නර්තනය (Dance) යන පදයෙන් අර්ථකථනය

කෙරෙන්නේ රිද්මයකට අනුකූලව කායික අඟපසඟ චලනය කිරීමෙන් භාව ප්‍රකාශනය කිරීම යි". ( දිසානායක, 2003 ,34 පි).

අතීත දඩයම් යුගයේ මානවයා දඩයම නිමා වූ පසුව දඩ සතා පිළිස්සෙන තුරු ම ගිනිමැලය වටා විවිධ චලන ඉදිරිපත් කරමින් සිය සතුට භුක්ති විඳින්නට විය. ඔවුන් නර්තනය භාවිත කරන්නට වූයේ සතුට දැනවීමේ උපායමාර්ගයක් ලෙසිනි. වෙළඳ දැන්වීම් සිය නිෂ්පාදිතය පිළිබඳ ව පාරිභෝගිකයා පෙළඹවීම සඳහා නර්තනය භාවිත කරන්නේ කුමක් අරබයාදැයි ගැටලුවකි. මානව පරිණාමය කවදා කෙසේ සිදු වුවත් ජානමය වශයෙන් මානවයා තුළ නිදන්ගත වූ චර්යාවන් බොහෝ ඇත. යක් බෙරය වාදනය වන විට හැඟීමක් ඇති නො වන්නේ නම් ඔහු හෝ ඇය සිංහලයෙක් නො වේය යන ලයනල් රන්වලයන්ගේ අදහස මෙහි දී මෙනෙහි වේ.

දේශීය වශයෙන් ගත් කල්හි සංස්කෘතිය සමග ඇති ඥාතීත්වය බිඳ දැමීමට අපට හැකියාවක් නැත. නූතන සමාජය තාක්ෂණය සමගින් වේගවත් ගමනක් ආරම්භ කර ඇතත් සංස්කෘතික බැඳීම වරින්වර ඉස්මතු වීම දක්නට ඇත. මෙම සාධකය ප්‍රචාරණ මාධ්‍යයන් ප්‍රබල ලෙස උපයෝගී කර ගන්නා ආකාරය දක්නට ලැබේ. විශේෂයෙන් ම දේශීය සංස්කෘතිය පිළිබිඹු කරමින් ලාංකේය රූපවාහිනී දැන්වීම් සඳහා නර්තනය භාවිත කරයි. රූපවාහිනී මාධ්‍යය නිරන්තරයෙන් බහුවිධ සංස්කෘතික හා රසවින්දන සංදේශ නිකුත් කරන අතර එමගින් ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගනී. ඇතැම් අවස්ථාවන්හි දී වර්තමාන ළමා පරපුර මුල්වරට නර්තනය හඳුනා ගන්නේ ද රූපවාහිනී මාධ්‍යය හරහා ය.

රූපවාහිනිය, තොරතුරු, දැනුම, විනෝදාස්වාදය මෙන් ම අධ්‍යාපනය ද ලබාදෙන්නා වූ මාධ්‍යයකි. දැන්වීමක් හරහා මේ සියල්ල අදාළ දැන්වීම්කරණ උපක්‍රම ආශ්‍රයෙන් ලබා දීමට හැකියාව ඇත. වර්තමාන දැන්වීම්කරුවා සංගීතය, බිය, ලිංගිකත්වය වැනි ප්‍රවේශයන් නර්තනය සමගින් මිශ්‍ර කර ඇත්තේ පාරිභෝගික මනස තුළ නිෂ්පාදිතය පිළිබඳ ව ආකර්ෂණයක් ඇති කිරීමට යි. කොකාකෝලා, ප්‍රීමා, ක්‍රීම් සෝඩා වැනි සන්නම් නාමයන් පාරිභෝගික මනස අල්ලා ගෙන ඇත්තේ නිෂ්පාදිතය සමග රිද්මය මුසු කිරීමෙනි. "යෞවනයේ පොපියන චමත්කාරය" තරුණ පිරිසට ආමන්ත්‍රණය කරයි. ඒ සමගින් ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ ලෙස භාතිය, සන්තුෂ්,





ජැක්ලීන් ෆර්ඩිනෑන්ස් වැනි ජනප්‍රිය පුද්ගලයන් මෙන් ම හිපොප්, සල්සා සහ නව නර්තන අංග ද යොදා ගෙන ඇත. නිෂ්පාදිතයේ ස්වභාවය අනුව යොදා ගන්නා නර්තන අංගවල වෙනස්කම් දක්නට ලැබේ. කොහොඹ සබන්, 'ජාතික සම්පත' ලොතරැයිය, ලංකාබෙල් වැනි නිෂ්පාදිතයන් සිය නිෂ්පාදිතය සමගින් ලාංකේය සංස්කෘතිය පිළිබඳ ව අවධානය යොමු කර ඇත. කොහොඹ සබන් ඉලක්ක කර ගන්නේ ලාංකික කාන්තාව යි. ඇයගේ සුන්දරත්වය හා දේශීය ඖෂධ ගුණය පාරිභෝගිකයාට සමීප කරවීමට ජන ගී නාද මාලාව උපයෝගී කර ගෙන ඇත. සුරඹා වල්ලිය නම් වූ නර්තනාංගයෙහි එන,

තෙම් තෙන තේන තෙනාග තේන - තෙන තෙනෙනා
නා තෙන තේන තෙනාග තේන - තෙන තෙනෙනා " හි

නාද මාලාවට සමීපව දැන්වීමෙහි

කොහොඹ රුක් සෙවනැල්ලේ සිසිල දෙන
ගුණ සුවඳැති තැනයි ඇයගේ නවාතැන "

ආදි වශයෙන් නිර්මාණය සිදු කොට ඇත. 'ජාතික සම්පත' ජාතියේ සම්පතක් වන නර්තනය සිය දැන්වීම සඳහා අපූර්වාකාරයෙන් යොදා ගනිමින් දේශීය නර්තනයේ මුදුන් මල්කඩ වශයෙන් සලකනු ලබන වෙස් නර්තනය, පහතරට තෙල්මෙ, සබරගමු සින්දු මාත්‍රය, භරත නර්තනය මෙන් ම නව නර්තනය ද භාවිත කරන්නට විය. එලෙසින් ම යූනියන් ඇෂුවරන්ස් සිය සේවාව පිළිබඳ වූ විශ්වසනීයත්වය පාරිභෝගික මනසෙහි තැන්පත් කරනුයේ උඩරට වෙස් නැට්ටුවා සමඟිනි. දණ්ඩියමේ සරඹ ආරම්භ කරමින් හිස වෙස් තැබීම දක්වා යන ගමනේදී, ඇස් දෙකට නින්දක් නැතිව දණිස් කැක්කුම් දෙනකල් අඩි පුරුදු වුණ හැටි, බෙරයට හුරු නැතිව පුපුරපු කරගැටවලින් ලේ ගලපු හැටි, කිටි කිටියේ හිරවුණු නැටුම් ආයිත්තම්වලින් නහරවල් රිදුම් දීපු හැටි, මං තරම් දන්න වෙන කවුරුවත් නෑ, මොකද මම හෘද සාක්ෂිය " යනාදි වූ අත්දැකීම් විස්තරය සමගින් ඉදිරිපත් කරයි.

මේ අයුරින් වෙළඳ දැන්වීම් සිය නිෂ්පාදිතය සඳහා පාරිභෝගිකයා පොළඹවා ගැනීමේ අරමුණින් දැන්වීම්කරණ ප්‍රවේශයක් ලෙසින් නර්තනය භාවිත කරනු දක්නට ලැබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


- අත්තනායක, ආශිර්දිනී භාග්‍යා, (ප්‍රථම මුද්‍රණය 2001), ප්‍රචාරණය, සන්නිවේදනය සහ පාරිභෝගික සමාජය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11.
- ජයතිලක, නිහාල් රංජිත්, (2000), වෙළඳ ප්‍රචාරණය, එස්. ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.
- දයාරත්න, බන්දුල පී, (1994), ප්‍රචාරණය, එස්. ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.
- දිසානායක, මුදියන්සේ, (2003), සිංහල නර්තන කලාව, එස්. ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.
- Shimp, Terence, A. (fifth edition), **Advertising Promotion**, Harcourt College Publishers, America.




08



# දකුණු පළාතේ අභිලේඛනවලින් හෙළිවන රාජකීය අභිධාන හා තනතුරු


**රජිත් මධුසංක**
ශාස්ත්‍රවේදී (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර
නිබන්ධක
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
rajithmadu87@gmail.com

වර්තමාන දකුණු පළාත හඳුන්වනු ලබන ප්‍රදේශය පුරාණයේ අයත් වූයේ රෝහණ රාජ්‍යයට ය. රෝහණ නම් නක්ෂත්‍රයෝගයේ නාමයෙන් නම් කරනු ලැබූ මේ ප්‍රදේශය, ප්‍රදේශීය රාජ්‍යයක් බවට වරින් වර පත් ව ඇත. දෙවන පෑතිස් රජුගේ සොහොයුරකු වූ මහානාග කුමාරයාගෙන් රෝහණ රාජ්‍යය ආරම්භ වූ බව වංසකථා සඳහන් කරයි (වාච්චගේ, 2008 : 181). රෝහණ ජනාවාස කරන ලද්දේ භද්දකච්චානා කුමරියගේ සොහොයුරකු වූ රෝහණ කුමාරයා විසිනි. (මඃ වඃ 09 පරිඃ 10 ගාථා) පුරාණ ත්‍රී සිංහලයේ එක් රාජ්‍යයක් ලෙස රුහුණු සැලකුණ අතර, කාලානුක්‍රමික ව එහි දේශසීමා විපර්යාසයට භාජනය විය.

මුල්කාලීන ශිලාලිපි පරීක්ෂා කිරිමේ දී පෙනී යන්නේ 'රඣ' සහ 'මහරඣ' යනුවෙන් අභිධාන දෙකක් භාවිත කර ඇති බව යි. මීට අමතර ව 'දෙවනපිය' ද පශ්චාත්කාලීන ශිලාලිපිවල 'මපුර්මුකා' යනුවෙන් ද අභිධාන යොදා ගෙන තිබේ. මෙකී අභිධාන සියල්ල දිවයිනේ අනෙක් ප්‍රදේශයට මෙන් ම දකුණු පළාතේ ශිලාලිපිවල ද පොදු ය.

විශේෂයෙන් ම මුල්කාලීන ව ගාමිණී, මහරජ, දෙවනපිය, මපුර්මුකා උපපද යොදාගත් රජවරු පශ්චාත්කාලින ව සිරිසඟබෝ, අභාසලමෙවන්, ලංකේශ්වර, චක්‍රවර්තීන් ස්වාමීන් වහන්සේ, භූපාලෝත්තමයන් වහන්සේ වැනි ගෞරවාන්විත පද වැඩි වසයෙන් යොදා ගත් බව ශිලාලිපි අධ්‍යයනය කිරීමේ දී පෙනී යන්නකි.

ඇතැම් තන්හි සූර්යවංශය ගැන සඳහන් කරමින් ද (සූර්යවංශාභිජාත) පරම්පරා ගැන සඳහන් කරමින් ද (විජය රාජ පරම්පරාවෙන් ලංකාව හිමි ඔකාවස් පරපුරෙන් බට කැත් උස බනට මෙහෙසුන් වූ ලක්දිව පෙළෝයොහොන පරපුරෙන් හිමි) වික්‍රමයන් ගැන සඳහන් කරමින් ද (ශ්‍රී සිංහවික්‍රම ඇති ත්‍රි සිංහල පුරේශ්වර) ආදි වසයෙන් විශේෂණ පද වැඩි ප්‍රමාණයක් යොදා ගෙන සිය ශ්‍රේෂ්ඨත්වය පෙන්වීමට රජවරු උත්සාහ ගත්හ.





පරසතුරු උවදුරු අධික වීම හේතු කොට ගෙන රට සමෘද්ධියෙන් පිරිහීමට ලක් වුණි. රාජ්‍යත්වය පිළිබඳ ස්ථාවරත්වය ලිහිල් වෙත් ම අනුරාධපුර අවධියේ අවසාන භාගයේ විසූ රජවරුන් සියලේඛනවලට අතිශයෝක්තියෙන් කළ විරුදාවලී බහා සිය අඩුපාඩු සඟවා ගත්හ. (සූරවීර, 1965:08)

මතු දැක්වෙන්නේ දකුණු පළාතට අයත් ශිලාලිපිවල සඳහන් අභිධාන හා තනතුරු කිහිපයකි .

## මහ රජ, රජ

රජ යන වචනය සංස්කෘතයෙහි 'රාජන්' යනුවෙන් ද පාලියෙහි රාජ" යනුවෙන් ද යෙදී තිබේ . පූර්ව බ්‍රාහ්මී ශිලාලිපිවල 'රජ' යන වචනය සඳහන් ව ඇත්තේ "රඣ" යනුවෙන් අල්පප්‍රාණ "ජ" වෙනුවට මහප්‍රාණ "ඣ" යෙදීමෙනි.

ලක්දිව රාජ්‍යත්වයයේ ආරම්භය කවදා කෙසේ සිදු වී දැයි වංසකථා සහ ශිලාලිපි ආශ්‍රය කොට ගෙන පැවසිය නො හැකි ය. වංසකථා අනුව විමර්ශනය කිරිමේ දී පෙනී යන්නේ විජයගේ පටන් මෙරට පාලන තන්ත්‍රය මෙහෙය වූ පුද්ගලයන් රාජ නමින් හැඳින්වූ බව යි. ක්‍රිඃපූ 03 වන ශතවර්ෂය වන විට මෙරට රාජ්‍යත්වය ආරම්භ වී ඇති බව අභිධානවලින් පැහැදිලි වේ. දේවානම්පිය තිස්ස රජුගේ කාලයේ දී මෙරට පාලන තන්ත්‍රය විධිමත් වූ බව සඳහන් වේ.

ලෝකයේ අන් සෑම සංස්ථාවක් මෙන් ම රාජ්‍යත්වය ද ඇතැම් අංශයන් පරිණාමයත් සමඟ වෙනස් වීමට පටන් ගත්තේ ය. මුල් අවධියේ සිටි බොහෝ රජවරුන්ගේ පාලන ක්ෂේත්‍රය එතරම් විශාල නො වුණි. රුහුණු, මාගම වැනි ප්‍රදේශවල පාලකයෝ ද පිහිටි රට රජවරු ද සීමාසහිත ක්ෂේත්‍රයක අධිපතිකම් කළහ. (අමරවංශ හිමි, 1961 : 40)

හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් ශිලාලිපිවල ද උක්ත අභිධාන භාවිත කොට ඇති බව දැකිය හැකි ය. කොටා දැමූ හෙළ (IC, 1970 : NO :556), සිතුල් පව්ව ( IC , 1970, NO : 620, NO : 647) ආදී ශිලාලිපි ඊට නිදර්ශන ය. තිස්සමහාරාමයෙන් හමු වූ ශිලාලිපියක 'මහරඣ' අභිධානය යෙදී තිබේ. (IC, VOL 01, 1970 : NO:703) මෙහි මහරජ අභිධානය යෙදා ගෙන ඇත්තේ මහාචූලි මහාතිස්ස රජතුමා ය.

සිතුල් පව්වෙන් හමු වූ ශිලාලිපියක මෙසේ දක්වේ.

“සිද්ධම් නක මහරකඩ පුත බතිය  මහරකඩ මලිතිස මහරකඩ……… ”

මෙහි සඳහන් “නක මහ රජ” නම් මහල්ලක නාග ( ක්‍රි:ව 134 -140 ) රජු ය. බතිය තිස හා මලිතිස නම් භාතිය තිස්ස ( ක්‍රි.ව. 140 -146 ) හා කනිට්ඨ තිස්ස ය.

රුහුණු වනෝද්‍යානයෙහි පිහිටි මඩගල නම් පුරාණ විහාරයෙන් හමු වූ ලිපියක මෙකවණ රජ අබ (මේඝවණ්ණාභය) නම් රජකෙනෙකු පිළිබඳ සඳහන් ය. යථෝක්ත නාමය ගෝඨාභය රජු විසින් භාවිත කරන ලදී.

මහරජ යන පදය පශ්චාත්කාලවලදී "මහරද්" යනුවෙන් විපර්යාසයට ලක් ව ඇත. බෝලාන සහ මයිලගස්තොට පුවරු ලිපි අධ්‍යයනය කිරීමෙන් මේ බව දත හැකි ය (IC, VOL V, Pt 1, P. 364 -374).

රජ තෙමේ බාල වුව ද මිනිසෙකු යැයි සුළුකොට නො තැකිය යුතු බවත්, හෙතෙම මනුෂ්‍ය ස්වරූපයෙන් මිහිපිට සිටින දෙවියා බවත් මනුස්මෘතියේ දක්වා තිබේ. සිංහාසනාරූඪ වන රජතුමා සාමාන්‍ය ලෝකයාගෙන් වෙන් කර තැබීම සඳහා විශේෂ නාමයක් අවශ්‍ය වූ අතර එමගින් ශ්‍රේෂ්ඨත්වය අපේක්ෂා කෙරිණි.

## දෙවනපිය

පූර්ව බ්‍රාහ්මී සහ අපර බ්‍රාහ්මී ශිලා ලිපි විමර්ශනය කරන කල දෙවන පිය යනුවෙන් අභිධානයක් එකල රජවරුන් විසින් භාවිත කරනු ලැබූ බව පෙනී යයි. මේ වචනය දඹදිව ශිලාලිපිවල දෙවානපිය (ධෞලී  ලිපිය) කියා අනුස්වාරය රහිතවත් යෙදී තිබෙනු දැකිය හැකි ය.

මේ රාජකීය ගරු නාමයේ අර්ථය වනුයේ “දෙවියන්ට ප්‍රිය වූ” යන්න යි. “දෙවන පිය” යන නිල නාමය ඉන්දියාවේ අශෝක අධිරාජයා භාවිත කොට ඇති බව ඔහු පිහිට  වූ ශිලාලිපිවලින් අනාවරණය වේ. ඔහුට සමකාලීන ලක්දිව පාලන තන්ත්‍රය මෙහෙය වූ තිස්ස රජතුමා ද මෙය භාවිතයට ගත් බවට සාක්ෂ්‍ය හමු වේ. ඒ අනුව මේ අභිධානය උතුරු





ඉන්දියාවේ භාවිතයට අනුව මෙරටෙහි යොදා ගෙන තිබෙනු පෙනේ (Perera 2001: 27).

තිස්ස රජතුමා දෙවනපිය යන අභිධානය දැරූ බව වංස කථාවලින් ද හෙළි වේ (ම.ව. 2009 : 19 පරි) මේ අභිධානය බොහෝ විට යෙදී ඇත්තේ "'මහරජ" යන අභිධානයට ප්‍රථමයෙන් ය. සිතුල්පව්වෙන් හමු වූ ශිලාලිපි කිහිපයෙක අභිධානය යොදා ගෙන තිබේ (IC, Vo 2, Pt 11 1983 : 45) (IC, Vol 01- 1970 : No: 647, No 620). ක්‍රි. ව. 02 වන ශත වර්ෂයෙන් පසුව මේ අභිධානය අභාවයට ගොස් ඇත.

## මපුර්මුකා

පරුමක යන්නෙහි අර්ථය “ප්‍රමුඛයා” හෙවත් ප්‍රධානියා යන්න යි. මෙය වූ කලී සංස්කෘත “ප්‍රමුඛ” (ප්‍රමුඛ>පරමුඛ>පරුමුක) ශබ්දයෙන් බින්න වි ඇතැයි විද්වත්තු කල්පනා කරත්. ද්‍රාවිඩ භාෂාවේ “පෙරුමකන්” යන වචනයෙහි අර්ථය ද ප්‍රධානියා යන්න යි. (විමලකීර්ති, 1956 :35) පාලි “පාමොක්ඛ” වචනයෙන් ද බිඳී ඇතැයි සමහරු විශ්වාස කරති. පූර්ව බ්‍රාහ්මී ශිලාලිපිවල සඳහන් පරුමක අභිධානය පසුකාලයේ දී වෙනස් විණි. “මපුර්මුකා” යන්නෙහි අර්ථය මහා ප්‍රමුඛයා යන්න බව පෙනේ. මහ රජතුමා යන අර්ථය ද මීට පර්යාය පදයකි. රජවරු සිය තත්ත්වය උසස් කරගැනීමේ ප්‍රතිඵලයක් වසයෙන් මපුර්මුකා යන අභිධානය භාවිතයට ගත්හ. මතු දැක්වෙන යටාල දාගැබෙන් හමු වූ පුවරු ලිපි දෙකක යථෝක්ත අභිධානය යොදා ඇති අන්දම යි.

“ස්වස්ති ශ්‍රී
අභාසල මෙව
න් මපුර්මුකා තුන්ව
න් නේ……” (IC.VOL 05, Pt 111, 2005 :59)

“ශ්‍රී අභාසල
මෙවන් මපු
ර්මුකා තුන්
වැන්නේ……” (IC.VOL 05, Pt 111, 2005 :60)

## උපරජ

මෙහි අර්ථය දෙවැනි රජ යන්න යි (සුමංගල ශබ්ද කෝෂය, 1999 : 184). මේ තනතුර ලබා දෙන්නේ විශ්වාස කටයුතු කෙනෙකුට ය. තනතුර ප්‍රදානය සිදුකරන්නේ උත්සවාකාරයෙනි. යුව රජ තනතුර ප්‍රධානය කිරීමේ දී එබඳු උත්සවයක් නො වී ය. (ආරියපාල, 1996 : 74)

උපරජ තනතුර හිමිවූයේ රජුගේ වැඩිමහල් පුත්‍රයාට ය. යුවරජ තනතුර හිමි වූයේ රජුගේ සහෝදරයාට ය (විමලකීර්ති, 1956:16). දක්ෂිණ භාරතීය ලිපිවල "යුව මහා රාජ" යන නමින් හැඳින්වූයේ ද උපරාජයා ය.

II වන සේන රජුගේ මහින්ද නම් සොහොයුරා අන්තඃපුර දූෂණයක් හේතුවෙන් මලය රටට පලා යයි. ඔහු ගැන දෙවනවර සඳහන් වන්නේ යුවරාජ නමින් ය. (ම.ව. 51: 7)

හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් අකුරුගොඩ හා කිරින්ද යන ප්‍රදේශ දෙකෙන් හමු වී ඇති ශිලාලිපි දෙකක උපරජ කෙනෙකු පිළිබඳ සඳහන් වේ. එහි සඳහන් වන්නේ නාග නම් උපරජ මිථ්‍යාදෘෂ්ටිය හැර බුදුසමය වැළඳගත් බව යි. (රෝහණධීර, 1998:69)

## සිරිසඟබෝ

මේ අභිධානය භාවිත කරන්නට ඇත්තේ රජුගේ දැහැමි බව පෙන්වීමට විය හැකි ය. (වනරතන හිමි, 1996 : 174) හිස දන් දුන් සිරිසඟබෝ (ක්‍රි.ව. 251 - 263) නම් රජ කෙනෙකු පිළිබඳ තොරතුරු මහාවංසයේ සඳහන් වේ (මඃවඃ 39 පරි, 58 - 97). අනුරාධපුරයේ රජවරු මේ අභිධානය භාවිත කළහ. IV වන කාශ්‍යප, IV වන උදය, IV වන මිහිඳු, ආදී රජවරුන්ගේ ශිලාලිපි අධ්‍යයනයෙන් පැහැදිලි වේ. (අමරවංශ හිමි, 1960 :170, 211, 285)

පොළොන්නරුවේ රාජ්‍ය විචාළ I වන විජයබාහු, නිශ්ශංකමල්ල රජවරු ද මෙය භාවිතයට ගත්හ. මාතර දිස්ත්‍රික්කයට අයත් පනාකඩුවෙන් හමු වූ තඹසන්නසෙහි I වන විජයබාහු රජතුමා මේ අභිධානය දරා ඇති බව පෙනේ.





1. "ස්වස්ති සිරි සිරිවත් අපරියත් ලො ඉකුත් ගුණ මුළෙන් උතුරත් මුළු දඹදිව්හි අන් කැත්කු
2. ල පාම්ලි කළ ඔකාවස් රජපරපුරෙන් බට් කැත් උසබනට අගමෙහසුන් වූ ලග්දිව් පො
3. ළො යොහෙන පරපුරෙන් හිමි සිරිසඟබො විජයබාහු රජපා වහන්සේ තුමා සිය වික්..." (IC, VOL 06: 2007 : 29)

වැලිගම රාජකුල වඩන විහාරයෙන් හමු වූ ලිපියකින් ද පෙනී යන්නේ V වන බුවනෙකබාහු රජතුමා ද සිරිසඟබෝ අභිධානය භාවිතයට ගෙන ඇති ආකාරය යි. දෙවිනුවර *VI* වන විජයබා ලිපියේ ද මේ අභිධානය භාවිතයට ගෙන තිබේ. (Ranawella 2005 : 104)

## චක්‍රවර්තී ස්වාමීන් වහන්සේ

චක්‍රවර්තී යන්නෙහි අර්ථය වනුයේ මුළු පොළොවෙහි ම ආඥාචක්‍රය පතුරුවන රජතුමා යන්න යි. මහ රජතුමා යන්න ද මින් අදහස් වේ (සුමංගල ශබ්ද කෝෂය, 1999 : 357).

මේ අභිධානය වැඩි වශයෙන් භාවිත කරනු ලැබුවේ නිශ්ශංකමල්ල රජතුමා විසිනි. ඊට ප්‍රථමයෙන් I වන විජයබාහු රජතුමා මෙය භාවිතයට ගත්තේ ය. පොලොන්නරුවේ වේලක්කාර ද්‍රවිඩ ලිපියෙන් ඒ බව ප්‍රත්‍යක්ෂ වේ. නිශ්ශංකමල්ල රජතුමා මේ අභිධානය කාලිංග යන ස්ථාන නාමය ද යොදා භාවිතයට ගෙන ඇත. වැලිගැට්ටෙන් හමු වූ ශිලාලිපිය මීට නිදර්ශන ය (Ranawella, 2005 : 95). වාදුරුප්පේ ශිලාලිපියේ 'කාලිඟ චක්‍රවර්තීන් වහන්සේ" යනුවෙන් සඳහන් කර ඇත (IC, VOL, 2007: 139).

VI වන පරාක්‍රමබාහු රජතුමා ද යථෝක්ත අභිධානය භාවිත කළ බව දෙවිනුවරින් හමු වූ ශිලාලිපියකින් ස්ඵුට වේ. දෙවිනුවරින් ම හමු වූ තවත් ශිලාලිපියක දැක්වෙන්නේ (Ranawella, 2005:102) VI වන විජයබාහු රජතුමා මෙය භාවිත කර තිබෙන අයුරු ය. (Ranawella, 2005:104)

## කාලිංග ලංකේශ්වර

කාලිංගවංශික රජවරුන් විසින් මෙම අභිධානය භාවිත කරන ලදී. විශේෂයෙන් ම නිශ්ශංකමල්ල රජතුමා ස්වකීය පාලන කාලයට අයත් ශිලාලිපි බෙහෝ ප්‍රමාණයක වාගේ මේ අභිධානය භාවිතයට ගෙන තිබේ.

මෙහි යොදාගෙන ඇති 'කාලිංග' යන වචනයෙන් රජුගේ ජන්ම භූමිය අභිප්‍රේත ය. ඔහුගේ හැම ලිපියක ම පාහේ යෙදී ඇති මේ ස්ථාන නාමයෙන් බලාපොරොත්තු වී ඇත්තේ තම ජන්ම භූමියේ නාමය ප්‍රකාශ කිරීමේ අදහස බැව් පෙනේ. (රෝහණධීර, 1998 : 89)

ලංකේශ්වර යන්නෙහි අර්ථය වනුයේ ලංකාවේ ඊශ්වරයා හෙවත් ලංකාවේ අධිපතියා යන්න යි. කාලිංග ලංකේශ්වර යන්නෙන් අදහස් කෙරුණේ කාලිංග දේශජ ලංකාධිපති යන්න යි (රෝහණධීර, 1998 : 89). වාදුරුප්පෙන් හමු වූ නිශ්ශංකමල්ලගේ ශිලාලිපියක ලංකේශ්වර මෙන් ම "සිංහපුරේශ්වර" යන අභිධානය ද භාවිත කරමින් ස්වකීය දිමනා පිළිබඳ සඳහන් කර තිබේ. (IC, VOL. VI 2007: 139)

## දේවයන් වහන්සේ

රජුට හිමි ව තිබූ උත්තරීතර බලය හේතු කොට ගෙන සාමාන්‍ය මනුෂ්‍යයන්ට වඩා උසස් ගණයෙහි ලා සැලකුණ බව ශිලාලිපිවලින් පැහැදිලි වේ. වර්තමාන සමාජ විද්‍යාඥයන් විසින් නම් කරන ලද අනුහස හෙවත් කැරිස්මා නමැති ගුණයෙන් ඔවුහු යුක්ත වූහ. (පීරිස්, 2005:10)

රජකම දේව අනුමැතිය උඩ රඳාපවතින්නක් සේ සලකා තිබිණි. රාජාභිෂේකයකින් පවා බලාපොරොත්තු වූයේ නරයන් දෙවියන් බවට පෙරළීම ය (පීරිස්, 2005:10). අනුරාධපුර යුගයේ රජවරුන් මෙන් ම මහනුවර යුගයේ රජවරු ද ස්වකීය නාමයට දේවත්වය එක් කළහ. (තිස්ස කුමාර, 92 132 -134)

කටගමුවෙන් හමු වී ඇති ශිලාලිපියකට අනුව අනුරාධපුර යුගයේ රාජ්‍ය විචාළ I වන ජයබාහු (1110 - 2110) රජ මෙන් ම දෙවන මානාභරණ රජු ද යථෝක්ත අභිමානය භාවිත කර ඇති බව පෙනී යයි.





"...ජයබාහු දෙවයන් වහන්සෙ ප
න් තිස්වන්නේ මනාබරණ දෙව
යන් වහන්සේ......" (IC, Vol, V2111 - 2005: 29)

## ඈපා

ඈපා යන්නෙහි අර්ථය උතුම් ආර්යයා හෙවත් කුමාරයා යන්න යි (සුමංගල ශබ්ද කෝෂය, 1998 : 153). මේ තනතුර දරන ලද්දේ රජකුමරුන් විසිනි. ඔවුන්න හිමි කුමාරවරු ඈපා මෙන් ම මාපා තනතුරු ද දැරූහ. (ආරියපාල, 1996 : 74). විශේෂයෙන් ම කුමාරවරු ඈපා මහ පා සිරිවිද රජවරුන් බවට පත් වූහ.

ශිලාකාල රජ සිය වැඩිමහල් පුත්‍ර වූ මොග්ගල්ලාන කුමරු ආදිපාද තනතුරෙහි පිහිට විය. දෙවන කුමරු මලය රාජ තනතුරෙහි පිහිට වූ බව ද සඳහන් ය. (ම.ව : 2009:41 පරි, 33 - 35 ගාථා)

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ශිලාලිපියක මහින්ද නම් ඈපා කෙනෙකුගේ නම යෙදී තිබේ. (IC, Vol V pt 111, 374) එසේ ම කිත්තග්ග බෝධි ඈපා විසින් ගිරියල කිහිරුළි පිරිවෙනට කරන ලද පූජාවක් පිළිබඳ ව දෙව්නුවරින් හමු වූ ලිපියකින් කියැවේ.

"ශ්‍රී
ඈපා කිතක් බො
යානු වජනින්
ගිරිය(ළකි) කිහිරුළි
පිරිමනට බහාලූ...." (වනරතන හිමි, 1994: 269)

තත් ශිලාලිපි කෙරෙහි අවධානය යොමු කරන කල පෙනී යන්නේ අනුරාධපුරයේ මෙන් පුරාණ රෝහණයේ ද ඈපාවරුන් සිටි බව යි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- අමරවංශ හිමි, කොත්මලේ (1961). ලක්දිව සෙල්ලිපි, කොළඹ: ඇම්. ඩී ගුණසේන සහ සමාගම.
- ආරියපාල ඇම්. බී. (1996). මධ්‍යකාලීන ලංකා සමාජය, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
- එල්ලාවල, හේම (1964). පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය,කොළඹ:සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
- තිස්ස කුමාර, ආනන්ද සිංහල සන්නස් හා තුඩපත්, කොට්ටාව: සාර ප්‍රකාශන.
- පීරිස්, රැල්ෆ් (2005). සිංහල සමාජ සංවිධානය, බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ
- රෝහණදීර, මැන්දිස් (1998). මැන්දිස් රෝහණදීර ශාස්ත්‍රීය ලිපි එකතුව, නාවින්න: තරංජී ප්‍රින්ටර්ස්.
- (1998). නිශ්ශංකමල්ල, නාවින්න: තරංජී ප්‍රින්ටර්ස්.
- වනරතන හිමි, කඹුරුපිටියේ -අනුරාධපුර යුගයේ සිංහාසන නාම සහ විරුදනාම, දෙහිවල :
- ______________ (1994). මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය, ගංගොඩවිල: පියසිරි ප්‍රින්ටර්ස්.
- වාච්චගේ, සුමනසිරි (2008). මාතර ඉතිහාසය, මාතර වංශය, කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
- විමලකිර්ති, මැද උයන්ගොඩ, (1956). සිංහල ආණ්ඩුව, මරදාන : අනුල මුද්‍රණාලය.
- සූරවීර, ඒ. වී. (1965). අනුරාධපුර සමාජය, දෙමටගොඩ: සොමිසඳ ප්‍රකාශන.
- සෙනෙවිරත්න, අනුරාධ (2003). ලක්දිව බුදු සසුන හා සංස්කෘතිය, කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.
- සෝරත හිමි,වැලිවිටියේ (1998). ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- Pararanavitana, S. (1970). **Inscriptions of Ceylon** Vol 1, Colombo : Department of Archaeology.
- ______________ (1983). **Inscriptions of Ceylon**, Vol 02, Colombo: Department of Archaeology.
- Ranawella, Sirimal (2001) **Inscriptions of Ceylon**, Vol 05, Pt I, Colombo:




# 09



# සිනමා කර්මාන්තයේ උන්නතියට ප්‍රබුද්ධ ප්‍රේක්ෂක පිරිසකගේ අවශ්‍යතාව


**දිල්හානී විජේරත්න**
ශාස්ත්‍රවේදී (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර
නිබන්ධක
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
wdpdilhani@gmail.com

සිනමාව යනු ප්‍රබල සන්නිවේදන මාධ්‍යයකි. සිනමාව සඳහා දෘෂ්ටි අඛණ්ඩතාව (Peristence of Vision) නම් වූ ජීවවිද්‍යාත්මක සිද්ධාන්තය පාදක කොටගෙන ඇත. 'රූප කිහිපයක් එකතුවෙන් අඛණ්ඩ චලනයක් දිස්වන්නේ මිනිස් ඇස, කිසියම් මායාවකට හසුවීම පිළිබඳ ජීව විද්‍යාත්මක සිද්ධාන්තයට අනුව ය', යන්න සිනමාවේදී ප්‍රධාන වශයෙන් උපයෝගී කොටගනු ලැබේ. සිනමාවේ මූලික ස්වභාවය දෘෂ්ටි මායාවක් ඇති කිරීම වුව ද එහි කලාත්මක වර්ධනයත් සමග ම එහි ස්වරූපය ද වෙනස් වූ බැව් පෙනේ. ඒ අනුව චිත්‍රපටය යනු ගද්‍යයක් හෝ පද්‍යයක් නොවන අතර එය සංගීතයක් ද නොවේ. සැම කලා මාධ්‍යයක ම එකතුවක් ලෙස සිනමාව දැක්විය හැකි ය. සෞන්දර්වාදීන් චිත්‍රපටය පිළිබඳ දරන්නේ මෙවැනි අදහසකි. චිත්‍රපටය හුදු යාන්ත්‍රික ක්‍රියාවලියක් නොව එය අධ්‍යක්ෂවරයාගේ සුකුමාර සූක්ෂමතාව පදනම් කොට ගෙන විශේෂ වූ ප්‍රතිඵලයක් අපේක්ෂාවෙන් සිදුකරනු ලබන ඡායාරූපාත්මක වරණයක් බවයි". (සිංහල විශ්ව කෝෂය 2006, පි 169) මේ සිනමාව පොදුවේ සියලු දෙනාට ම එක ලෙස රසවිඳීමේ හැකියාව තිබේ. ඒ සඳහා සාක්ෂරතාවක් අවශ්‍ය නොවෙතත් සිනමා කෘතියක සංඥාර්ථවේදය, ව්‍යංග්‍යාර්ථ හඳුනාගෙන එහි උච්ච වූ රසවිඳීමකට සිනමාවේ ව්‍යාකරණය දැන සිටීම ඉතා වටිනේ ය. කෙසේ වුව ද පොදුවේ සියලුදෙනාට ම සිනමා කෘතියක් නරඹා එය රසය විඳීමේ හැකියාව ඇත. මේ නිසාම සිනමාවේදී කෙරෙන සන්නිවේදනය ඉතා පහසු හා ඵලදායීබවින් ඉහළ මට්ටමක පවතී.

පුවත්පතක පාඨකයා ද, ගුවන්විදුලියේ ශ්‍රාවකයා මෙන් ම සිනමාවේ ද රූපවාහිනියේ ද ග්‍රාහකයෙක් සිටියි. සැම මාධ්‍යයක ම ග්‍රාහකයාගේ අවශ්‍යතාව මත පදනම් වී මාධ්‍ය නිර්මාණය කරගනු ලබන අතර සිනමාවේ ද එය වැදගත් ම සාධකය යි. ජීවිතයේ යථාවෙන් බිඳක් ගෙන හැර දැක්වීමක් චිත්‍රපටය හරහා සිදු කරන කලාකරුවා හැමවිට ම එය ග්‍රාහක රුචිකත්වය, අවශ්‍යතාව පදනම් කරගෙන නිර්මාණය කරයි. සිනමාවේ ග්‍රාහකයා වනුයේ





ප්‍රේක්ෂකයා (Spectator) ය. ග්‍රාහක ක්ෂේත්‍රය හැඳින්වීම සඳහා (Audience) යන්න අර්ථ දක්වා තිබේ. එය තවදුරටත් මෙසේ විග්‍රහ කොට තිබේ.

"රංග කලාවේදී නරඹන පිරිස ප්‍රේක්ෂක නමින් හැඳින්වේ. ගුවන්විදුලියට සවන් දෙන පිරිස ශ්‍රාවක ලෙස හැඳින්වේ. පුවත්පත් කියවන පිරිස පාඨක නමින් හැඳින්වේ. එහෙත් මෙම සියලු දෙනාම පොදු වශයෙන් ගත් කල ඔවුන් ග්‍රාහක නමින් හැඳින්වේ."

(මහේන්ද්‍ර, සුනන්ද, 1997)

සිනමාවේ ග්‍රාහකයා කවර නමින් ආමන්ත්‍රණය කරන්නේ ද යන්න පිළිබඳ ව සිංහල භාෂාවේ විවිධ අදහස් පවතී. ඒ අතර,

"ලෙස්ටර් ජේම්ස් පීරිස් චිත්‍රපට නරඹන තැනැත්තා රසිකයා ලෙස හඳුන්වන අතර චිත්‍රපට නැරඹීම රසිකත්වය" ලෙස හඳුන්වයි.

(ජේම්ස් පීරිස්, ලෙස්ටර් සහ තවත් අය, 2003)

කෙසේ වුවද පොදුවේ සිනමා ප්‍රේක්ෂකයා හැඳින්වීම සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන Audience යන පදය ව්‍යවහාරයට පැමිණ තිබේ.

1985 මාර්තු 22 දින ලූමියෙර් සොහොයුරන් විසින් නිපද වූ 'වර්කස් ලිවින් ද ලූමියෙර් ෆැක්ටරි' (Workers Living the Lumiere Factory) නම් චිත්‍රපට තීරුව හිතවතුන් අතර ප්‍රදර්ශනයෙන් පසුව වසර දහයක් ගිය තැන ප්‍රංශයේ ග්‍රාන්ද් කැෆේහි දී මුදලක් අය කොට ගෙන එම චිත්‍රපටය ප්‍රදර්ශනය කෙරුණි. මෙය සිනමා ඉතිහාසයේ මුල්ම ප්‍රේක්ෂක සමූහය වන අතර සිනමා කර්මාන්තයේ සන්ධිස්ථානයක් සලකුණු කළ දිනයක් විය. මේ අතර නිර්මාණකරුවෝ ද ප්‍රේක්ෂක කුතුහලය දනවන සිදුවීම් ඇතුළත් චිත්‍රපට නිර්මාණය කරන්නට විය. මෙය තවදුරටත් තාක්ෂණික විස්මයක් වන්නේ සිනමාවේ ව්‍යාකරණ හඳුනා ගැනීමෙන් පසුව ය. කලාත්මක සිනමා නිර්මාණයකට සිනමා භාෂාව එක් කිරීමෙන් වඩාත් නැවුම් බවක් ගෙන දීමට සිනමාවේ පියා ලෙස සැලකෙන ග්‍රිෆිත් වැනි නිර්මාණකරුවන්ට හැකි විය.

සිංහල සිනමා කර්මාන්තයේ ප්‍රථම ප්‍රේක්ෂක පිරිස හමුවන්නේ 1903 දීය. ලාංකේය සිනමාවේ ප්‍රථම චිත්‍රපට ප්‍රදර්ශකයා වන ඒ.ඩබ්. ඇන්ඩ්‍රි මහතා කොටුව මල්වත්ත ප්‍රදේශයේ ඉදිකළ 'කොරික් බයිස් කෝප් ශළාවේ' චිත්‍රපටය ප්‍රදර්ශනය ලාංකේය ප්‍රේක්ෂක ආරම්භය සනිටුහන් කරයි.

"1903 දී ප්‍රථම වරට කොටුවේ පිහිටුවන ලද සිනමාහලේ චිත්‍රපටයක් නැරඹීමට පළමු පන්තියේ අසුනකට ගෙවිය යුතු වූයේ සත විසි පහකි. සත දහයක් දුන්විට ගැලරියේ සිට චිත්‍රපටය නැරඹිය හැකි වේ".

(රණසිංහ, ජෝර්ජ් ලේස්ලි, 2001, පි.10)

ලෝකයේ අනෙක් රටවල ප්‍රේක්ෂකයා මෙන් ම ලාංකේය ප්‍රේක්ෂකයා ද සිනමා ශාලාව තුළට පිවිසියේ නැවුම් තාක්ෂණය අත්විඳීමේ අටියෙනි. මෙතෙක් ලාංකේය ජනතාවට අත්විඳීමට තිබූ නුර්ති, නාඩගම්, ටීටර් රසවිඳීමෙන් පීඩාවට පත් ව සිටි නිසා ම මෙය නැවුම් අත්දැකීමක් විය. එමෙන් ම 1947න් පසු වේදිකා නාට්‍ය චිත්‍රපට ලෙස ප්‍රදර්ශනය කිරිම ලාංකේය ප්‍රේක්ෂකයාට තවත් සුවිශේෂ අත්දැකීමක් විය. නාට්‍ය පෙන්වමින් සිටි බොහෝ දෙනා සිනමා කර්මාන්තයට ප්‍රවිෂ්ට වන්නේ ද මේ නිසාවෙන් ය. කෙසේ වුව ද මෙම රටාව එතරම් සාර්ථක ක්‍රමයක් නොවූ බව කිව යුතු ය. 1956 ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ රේඛාව ලාංකේය සිනමා වංශයේ නව පිටුවක් ආරම්භ කරන්නේ ය.

1960න් පසු සිංහල සිනමාවේ යථාර්ථවාදී සිනමාව බිහිවීමත් සමඟ ප්‍රේක්ෂකයාගේ අවශ්‍යතාව වෙනස් වන්නට විය. මෙතෙක් විනෝදාස්වාදය පමණක් ම බලාපොරොත්තු වූ ප්‍රේක්ෂකයා දැනුම, අවබෝධය, යථාර්ථය පිළිබිඹු කිරීම මෙන් ම විශිෂ්ට කලාත්මක රසවින්දනයක් ද බලාපොරොත්තු විය. ඒ නිසාවෙන් ම 60,70,80 යන දශකවල දී විවිධ තේමා යටතේ විශිෂ්ට නිර්මාණ බිහි විය. මේ වකවානුව තුළ තිරගත වූ චිත්‍රපට විනෝදාස්වාදය අරමුණු කරගත් නමුත් ප්‍රේක්ෂක බුද්ධියට නිගා නොවන චිත්‍රපට බොහෝමයක් විය. ප්‍රේක්ෂක අවශ්‍යතාව මුල්කොට ගනිමින් බිහි වූ සිනමා කෘති කලාවක් හා ව්‍යාපාරයක් ලෙස සිනමාව ශක්තිමත් කිරීමට සමත් වේ. මෙම සිනමා කෘතීන් ප්‍රේක්ෂකයා වඩාත් සිනමා ශාලාව තුළ රඳවා තබා ගැනීමට සමත් විය.





1990 දී මෙම තත්ත්වය වෙනස් වන්නේ එවකට සිනමා කර්මාන්තය තුළ පැණ නැගුණ විවිධ ගැටළුකාරී තත්ත්වයන් හේතු කොට ගෙන ය. මෙකල බිහි වූ සිනමා කෘති අතුරින් කිහිපයක් හැර සෙසු සියල්ල ම නිසරු චිත්‍රපට ලෙස ඉවත් කළ හැකි චිත්‍රපට බව පෙනේ.

"යහපත් තලයක පැවති ජනප්‍රිය සිනමාව ද යටපත් කරමින් හුදු විනෝදාස්වාදය ම අරමුණු කොට ගත් අනුකරණ චිත්‍රපට ඉස්මතු වීම මෙන් ම එම ප්‍රවණතා ද ඉතා ඉක්මනින් ප්‍රේක්ෂකයන් වෙතින් ප්‍රතික්ෂේප වීම ද මේ දශකය මුළුල්ලේම දිස් වූ ප්‍රමුඛ ලක්ෂණයකි". (චිත්‍රපටය, පි.389)

අනුකරණ සිනමාවකට එරෙහි ව නැගී සිටි බොහෝ දෙනා අතර කැපී පෙනෙන සිනමාකරුවන් කළ නිර්මාණ, ජනප්‍රිය සිනමාවේ නව මාවත යම් තරමකින් හෝ ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගැනීමට සමත් විය. එහෙත් එය පෙරකී දශකයන්ට වඩා බෙහෙවින් ම අඩු ප්‍රතිශතයකි. සිනමා කර්මාන්තය ඉතා පහළ තලයක රැඳෙන්නට වීම නිසා ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගැනීමට නිෂ්පාදකවරු, අධ්‍යක්ෂකවරු විවිධ මාදලියේ චිත්‍රපට නිපදවන්නට උත්සාහ කළහ. ඒ අනුව විකට චිත්‍රපට, මෘදුකාම චිත්‍රපට (Soft Pornography) බිහි විය. මේවා වට්ටෝරු සිනමාවක් කරා සිනමා කර්මාන්තය මෙහෙයවීය. ස්ත්‍රී දූෂණ, අඩ නිරුවත, සිප වැළඳගැනීම්, ස්ත්‍රියකට සිදුවන කායික පීඩා ආදිය පාදක කොට ගනිමින් එකම ගණයේ චිත්‍රපට බිහි වූයේ ඒවා ආදායම් ඉපයීම අතින් යම් තරමකින් හෝ සාර්ථක වූ නිසාවෙනි. 1999 වර්ෂයේ තිරගත වූ චිත්‍රපට 21න් 6ක් ද, 2002 තිරගත වූ චිත්‍රපට 26න් 8ක් ද මේ ගණයට අයත් විය.

දුර්වල විකට චිත්‍රපට රැල්ලත්, මෘදු කාම චිත්‍රපට රැල්ලත් දේශීය සිනමා ප්‍රේක්ෂක රසඥතාවට මෙන් ම බුද්ධියට ද නිගාවක් ම විය. ලාංකේය ප්‍රේක්ෂකයා සිනමා ශාලාවේ දොරටුව අසල නතර කරවීමට මෙම චිත්‍රපට රැල්ල හේතුවක් වූවා යැයි පැවසීම යුක්තිසහගත ය. පවුලේ නැරඹීම මෙන් ම ප්‍රබුද්ධ ජනතාවගේ නැරඹීම ද නැවතිණ. චිත්‍රපට විචාරකයන් නිහඬ කර වූ මෙම චිත්‍රපට රැල්ල සිනමා කර්මාන්තයේ ම අභාග්‍ය සම්පන්න අවධිය උදා කරවීය. තවදුරටත් සිනමා ශාලාව තරුණ තරුණියන් හෝ වැදගත් පුද්ගලයකු නොයා යුතු ස්ථානයක් ලෙස හඳුනා ගත්හ.

"සමාජයක අහිතකර පහත් චිත්‍රපට යම්කිසි රටක නිපදවනු ලැබේ නම් චිත්‍රපට බලන්නාගේ රසවිඳීමේ ශක්තිය පහත් නිසා ය. සෑම කලාවකටම චිත්‍රපටය මහජනයාගේ රුචිය අනුව හැඩ ගැසෙන්නකි"

(දොඩම්පේගම, බෙනඩික්ට්, චිත්‍රපට ආස්වාදය, පි.27)

ශ්‍රී ලාංකේය සිනමා කර්මාන්තයේ පසුබෑසීමට හේතු වූ පහත් ගණයේ චිත්‍රපට ප්‍රතික්ෂේප කිරීමට ද සිනමා ප්‍රේක්ෂකයා පසුබට නොවීය. මේ නිසාම එම චිත්‍රපට වර්තමානය වන විට ප්‍රදර්ශනයෙන් ඉවත්ව තිබේ. එහෙත් මෙම කාලය තුළ සිනමා කර්මාන්තය වඩාත් පසුබෑමකට ලක්විය. ඒ සඳහා දීර්ඝ කාලයක් ගත විය. අතළොස්සක් වූ උම්මතකයන්ගේ අවශ්‍යතාවන් සපුරනු වස් ද මූල්‍යමය අවශ්‍යතාවන් ද නිසා මෙවැනි චිත්‍රපට ප්‍රදර්ශනය වීම තුළින් පවුලේ නැරඹීම ද නතර විය.

උසස් සිනමා කෘති නොමැති වීම නිසාම ප්‍රේක්ෂකයා සිනමා ශාලාව තුළට කැඳවාගෙන ඒමට නොහැකි විය. ප්‍රදර්ශකයාට සිනමා ශාලා නඩත්තුව ද ඉතාම අසීරු විය. ඉඳහිට හෝ නිෂ්පාදනය වන උසස් ගණයේ සිනමා පටයක් සඳහා ප්‍රේක්ෂකයා සිනමා ශාලාව වෙත කැඳවාගෙන ඒම ද ගැටලුවක් විය.

ප්‍රේක්ෂකයා බලාපොරොත්තු වූ දේ නොලැබීම නිසා සිනමාහල් කෙරෙන් ප්‍රේක්ෂකයා ඉවත් වී චිත්‍රපට නැරඹීමට රූපවාහිනිය, විඩියෝපට, අන්තර්ජාලය වැනි විකල්ප සඳහා යොමු වූ බැව් පෙනේ. ප්‍රේක්ෂකයකු ටිකට් පතක් මිල දී ගෙන සිනමා ශාලාව වෙත යන්නේ චිත්‍රපටය හා හුදකලා වී එය රසවිඳීමටය. එහෙත් එම රසවිඳීමට බාධා වන ලෙස ප්‍රදර්ශන අක්‍රමිකතා, ආසනවල සැප පහසුව නොමැතිවීම ආදි බාධාවන් ද සිනමා ශාලාව තුළ සිටින කාලය පුරාවට දහඩියෙන් නැහැවේ නම්, අධික දුගඳ නම් ඒ තුළ රැඳී සිටීමට කොහෙත්ම කැමති නොවේ. මෙවැනි තත්ත්වයට පත් වූ සිනමා ශාලා පසුගිය වකවානුව තුළ දැකිය හැකි විය. එහි ප්‍රතිඵලය වූයේ ප්‍රේක්ෂකයන් සිනමා ශාලා වෙත ඒමේ ප්‍රවණතාව අඩුවීම යි.

පසුගිය වකවානුව තුළ ප්‍රේක්ෂක අවශ්‍යතාවන්ට ඇහුම්කන් නොදී නිපදවූ චිත්‍රපට රැල්ල විවිධ පරිපාලනමය හේතූන් මත වර්තමානය වන විටත් බොහෝ සිනමා ශාලා හිමියන් මෙන් ම ඒ ආශ්‍රිත සිනමා ප්‍රේක්ෂකයෝ ද පීඩා





විඳිති. උසස් සිනමා කෘතියක් රසය විඳීමට සුදුසු සිනමා ශාලාවක් (තාක්ෂණික අතින් යහපත් හා භෞතික පරිසරය) නොමැතිකමින් ප්‍රේක්ෂකයා පීඩා විඳිද්දී තිබෙන සිනමා ශාලා බොහෝමයකට ප්‍රේක්ෂකයන් නොමැති හෙයින් සිනමාහල් හිමියෝ පීඩා විඳිති.

කෙසේ වුව ද වර්තමානයේ දී ප්‍රදර්ශනය වූ පවුලේ සැමට නැරඹිය හැකි චිත්‍රපට අතර, බිංදු, අබා, ගාමිණී, කුස පබා, මහින්දාගමනය, විජය කුවේණී, ශ්‍රී සිද්ධාර්ථ ගෞතම වැනි චිත්‍රපට හරහා මෙම තත්ත්වය මඳක් වෙනස් මඟකට යොමු වී තිබේ. එය සිනමාවේ සුභ ලකුණකි. එමෙන් ම වර්තමානයේ ප්‍රේක්ෂකයා බුද්ධිමත් ය. චිත්‍රපට නැරඹීම සඳහා කොතෙකුත් විකල්ප මාධ්‍ය තිබුණ ද ඒ කරා නොගොස් සිනමා ශාලාවකට ම පැමිණෙන්නේ සිනමාවේ ඇති අනෙක් මාධ්‍යවල නොමැති ගුණාංගයන් නිසාවෙනි. මෙහිදී ප්‍රේක්ෂක බුද්ධියට නිගා නොවන චිත්‍රපට නිර්මාණය කිරීම අධ්‍යක්ෂවරුන්ගේ මෙන් ම නිෂ්පාදකවරුන්ගේ ද වගකීමකි. ප්‍රදර්ශන මණ්ඩල ද ඍජු ව ම මේ සඳහා මැදිහත් විය යුතු ය. මේ වෙනුවෙන් සුදුසු වැඩ පිළිවෙළක් ජාතික චිත්‍රපට සංස්ථාව ප්‍රමුඛ ව ප්‍රදර්ශන මණ්ඩල එකතු වී නොගත හොත් වර්ධනය වන සිනමා කර්මාන්තයේ පසුබෑසීම ද ඉක්මනින් ආරම්භ වනු ඇත.

ශ්‍රී ලාංකේය සිනමා ප්‍රේක්ෂකයන් අතුරින් සිනමා ශාලා වෙත පැමිණෙන වැඩි ම නියෝජනය අවිවාහක සිනමා ප්‍රේක්ෂකයෝ ය. මොවුන් අතුරින් වයස අවුරුදු 15ත් 34ත් අතර සිනමා ප්‍රේක්ෂකයන් බොහෝ දෙනෙක් සිනමා ශාලා වෙත යන්නේ කාලය ගත කිරීමට ය. වයස අවුරුදු 35ත් 65ත් අතර සිනමා ප්‍රේක්ෂකයන් බොහෝ දෙනෙක් සිනමා ශාලා වෙත යන්නේ සිනමා පටයක් රස විඳීම සඳහා ය. එමෙන් ම සිනමා ප්‍රේක්ෂකයන් අතුරින් වැඩි ම පිරිසක් වයස් භේදයකින් තොරව නැරඹීමට කැමත්තක් දක්වන්නේ ප්‍රේම වෘත්තාන්ත චිත්‍රපට මෙන් ම සිංහල චිත්‍රපට නැරඹීමට යි. මෙවැනි සාධක පාදක කර ගනිමින් ප්‍රේක්ෂක අවශ්‍යතාවන්ට ගැළපෙන සිනමා නිර්මාණකරණයට නිර්මාණකරුවන් උත්සුක වන්නේ නම් ඉතා අගනේ ය." (විජේරත්න, දිල්හානී, 2013)

සිනමා කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් ප්‍රබුද්ධ සිනමා ප්‍රේක්ෂක පිරිසකගේ අවශ්‍යතාව අතිමහත් ය. උසස් චිත්‍රපටවලට කැමැත්තක් දැක්වීමත්

පහත් ගණයේ ඒවා බැහැර කිරීමටත් ප්‍රේක්ෂකයා දැනුවත් විය යුතු ය. එහෙත් සිනමා ශාලාව වෙත සිනමාපටයක් නැරඹීමේ අරමුණින් ම නොව වෙනත් අරමුණු උදෙසා යන ප්‍රේක්ෂකයන් සිටින තුරු මේ තත්ත්වය වෙනස් කිරීම අසීරු වේ. ඒ සඳහා ද නිසි වැඩ පිළිවෙළක් යොදා ගතහොත් සිනමා ශාලාව තුළ ප්‍රබුද්ධ ප්‍රේක්ෂක පිරිසක් රඳවා ගත හැකි වේ. එයින් හෙට දින සිනමා කර්මාන්තයේ ම දියුණුව දැකිය හැකි වනු නො අනුමානය. ප්‍රබුද්ධ විචාරක පිරිසක් සිටින තැන ප්‍රබුද්ධ ප්‍රේක්ෂක පිරිසක් බිහිවේ. එය සිනමා කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් අත්‍යවශ්‍ය ම සාධකයකි.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


1. ජේම්ස් පිරිස්, ලෙස්ටර් සහ වික්‍රමගේ, පියසේන, 2003, සිනමාවේ 50 වසරක්, සර්වෝදය විශ්ව ලේඛා ප්‍රකාශනයකි.
2. දොඩම්ගොඩ, බෙනඩික්ට්, 1966, චිත්‍රපට ආස්වාදනය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11.
3. ධර්මදාස. කේ.එන්.ඕ. සහ වෙනත් අය, 2006, චිත්‍රපටය, සංස්කෘතික දෙපාර්තමේන්තුව.
4. මහේන්ද්‍ර, සුනන්ද, 1997, සන්නිවේදන ශබ්දාකරය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
5. රණසිංහ, ජෝර්ජ් ලෙස්ලි, 2001, සිනමා වංශ කතාව, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
6. විජේරත්න, දිල්හානි, 2013, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සිනමාව, සරසවි ප්‍රකාශන, නුගේගොඩ.




# 10



# සත් කෝරළයේ පිටිබෙරයේ සංස්කෘතිය හා බැඳුණු ආහාර කළමනාකරණය


**කුසුමලතා ලංකාමුල්ල**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශාස්ත්‍රවේදී (ගෞරව), දර්ශනපති ශ්‍රී ජයවර්ධනපුර
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
kusumalathalanka@gmail.com

වියළි කලාපීය දේශගුණ රටාවකට හිමිකම් කියන වයඹ පළාත පුත්තලම, කුරුණෑගල යන දිස්ත්‍රික්ක දෙකින් සමන්විත ය. සත් කෝරළය වූ කලී බත් කෝරළය ලෙස නම් දැරුවා වූ වයඹ පළාතට අයත් හත් පත්තු හතක එකතුවකි. දේවමැදි, දඹදෙණි, වැඋඩවිල්ලි, හිරියාල, යන හත්පත්තු හතර කුරුණෑගල ප්‍රදේශයට අයත් අතර කටුගම්පළ හත්පත්තුව කුලියාපිටිය ප්‍රදේශයට අයත් වෙයි. වන්නි හත්පත්තුවට නිකවැරටිය ප්‍රදේශයට අයත් වෙයි. දෙමළ හත්පත්තුව හෙවත් රාජවන්නි හත්පත්තුවට පුත්තලම ප්‍රදේශය අයත් වෙයි. මෙම සුවිසල් භූමි ප්‍රදේශයෙහි ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තය යි. එය හේන් ගොවිතැන, ගොඩ ගොවිතැන, ගෙවතු වගාව, කුඹුරු ගොවිතැන වශයෙන් බෙදී තිබෙනු දැකිය හැකි ය.

අර්ධ ශුෂ්ක කලාපීය භූ ලක්ෂණ පෙන්නුම් කරන මෙම ප්‍රදේශයෙහි තාල වර්ගයේ ශාක ඉතා හොඳින් වැඩේ. ලුණු මිශ්‍ර ලොම් පස එයට වඩාත් යෝග්‍ය වී තිබේ. ඒ හැර පොල් ත්‍රිකෝණයෙන් වැඩි ප්‍රදේශයක් සත් කෝරළයට අයත් ය. තල් සහ කිතුල් ද අඩු වැඩි වශයෙන් මේ ප්‍රදේශය පුරා විසිරී තිබෙනු දැකිය හැකි ය. එයින් තල් ගස හුදෙකලා ව මෙන් ම මහ ගල් අතරත් බෝ ගස්, නුග ගස් මත වැටුණු ඇට පැළ වී අතිශය රමණීය ස්වභාවයකින් අන්‍යොන්‍යාධාරක ශාකයක් සේ වර්ධනය වී තිබෙනු දැකීම ද සුලබ දසුනකි.

තල්ගස හා බැඳුණු දැඩි නෑකමක් හිතවත්කමක් සත් කෝරළ වැසියන් සතු ව පවතියි. තල්ගස්වත්ත, තල්ගහමඩුව, තලපත්ගල, ගලතරය, තලකොළවැව, පුස්කොළදෙණිය වැනි ස්ථාන හා ග්‍රාම නාම තල් ගස හා බැඳෙයි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගලතරය හා බැඳුණු තල් කර්මාන්තය ඓතිහාසික වැදගත්කමකින් යුක්ත ය. ජනප්‍රවාදවලට අනුව දූරාතීතයේ සිට ධර්ම පුස්තක සෑදීම සඳහා අවශ්‍ය සියලු ම පුස්කොළ සපයන ලද්දේ ගලතරයේ තල් උයනෙනි.





ගලතරයට තල් ගස ලැබීම පිළිබඳ ව පවත්නා අපූර්ව ජනප්‍රවාදයක් ද තිබේ. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා මාතලේ අළුවිහාරයෙහි එවකට පුස්කොළ තිබී නැත. මෙය දිව්‍යඥානයෙන් දුටු ශක්‍ර දේවේන්ද්‍රයා ඊට උපායක් කල්පනා කෙළේ ය. කෙසේ ද යත් ඔහු වහාම විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා කැඳෙව්වේ ය. ඔහුට තල් ඇට අහුරක් දී ඒවා ලංකාවේ තැන් තැන්වලට දමා එන ලෙස නියෝග කෙළේ ය. එම නියෝගය ප්‍රකාර ව විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා එම ඇට රැගෙන විත් ලංකාවේ ගල් අතර විසුරුවා හැර නැවත දිව්‍ය ලෝකයට ගියේ ය. ශක්‍ර දේවේන්ද්‍රයා විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා කැඳවා තල් ඇටවලට කුමක් කෙළේ දැ යි විමසූ විට ඔහු පවසා ඇත්තේ ඒවා ගල් අතරේ විසුරුවා හැරිය බව යි. ඒ අනුව ගල්අතරේ පසුව ගලතරේ වූ බව ජනප්‍රවාදගත යි. (අල්ගම පඤ්ඤාවාස හිමි, ධර්මරත්න තෙන්නකෝන් (2002) දඹදෙණි සිරිත් වගතුග)

යට කී ජනප්‍රවාදයෙන් මෙන් ම පහත සඳහන් තල් ගසේ උපත පිළිබඳ කවියෙන් පැහැදිලි වන්නේ තල් ගසෙහි ව්‍යාප්තිය පිළිබඳ වන සත්‍යය යි. කවර දුෂ්කර ප්‍රදේශයක, ගල් අතරත, ගස් අතරත වුවත් තල් ගස වර්ධනය වීමේ ප්‍රවණතාවක් පවතියි.

යසින් අනගි සුරපත්‍ර විමානේ පැළවුණ තල රුක උපත    අසන්
උඩින් හංසයෙක් ඉගිලී ඇවිදින් කඩා ගනිති ගෙඩි දකුණු    අතින්
දකුණු අතට තල ගෙඩියක් අරගෙන පැණී බී තල ඇට අත    හරිමින්
ගල් අතරට ඒ තල ඇට වැටුණේ න්සා ගලතරේ උනා    නමින්

කෙසේ වුවත් ගලතර ප්‍රදේශයේ තල් ගසට පවත්නා සුවිශේෂභාවයත් හංසයා සම්බන්ධ කිරීමෙන් ගැමියා තල් ගසට පිරිනමන ගෞරවයත් පැහැදිලි ය.

පහත සඳහන් ජනකවියෙන් පැනෙන්නේ තල් කොළවල ධර්මය ලියවීමේ සම්ප්‍රදාය සිංහලයනට සුපුරුදු දෙයක් බව යි.

දෝණ පලා පැළපත නැගලා මුල සොමි කරලා ගල උඩ    නැගලා
වරුණ මුලා යති දුන් ලොබලා ගොඩ මුහුකරලා අතුපතර    වෙලා
කරණ බලා ගොබ කප්පවලා පොත් පත් සදලා ධර්මය    සදලා
පුදන කලා මුනි සඳට ලොලා ගියෙ රුව බබළා මල පුබුදු    වෙලා

ධර්මය ලියවීම ඉතා ගෞරවයෙන් සම්ප්‍රදායානුකූල චාරිත්‍රානුගත ව කරන ලද්දක් බව 'කරණ බලා ගොබ කප්පවලා පොත්පත් සදලා' යන

යෙදුමෙන් පැහැදිලි වෙයි. ඒ අතර ම තල් ගසෙහි නොමේරු ගොබයෙන් ලිවීම සඳහා පුස්කොළ සාදාගන්නා කාරණයත් වර්තමානයේ මෙන් ම තල් පත්වලින් වෙනත් කර්මාන්ත කරන ලද බවත් තහවුරු වන තවත් ජනකවියක් මෙසේ යි.

අත්ත හොඳයි තද වැස්සට ඉහලන්ඩ
පිත්ත හොඳයි තද වරපට අඹරන්ඩ
ගොබේ හොඳයි දස ධර්මේ ලියවන්ඩ
මේ මල හොඳයි බුදුමගුලට ගෙනයන්ඩ

බෞද්ධාගමානුකූල ජීවිතයකට හුරු වී සිටින සිංහල ගැමියන් ගසෙන් නොයෙක් ප්‍රයෝජන ගන්නවා සේ ම අවසන තල මල පිළිබඳ ව පවසන්නේ එය බුදුන් නැමැදීමට සුදුසු බව ය.

මෙසේ සාහිත්‍යමය ප්‍රවේශයකින් පවසන්නට සූදානම් වනුයේ තල ගස හා බැඳී තිබුණු සත් කෝරළ වැසියන්ගේ එක් ආහාර පුරුද්දක් පිළිබඳ ව ය. එය පිපුණු තල මල් පිළිබඳ ව ලාංකේය ජනකවියන් විසින් ගොතා ඇති තල් මලක වරුණාවක් මෙන් ම විසිතුරු ය.

අපේ පැරැන්නෝ විශේෂයෙන් වැව්ගම්මානවල වැසියන් වැව සමග ඒකාබද්ධ වෙමින් සිය ජීවිතය ජලය සමග කරන ගනුදෙනුවක් සේ සලකා කළමනාකරණය කරගත්හ. විශේෂයෙන් සත්කෝරළය බත් කෝරළය වූයේ ජලය හා වැව සමග තිබූ බැඳීමේ අරුමය කියාපාන්නට මෙනි. අදත් ගොවි ජනපද ක්‍රමයකින් සංකර නොවූ සත්කෝරළයේ ගම්මානවල වැව්වල පිහිටීම විස්මයාවහ සුන්දරත්වයක් මෙන් ම පාරිසරික පද්ධතිය කෙරෙහි වූ අප්‍රමාණ භක්තියක් දනවන දර්ශනයකි. භූමි දර්ශනය අනුව එක් වැවක් පෙනෙන මානයෙන් තවත් වැවක් පිහිටා තිබේ. නැතහොත් එක් කුඩා වැවකින් පෝෂණය වන කුඩා කුඹුරු දෙනිය අවසන් වන්නේ පහළින් ඇති වැවේ ඉහත්තාවෙනි. නිම්නයෙහි කුඩා කුඹුරු දැකිය හැකි අතර උස්බිම හේන යි. සරල දිවියට ඇවැසි බත කුඹුරු දෙණියෙන් ලැබුණු අතර හේනෙන් වෙනත් ධාන්‍ය එළවළු වුවමනාවටත් වඩා ලැබිණි. වැව් පිටියෙහි කෙකටිය මලේ සිට ඇවැසි සියලු පලා වර්ග අඩුවක් නැතිව ජරී තිබිණි. එහි අතිරික්තය අල, ඇට, ගෙඩි වශයෙන් මෝරා වැඩුණේ නියං සමයේ දී වැව් ගම්වැසියනට ලැබෙන වෙස්වලාගත් ආශිර්වාදයක් මෙනි. එසේ ම වැව් කඳුවලත් වැව් පිටිවලත් ඉහත කී තල් ශාකය විසිරී පැතිරී තිබෙනු දැකීම සුලබ දසුනකි.





මේ නිසංසල ගැමි දිවිය කම්පනය කරන්නට හේතු වන පාරිසරික අනතුරු ඇඟවීම් නැත්තේ නොවේ. ආරම්භයේ දී සඳහන් කළ තල් ගසේ මලක් පිපීම එවැන්නකි. තල් මල පිපීම අසුබ ලකුණක් සේ සැලකීමට වැව්ගම්මානවල වැසියෝ පුරුදු වී සිටියෝ ය. පන්සලක හෝ ප්‍රභූ නිවාසයකට ඇරුණු ගෙවත්තක හැර බොහෝ විට තල් මලක් පිපෙනු දැකීම දුර්ලභ ය. මන්ද තල් මල පිපීමට පෙර ගම් වැසියන් තල් ගසේ ස්වභාවය හොඳින් හඳුනාගෙන එය ආහාරය සඳහා සකස් කර ගැනීමට පුරුදු වී සිටි හෙයිනි.

ගස මේරීමෙන් ඉක්බිති මල පිපෙයි. මල පිපුණ හොත් ගස විනාශ වෙයි. එපමණක් නොවේ මලේ ඉවට පැමිණෙන කෘමි සතුන් දළඹුවන් ආදීන් හේතුවෙන් අවට ඇති ගස්වැල් ද විනාශ මුඛයට පැමිණෙයි. තල් මල පිපීම අසුබ නිමිත්තක් සේ ගැමියන් සැලකීමෙහි පදනම එය විය යුතු ය.

සත් කෝරළ වැසියන්ගේ පරිසරය හා සම්බන්ධ මෙම ඉව, ආහාර කළමනාකරණය කර ගැනීමේ අවස්ථාව දක්වා පැතිරී තිබිණි. කවර හෝ ගම්වැසියකුගේ ගෙවත්තේ තල් ගසක් මෝරා ඇත්නම් ඒ බව ඔවුන් දැන ගන්නා ක්‍රමවේදයක් තිබිණි. ඉතා හොඳින් වැඩුණු තල් ගසක මුලට මඳක් ඉහළින් බෙරයක් සේ ගස මහත් වී ඇත්නම් එය පිටි සහිත තල් ගසකි. මේ අවස්ථාව සත් කෝරළ වැසියන්ගේ ව්‍යවහාරයෙන් නම් තල් ගසේ පිටිබෙරය සෑදීම යි. එය එදා සත් කෝරළ වැසියන් සැලකුවේ ශුභ නිමිත්තක් ලෙසිනි. පිටිබෙරය තව දුරටත් මේරීමට ඉඩ දුනහොත් මල පිපී ගස මැරී යයි.

පිටිබෙරය ආහාරය සඳහා සකස් කර ගැනීමට පූර්වයෙහි සිදුවන ක්‍රියාදාමය වැවක, කුඹුරක අත්තමක් සේ ම සාමූහික ප්‍රයත්නයකින් සිදු කිරීම සම්ප්‍රදාය යි. මෙහි දී ප්‍රථමයෙන් තල් ගස පිහිටි ගෙවත්තෙහි ඉඩම් හිමියා තල් ගස කැපීම සඳහා දිනයක් නියම කර ගනියි. ඉන්පසු ගම්මානයේ සෑම ගෙයක් ම නියෝජනය වන ආකාරයෙන් ගස කැපීම සඳහා කෙනකු පැමිණෙන ලෙස ආරාධනය කරමින් නියමිත දිනය දැනුම් දෙයි.

ගස මුලට එක් වන ගැමියෝ ප්‍රථමයෙන් ගසට වඳිති. සාමූහික ප්‍රයත්නයකින් ගස බිම හෙළා ගන්නා ඔවුහු පිටිබෙරය තිබෙන කොටස වෙන් කර ගනිති. එහි පිට පොත්ත හොඳින් රැහීමෙන් අනතුරුව එම කොටස සම සම ව ගස කැපීමට සහභාගී වූ පිරිස අතරත බෙදා ගනිති. තල් ගස කවර කලෙක වත් කුලියක් දී කපා ගත් බවක් සත්කෝරළ වැසියනට මතක නැත. ඒ

අනුව මෙවැනි ගස් කිහිපයක පිටිබෙරය පලා ගත් විට සෑහෙන පමණ පිටි ප්‍රමාණයක් සකස් කර ගත හැකි ය.

පිටිබෙරයේ කොටස ආහාරයක් සේ සකස් කොට ගන්නේ කෙලෙස ද යන්න විමසා බලමු. එය ගෘහණියගේ කාර්යභාරය යි. ස්වාමියා විසින් ගෙනැවිත් දෙන ලද තල් බෙරයට අයත් පිෂ්ටමය කොටස ප්‍රථමයෙන් කුඩා කැබලිවලට කොටස් කර ගත යුතු ය. දෙවනු ව වනේ ලා හොඳින් කෙටිය යුතු ය. ඉනික්බිති ව ළිහිල් ව බඳින ලද වණ්ඩුව සහිත දිය පිරි මුට්ටියකට කොටා ගත් පිටි සහිත කොටස දැමිය යුතු ය. මෙහි දී සිදුවන්නේ වැලි, කුණු, රොඩු ආදිය ඉවත් වී පිටි කොටස් හොඳින් පෙරී මුට්ටිය පතුලේ එක්රැස් වීම යි. මෙසේ රැස් කරගන්නා පිටි කොටස මුට්ටිය පතුලේ ඉතිරි කරගෙන වතුර සීරුවෙන් ඉවත් කර ගත යුතු ය. මහඋස්වැව, ආලංකුලමේ වන්නිනායක මුදියන්සේලාගේ මැණික්හාමි මිත්තණිය (96) පවසන්නේ කිහිප විටක් වතුර දමමින් තල් පිටි සෝදා ගත යුතු බව යි.

එසේ සකස් කර ගන්නා තල් පිටි එවේලේ ම ආහාරයට සකස් කර ගත හැකි ය. එම තෙත සහිත පිටිවලින් ක්ෂණික ව සාදා ගත හැකි තල් තලප සහ තල් කිරියා විශේෂ ය. ලුණු ස්වල්පයක්, පොල් කිරි, කිතුල් පැණි, පොල් පැණි හෝ මීක් පැණි හෙවත් මීමල්වලින් සාදා ගන්නා පැණි හෝ සීනි එක් කර ගෙන ලිපේ තබා හැඳි ගා තල් තලප සාදා ගත් අතර පැණි රස කාරකය නො දා දඩමස්, මිරිදිය හෝ මුහුදු මාළු හෝ කරවල හොදි සමග ද තල් තලප අනුභව කළ බව සත් කෝරළවාසී ගැමියෝ පවසති. (ජයවීර බණ්ඩාර, විතිකුලිය, නිකවැරටිය)

ඉතිරි වූ කොටස කුඩා කෑලි වශයෙන් කපා හොඳින් වියළා පටමලුවල හෝ ලබුකැටවල දමා දුම්මැස්සේ එල්ලා තබා ආහාර හිඟ කාලවල දී ගැනීමට සත් කෝරළ වැසියෝ එදා පුරුදු වී සිටියහ. පසුව වියලා ගත් තල් පිටි කෑලි හොඳින් කොටා සියුම් කඩ රෙද්දකින් හලා පිරිසිදු තල් පිටි සකස් කර ගෙන තිබේ. එම පිටිවලින් පිට්ටු, රොටී, කැඳ මෙන් ම රස කැවිලි ද සාදා ගෙන ඇත. රාජවන්නියේ වැසියෝ නෑහේත්තුවේ යාම සඳහා රසකැවිලි සාදා ගැනීමට භාවිත කෙළේ ද තල් පිටි ය. (කෝණාර මුදියන්සේලාගේ රත්නායක වැදණ්ඩ, ආලංකුලම)

ඔවුන්ගේ ආහාර පුරුදු කළමනාකරණය වූයේ එහි පවත්නා දුෂ්කරතා මෙන් ම අරපිරිමැස්ම ද හේතුවෙනි. ඊසාන දිග මෝසමෙන් පමණක් වැසි





ලැබෙන මෙම ප්‍රදේශයේ ජීවත් වන ගැමියනට වර්ෂයේ එක් කාලයක දී නියඟයෙන් දැඩි පීඩා විඳීමට සිදු වෙයි. ගමක් ගමක් පාසා දක්නට ලැබෙන වැව් හිඳී පැලිවළං සෑදී බීමට දියබිඳක් නැති වන සමයක් අවුරුද්දේ එක සීමාවක දී පැමිණෙන බව දන්නා ගැමියන් ඒ සඳහා සූදානම් වූයේ සාමූහික ව ය. සාගත, නියං, අඟහිඟකම් මගහැර ඒවාට මුහුණදෙමින් සිය දරුපවුල, අසල් වැසියන් පමණක් නොව ගමක කුස ගිනි නිවීමට, මල් පිපී මිය යාමට නො දී තල් ගසේ පිටිබෙරය බෙදා හදා ගැනීම උපයෝගී වන ආකාරය ප්‍රත්‍යක්ෂයෙන් දැන හඳුනා ගැනීමට, වත්මන් කළමනාකරණ මූලධර්ම කිසිවක් නොදත් එදා සත්කෝරළයේ ගැමි කළමනාකරුවනට හැකි වී තිබිණි.

## මූලාශ්‍රය පරිශීලනය

අල්ගම පඤ්ඤාවාස හිමි, ධර්මරත්න තෙන්නකෝන් (2002) දඹදෙණි සිරිත් වගතුග.

## දත්ත දායකයෝ

වන්නිනායක මුදියන්සේලාගේ මැණික්හාමි මිත්තණනිය (96) මහඋස්වැව, ආලංකුලම.

කෝණාර මුදියන්සේලාගේ රත්නායක වැදණ්ඩ මහාත්මා (62) ආලංකුලම, ආනමඩුව.

හේරත් මුදියන්සේලාගේ ජයවීර බණ්ඩාර මහාත්මා, විතිකුලිය, නිකවැරටිය (57).

## ලේඛන සරණිය

01. අර්ථශාස්ත්‍රාගත රජතුමා හා ඔහුගේ කාර්ය භාරය
පනාමුරේ සුගතසිරි හිමි

02. සමාජයේ ප්‍රභවය හා විකාශනය
සුනිල් දැරංගල

03. පැරැණි දාගැබ් මත පිහිටවූ යූපය පිළිබඳ යළි විමසීමක්
ඉනෝජ් කෞශල්‍ය අබේනායක

04. වන්නි හත්පත්තුව හා බැඳි සංස්කෘතිය
පවිත්‍රා මුතුමාලි නාරායණ

05. කෙටි පණිවිඩ සේවාව පිළිබඳ අධ්‍යයනයක්
විපුල හේමන්ත බණ්ඩාර

06. ඓතිහාසික කොළොම්පුරයේ මාර්ග, ප්‍රවාහනය හා ස්ථාන
උදය නෙළුම් රත්නායක

07. රූපවාහිනී වෙළෙඳ දැන්වීම් සඳහා නර්තන ප්‍රවේශය
ශෂී නිරෝෂනී

08. දකුණු පළාතේ අභිලේඛනවලින් හෙළිවන රාජකීය අභිධාන හා තනතුරු
රජිත් මධුසංක

09. සිනමා කර්මාන්තයේ උන්නතියට ප්‍රබුද්ධ ප්‍රේක්ෂක පිරිසකගේ අවශ්‍යතාව
දිල්හානී විජේරත්න

10. සත් කෝරළයේ පිටිබෙරයේ සංස්කෘතිය හා බැඳුණු ආහාර කළමනාකරණය
කුසුමලතා ලංකාමුල්ල

9 789554 530140
ISBN 978-955-4530-14-0

මිල රු. 200/=

ප්‍රකාශනය :
කළමනාකරණ හා විද්‍යා ප්‍රකාශන මධ්‍යස්ථානය
31/24 ඒ, දෙවන පටුමග, රබර්වත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
ටෙලි: 0112802545 / 0113188543